ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

	පිටුව
ගිණුම් හා මූල්‍යය	I
බැංකු අධීක්ෂණ	XVII
ව්‍යවහාර මුදල්	XXI
දේශීය කටයුතු	XXIII
ආර්ථික පර්යේෂණ	XXVI
සේවක අර්ථ සාධක අරමුදල	XXVIII
විනිමය පාලන	XXXI
ප්‍රවෘත්ති	XXXIII
පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය	XXXIV
තොරතුරු තාක්ෂණ	XXXIV
ජාත්‍යන්තර කටයුතු	XXXVI
නීති	XXXVIII
කළමනාකාරීත්ව විගණන	XXXVIII
ගෙවීම් හා පියවීම්	XXXIX
පරිශ්‍ර	XLI
රාජ්‍ය ණය	XLI
ප්‍රාදේශීය සංවර්ධන	XLV
ලේකම්	XLVIII
ආරක්ෂක සේවා	XLIX
සංඛ්‍යාන	XLIX
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය	LI
බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය	LIII
පුහුණු වැඩකටයුතු	LIV
සුභසාධන	LVI
මානව සම්පත් සංවර්ධනය	LVI

1. ගිණුම් සහ මූල්‍යය
ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනය

1.1 වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ (බැංකුව හෝ ශ්‍රීලංමබැ) මූල්‍ය ප්‍රකාශනයන් වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශයනයන් 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා අදාල වන්නේය.

1.2 මිනුම් පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම් ගොඩනැගිලි, වෙළෙඳ සුරැකුම්පත් සහ වෙළෙඳම සඳහා ඇති විදේශ සුරැකුම්පත් හැර ඇතැම් වත්කම් සහ බැරකම් ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

1.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට සම්බන්ධ ආදායම් සහ වියදම් මාර්ග දේශීය මුදල් සහ විදේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තාකරණ ක්‍රියාවලිය මගින් පහත වඩාත් විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් සඳහා සුදුසු වාර්තාකරණයක් සැලසේ යැයි බැංකුව අදහස් කරයි.

1.4 වර්ෂය තුළ අදාල කරගෙන ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති

පහත දක්වෙන ප්‍රතිශෝධනය කරන ලද ප්‍රමිතින් මෙම වර්ෂය තුළ අදල කරගෙන ඇති අතර ඒ අනුව පසුගිය වර්ෂයේ දත්ත වෙනස් කර ඇත.

විදේශය ගිණුම්කරන ප්‍රමිති 1 - ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම්

විදේශය ගිණුම්කරන ප්‍රමිති 2 - බඩුතොග

විදේශය ගිණුම්කරන ප්‍රමිති 8 - ගිණුම්කරන ප්‍රතිපත්ති,ගිණුම්කරන ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි

විදේශය ගිණුම්කරන ප්‍රමිති 10 - ශේෂපත්‍ර දිනට පසු සිද්ධීන්

විදේශය ගිණුම්කරන ප්‍රමිති 24 - ආශ්‍රිත පාර්ශව-යන්ගේ හෙළිකිරීම්

විදේශය ගිණුම්කරන ප්‍රමිති 28- ආශ්‍රිත සමාගම්-වල ආයෝජන

විදේශය ගිණුම්කරන ප්‍රමිති 32 - මූල්‍ය උපකරණ : හෙළිකිරීම් සහ ඉදිරිපත්කිරීම

විදේශය ගිණුම්කරන ප්‍රමිති 39 - මූල්‍ය උපකරණ : හඳුනාගැනීම හා මිනුම්

1.5 අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2005 වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය වාර්තා ජාත්‍යන්තර මූල්‍ය වාර්ථාකරන ප්‍රමිති අනුව පිළිවෙල කර ඇත.

1.6 වාර්ථා කිරීමේ මුදල් ඒකකය

අන් අන්දමකට දක්වා නොමැතිනම්, සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දක්වේ.

1.7 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

ගිණුම් ප්‍රතිපත්ති අදල කිරීමේ දී බැංකුව විසින් ඇස්තමේන්තුවට අමරතව පහත දක්වෙන නිශ්චයන් කර ඇත. මෙය ගිණුම් වාර්තා වල අගය හඳුනාගැනීම සඳහා බලපා ඇත.

(අ) ණයවල හානිකරණ

අනෙකුත් ආයතනවලට දී ඇති ණය, හානිකරන අලාභ සඳහා බැංකුව විසින් වාර්ෂික සලකා බලනු ලැබේ. හානිකරණ අලාභ වාර්තා කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී, බැංකුව විසින් නිරීක්ෂණය කිරීමට ඇති දත්ත මත හානිකරණය පිළිබඳ නිශ්චය කරනු ලැබේ. මෙවැනි සලකාබැලීම් සඳහා යොදගන්නා ක්‍රමවේදයන් හා උපකල්පනයන් නිතරම සමාලෝචනය කරනු ලැබේ.

(ආ) වෙළඳම සඳහා වන ආයෝජන වල හානිකරණ

වැදගත් හා නොනවත්වා ධාරන අගය පහලයෑම් ඇතිවිට, වෙළෙඳම සඳහා වන ආයෝජන හානිවී ඇති බවට බැංකුව තීරණය කරයි. කුමන අගයන් වැදගත් හෝ නොනවත්වා යන්න තීරණය කිරීම සඳහා නිශ්චය කිරීම අවශ්‍ය වේ.

1.8 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වේ. විදේශීය මුදල් වලින් වූ ගනුදෙනු, එකී ගනුදෙනු සිදු වූ දිනයේ දී පැවැති විනිමය අනුපාතිකයන් ප්‍රකාර ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරන ලදී. විදේශීය මුදල් වලින් වූ මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ශේෂ පත්‍ර දිනට පැවැති විනිමය අනුපාතිකයන් ප්‍රකාර ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරන ලදී. වාර්තා කරන කාර්යයන් සඳහා විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීමේ දී ප්‍රධාන මුදල් සඳහා පහත දක්වෙන ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකයන් භාවිතා කරන ලදී.

2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

	සටහන	2005 රු. '000	2004 රු. '000
මෙහෙයුම් ආදායම			
විදේශ මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොලී ආදායම	14	**6,924,471**	6,021,254
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් ලාභය/ (පාඩුව)		**(90,502)**	185,631
මිල වෙනස්වීම්වලින් උපලබ්ධි ලාභය/ (පාඩුව)		**768,660**	1,769,157
විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම		**7,602,629**	7,976,042
විදේශ මූල්‍ය වත්කම් ආශ්‍රිත වියදම			
පොලී වියදම්	15	**(1,799,733)**	(1,236,140)
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත සම්පූර්ණ වියදම		**(1,799,733)**	(1,236,140)
විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය/ (පාඩුව)		**(12,955,088)**	18,453,354
විදේශ මුදල් ආශ්‍රිත ආයෝජන ආදායම/ (පාඩුව)		**(7,152,192)**	25,193,256
දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොලී ආදායම	14	**6,138,433**	4,339,104
පොලී වියදම	15	**(839,599)**	(506,938)
දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම		**5,298,834**	3,832,166
අනිකුත් ආදායම්	16	**1,101,691**	813,015
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම/ (පාඩුව)		**(751,667)**	29,838,437
මෙහෙයුම් වියදම්			
කාර්ය මණ්ඩල පිරිවැය	17	**(2,208,455)**	(1,547,872)
ක්ෂයවීම්		**(458,876)**	(359,677)
තොග පිරිවැය		**(1,273,044)**	(1,089,207)
පරිපාලන වියදම්	18	**(976,044)**	(522,612)
බොල් සහ අඩමාන ණය සහ ශුද්ධ විවිධ කපාහැරීම්		**(8,209)**	(46,753)
මුළු මෙහෙයුම් වියදම		**(4,924,628)**	(3,566,121)
ආදායම් බදුවලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලාභය/(පාඩුව)		**(5,676,295)**	26,272,316
ආදායම් බදු		**(570,182)**	(589,029)
සාමාන්‍ය කටයුතුවලින් ලැබූ ශුද්ධ ලාභය/ (පාඩුව)		**(6,246,477)**	25,683,287

ශ්‍රී ලංකා මහ බැංකුව
2005 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය

	සටහන	2005 රු. '000	2004 රු. '000
බැරකම් සහ හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය			
විදේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන වලට ගෙවිය යුතු මුදල්	9	**15,630,980**	4,758,324
ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල්		**28,285,643**	37,899,263
ජා.මු.අ. සම්බන්ධ වගකීම්	10	**102,635,004**	101,645,332
අනිකුත් විදේශීය වගකීම්		**1,326,619**	128,346
		147,878,246	144,431,265
දේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන වල ශේෂ		**65,483,580**	55,051,087
රජයේ හා රාජ්‍ය නියෝජ්‍ය ආයතනවල ශේෂ	11	**931,592**	892,435
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කෙරෙන සුරැකුම්පත්		**14,107,000**	7,213,000
සේවක සුභ සාධක යෝජනා ක්‍රමවල ශේෂ	12	**199,344**	7,525
අනෙකුත් දේශීය ගෙවිය යුතු මුදල්		**838,397**	717,364
		81,559,913	63,881,411
අනිකුත් බැරකම්			
සංසරණයෙහි පවත්නා මුදල්		**132,436,496**	115,908,969
රජයේ විලම්භිත ප්‍රදාන		**278,660**	429,459
විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පසු සේවා ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල ශේෂ		**974,983**	465,334
විවිධ වගකීම්		**333,013**	99,464
		134,023,152	116,903,226
හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය			
දායක ප්‍රාග්ධනය හා සංචිත	13	**77,135,633**	88,896,622
		440,596,944	414,112,524

	සටහන	2005 රු. '000	2004 රු. '000
වත්කම්			
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	1	**146,128,811**	143,510,890
මූල්‍ය වත්කම්:			
- ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්	2	**104,937,757**	44,768,751
- ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති රන් වලින් දක්වා ඇති සුරැකුම්පත්	2	**8,743,882**	7,620,907
- වෙළෙඳාම සඳහා තිබෙන ආයෝජන	2	**13,992,948**	21,377,058
අනෙකුත් විදේශීය ලැබිය යුතු මුදල්		**163,667**	151,423
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	3	**60,491,555**	67,177,196
		334,458,620	284,606,225
දේශීය මූල්‍ය වත්කම්			
ආයෝජන සංචිතය-ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්		**51,806,545**	82,839,235
රජයට දෙන ලද ණය	4	**39,746,300**	34,791,100
අනිකුත් ආයතන වලට දෙන ලද ණය	5	**2,468,989**	29,878
අනෙකුත් දේශීය ලැබියයුතු මුදල්		**678,665**	696,755
මූල්‍ය ආයතන හා අනිකුත් ආයතන වල ආයෝජන	6	**45,248**	501,641
අනෙකුත් වත්කම්		**558,140**	-
		95,303,887	118,858,609
අනිකුත් වත්කම්			
තොගය	7	**1,351,677**	950,789
රන් තොගය		**59,766**	59,766
විවිධ වත්කම්		**1,590,099**	1,399,073
දේපළ, පිරියත සහ උපකරණ	8	**7,832,895**	8,238,062
		10,834,437	10,647,690
		440,596,944	414,112,524

විගණන මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරය) 42(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන් අංක 1 සිට 22 දක්වා ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් එමගින් 2005 දෙසැම්බර් 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව මාගේ මතය වේ.

2006 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ 07,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

එස්. සී. මායාදුන්නේ	**එස්. මෙන්ඩිස්**	**කේ. එම්. ජී. එන් දවුලගල**
විගණකාධිපති	අධිපති	වැ. බ. ප්‍රධාන ගණකාධිකාරී

2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2005 රු. '000	2004 රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය			
ප්‍රභවය :			
ලැබුණු පොලිය - විදේශීය මුදල්		**6,399,379**	6,429,721
ලැබුණු පොලිය - දේශීය මුදල් - වෙනත්		**48,895**	43,641
ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම්		**768,660**	1,769,157
උපලබ්ධි වූ විනිමය ලාභ/(පාඩු)		**1,703,091**	(35,947)
ලැබුණු ගාස්තු කොමිස් සහ අනිකුත් විවිධ ආදායම්		**145,767**	304,009
		9,065,792	8,510,581
විය පැහැදම්			
ගෙවන ලද පොලිය - විදේශීය මුදල්		**1,652,955**	1,166,276
ගෙවන ලද පොලිය - දේශීය මුදල්		**840,641**	335,991
සේවකයින්ට ගෙවීම්		**1,326,591**	989,528
සැපයුම්කරුවන්ට ගෙවීම්		**2,659,687**	3,525,649
ගෙවන ලද ආදායම් බදු		**538,943**	567,029
		7,018,817	6,584,473
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	19	**2,046,975**	1,926,108
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය			
ප්‍රභවය :			
අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		**(749,609)**	(75,484)
අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම්වල මුල් මුදල් අයකිරීම්		**(2,356,411)**	79,258
මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණය / මුද හැරීම		**474,764**	119,685
දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ විකිණීම්		**16,582**	267
මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ආශ්‍රිත ආදායම්		**35,633**	86,412
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම		**6,894,000**	(13,761,201)
		4,314,959	(13,551,063)
විය පැහැදම්			
අලෙවි කළ හැකි විදේශීය මූල්‍ය සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**56,826,530**	(77,194,471)
අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**131,617**	(58,635)
අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(2,050,609)**	(18,507,734)
අනිකුත් දේශීය තැන්පතුවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(191,819)**	144,643
ප්‍රදානයන් අඩු කළ, දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලට ගැනීම්		**53,708**	42,421
රන් තොගයේ ශුද්ධ අඩුවීම		**93,810**	74,272
		54,863,237	(95,499,504)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(50,548,278)**	81,948,441

2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (සම්බන්ධිතයි)

	සටහන	2005 රු. '000	2004 රු. '000
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
ප්‍රභවය :			
සංසරණ මුදල් නිකුතුව		**151,998,690**	115,993,628
සංසරණ මුදල් ආපසු ගැනීම්		**(135,471,163)**	(98,869,295)
සංසරණ මුදල් ශුද්ධ නිකුතුව		**16,527,527**	17,124,333
අඩු කිරීම්			
රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්)	20	**(32,265,077)**	49,237,087
බැංකුව සහ මූල්‍ය ආයතන ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්)	21	**(11,613,517)**	(12,409,516)
සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්)		**(43,878,594)**	36,827,571
		60,406,121	(19,703,238)
වියපැහැදම්			
විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම		**(10,970,720)**	11,456,546
අතිරික්තය රජයට ගෙවීම		**5,000,000**	1,000,000
		(5,970,720)	12,456,546
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**66,376,841**	(32,159,784)
මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම		**17,875,538**	51,714,765
මුදල් සහ මුදල් සමානයන් මත විනිමය අනුපාතයන් බලපෑම		**(15,257,617)**	13,855,896
ජනවාරි 01 දිනට මුදල් සහ මුදල් සමානයන්		**143,510,890**	77,940,229
දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්	22	**146,128,811**	143,510,890

සටහන		2005 රු. '000	2004 රු. '000
1	**මුදල් හා මුදල් සමානයන්**		
	විදේශීය බැංකුවල ඇති ශේෂයන්	2,487,257	1,070,545
	විදේශීය නෝට්ටු සහ කාසි ගිණුම	0	1,611
	විදේශීය බැංකු වල ඇති කාලීන තැන්පතු	112,950,743	96,686,319
	ස්ථාවර තැන්පතු සඳහා කොන්ත්‍රාත්ගත බැඳීම්	14,244,836	4,485,742
	ෆෙඩරල් රිසර්ව් බැංකුව සමග ප්‍රති මිලදී ගැනීම්	16,445,975	41,266,673
		146,128,811	143,510,890
2	**මූල්‍ය වත්කම්**		
	ලාභ හා අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්	104,937,757	44,768,751
	ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති රන් වලින් දක්වා ඇති සුරැකුම්පත්	8,743,882	7,620,907
	විකිණීමට ඇති ආයෝජන	13,992,948	21,377,058
		127,674,587	73,766,716
3	**ජා.මු.අ. සම්බන්ධ වත්කම්**		
	විශේෂ ගැනුම් හිමිකම්වල දැරීම්	154,585	19,539
	ජා.මු.අ. පංගුව	60,336,970	67,157,657
		60,491,555	67,177,196
4	**රජයට දෙන ලද ණය**		
	චක්‍රීය ණය	39,746,300	34,791,100
		39,746,300	34,791,100
5	**අනිකුත් ආයතනවලට දෙන ලද ණය**		
	දනට පවත්නා මුල් මුදල	2,461,951	2,547,400
	සුසහන ණය ක්‍රමය යටතේ ලැබීම්	2,441,860	-
	ලැබිය යුතු පොලිය	5,100,696	4,732,762
	දළ ලැබිය යුතු මුදල්	10,004,507	7,280,162
	අඩු කළා : අඩමාන ණය සඳහා වෙන් කිරීම	(2,434,822)	(2,517,522)
	අත්හිට වූ පොලිය	(5,100,696)	(4,732,762)
	ලැබිය යුතු ශුද්ධ මුදල	2,468,989	29,878

සටහන		2005 රු: '000	2004 රු: '000
6	**මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන**		
	ප්‍රාදේශීය සංවර්ධන බැංකු	-	430,113
	සීමාසහිත ණය තොරතුරු කාර්යාංශය	**12,248**	12,278
	සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව	-	26,250
	සීමාසහිත ෆිච් රේටිංස් ලංකා	**3,500**	3,500
	සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම	**29,500**	29,500
		45,248	501,641
7	**තොග**		
	සංසරණය සඳහා ඇති නෝට්ටු	**1,126,682**	518,834
	සංසරණය සඳහා ඇති කාසි	**213,702**	184,325
	මාර්ගස්ථ කාසි	**43,627**	287,501
		1,384,011	990,660
	අඩුකළා : සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන් කිරීම්	**(55,300)**	(64,700)
		1,328,711	925,960
	ලිපිද්‍රව්‍ය සහ විවිධ තොග	**22,966**	24,829
	පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත මුළු තොගය	**1,351,677**	950,789

8 දේපල, පිරියත සහ උපකරණ

ධාරණ වටිනාකම	ඉඩම් සහ ගොඩනැගිලි රු: '000	පිරියත හා පිරියත උපකරණ රු: '000	ලී බඩු සහ උපකරණ රු: '000	අනිකුත් රු: '000	2005 එකතුව රු: '000	2004 එකතුව රු: '000
සමුච්චිත ක්ෂය සහ අබලන් වීම සඳහා අඩුකර ජනවාරි 01 දිනට	7,569,370	-	193,343	475,349	**8,238,062**	8,554,160
එකතුකිරීම්	-	76	25,290	121,616	**146,982**	42,421
සමුච්චිත ක්ෂය වීම් අඩුකළ අපහරණයන්	-	-	-	-	-	(61)
නැවත ශ්‍රේණිගතකිරීම / කපා හැරීමේ ශුද්ධ බලපෑම	(1,072,833)	934,043	48,541	(3,024)	**(93,273)**	-
අබලන් වීම සඳහා ප්‍රතිපාදන ඉවත්කිරීම	-	-	-	-	-	1,219
වර්ෂය සඳහා ක්ෂය වීම්	(91,776)	(52,267)	(46,428)	(268,405)	**(458,876)**	(359,677)
සමුච්චිත ක්ෂය අඩු කර දෙසැම්බර් 31 දිනට	6,404,761	881,852	220,746	325,536	**7,832,895**	8,238,062

සටහන		2005 රු. '000	2004 රු. '000
9	**බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල්**		
	බැංකුවලට ගෙවිය යුතු මුදල්	15,226,975	4,485,742
	අනිකුත් ආයතනවලට ගෙවිය යුතු මුදල්	404,005	272,582
		15,630,980	4,758,324
10	**ජා.මූ.අ. සම්බන්ධ බැරකම්**		
	ජා.මූ.අ. සම්බන්ධ විදේශීය මුදල් බැරකම්		
	පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන	23,704,228	26,548,718
	පොලිය දරන ණය - ප්‍රවර්තන	15,232,384	4,197,354
	විභාගි වෙන් කිරීම්	10,343,397	11,512,648
	ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්	30,390,652	30,552,522
	පංගු බැරකම්	22,964,343	28,834,090
		78,930,776	75,096,614
		102,635,004	101,645,332
11	**රජය සහ රජයේ ආයතන සමග වූ ශේෂයන්**		
	රජයේ තැන්පතු	372,485	522,673
	රජයේ නියෝජිත ආයතන සහ අරමුදල්	559,107	369,762
		931,592	892,435
12	**සේවක ප්‍රතිලාභ සැලසුම් සමග වූ ශේෂයන්**		
	අර්ථසාධක අරමුදල	153,160	2,701
	විශ්‍රාම අරමුදල	40,393	2,067
	වැන්දඹු සහ අනත්දරු අරමුදල	5,791	2,757
		199,344	7,525

සටහන		2005 රු. '000	2004 රු. '000
13	**හිමිකාරත්වය**		
	දායක ප්‍රාග්ධනය	**15,000**	15,000
	කෙටි සහ මධ්‍යකාලීන ණය සංචිතය	**9,425,000**	4,925,000
	අතිරික්ත හා පාලන ගිණුම් සංචිතය	**42,584,950**	14,011,727
	ප්‍රාග්ධන දායක ගිණුම	**577,859**	577,859
	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම	**662,382**	662,382
	විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල වෙළෙඳපොළ ඇගයීම	**(135,077)**	(185,717)
	වාර්ෂික ලාභය/ (අලාභය)	**(6,246,477)**	25,683,287
	ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය	**30,251,996**	43,207,084
		77,135,633	88,896,622
14	**මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම**		
	විදේශීය මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම		
	මුදල් හා මුදල් සමානයන්	**3,912,533**	2,656,598
	වෙළෙඳ සහ අලෙවිය සඳහා ඇති සුරැකුම්පත්	**2,925,756**	3,302,531
	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	**86,182**	62,125
	විදේශීය මූල්‍ය වත්කම්වලින් සම්පූර්ණ පොලී ආදායම	**6,924,471**	6,021,254
	දේශීය මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම		
	ආයෝජන සංතකය - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**6,080,552**	4,254,941
	ග්‍රා.සං. බැංකුවල ණයකරවල පොලී ආදායම	**14,209**	40,522
	අතිකුත් ණය සහ අත්තිකාරම්	**43,672**	43,641
	දේශීය මූල්‍ය වත්කම් වලින් සම්පූර්ණ පොලී ආදායම	**6,138,433**	4,339,104
	මූල්‍ය වත්කම් වලින් මුළු පොලී ආදායම	**13,062,904**	10,360,358
15	**මූල්‍ය බැරකම් මත පොලී වියදම**		
	විදේශීය මූල්‍ය බැරකම් මත පොලී වියදම		
	ආසියානු නිශ්කාෂණ සංගමය	**548,417**	179,811
	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	**1,249,248**	1,054,075
	අනෙකුත්	**2,068**	2,254
	විදේශීය මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම	**1,799,733**	1,236,140
	දේශීය මූල්‍ය බැරකම් මත පොලී වියදම		
	ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් මත අලෙවිකරණ සුරැකුම්පත්	**839,599**	506,938
	දේශීය මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම	**839,599**	506,938
	මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම	**2,639,332**	1,743,078

සටහන		2005 රු. '000	2004 රු. '000
16	**අනිකුත් ආදයම්**		
	ලාභාංශ ආදයම	25,343	45,890
	දේපල, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලාභය	16,583	207
	මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණයෙන් ලාභය	612,776	21,797
	විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂයවීම	218,676	159,730
	විවිධ ආදයම් සහ අධි වෙන්කිරීම් ඉවත් කිරීම	228,313	585,391
		1,101,691	813,015
17	**සේවක මණ්ඩල වියදම්**		
	උපයනවිට ගෙවීම් බදු ඇතුළුව සේවායෝජක විසින් ගෙවන ලද වේතන සහ වැටුප්	911,107	854,362
	විශ්‍රාම වැටුප් පිරිවැය	715,288	413,413
	අනිකුත් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	432,892	148,860
	නිශ්චිත දයක සැලසුම් පිරිවැය	149,168	131,237
		2,208,455	1,547,872
18	**පරිපාලන වියදම්**		
	අළුත්වැඩියා සහ නඩත්තු	312,417	272,048
	සන්නිවේදන වියදම්	70,088	77,322
	ගමන් වියදම්	23,009	21,630
	බදුකුලී වියදම්	349	-
	මුද්‍රණ වියදම්	15,645	32,326
	විගණන ගාස්තු	8,200	9,300
	මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික	437	795
	විශ්‍රාමික වෛද්‍ය ප්‍රතිලාභ	20,519	34,985
	දේපල, පිරියත හා උපකරණ කපාහැරීම්	93,049	-
	පොලී වියදම - ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල	155,178	28,839
	විවිධ	277,153	45,367
		976,044	522,612

සටහන		2005 රු. '000	2004 රු. '000
19	**මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම**		
	මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය/ (අලාභය)	(6,246,477)	25,683,287
	මුදල් නොවන විෂයයන් එකතු කළා / (අඩු කළා)		
	ක්ෂයවීම්	458,876	359,677
	ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ	(6,080,552)	(3,239,803)
	බොල් ණය කපා හැරීම සහ ආපසු ලැබීම්	(82,700)	(79,258)
	නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ශුද්ධ ප්‍රතිපාදන	1,148,180	358,252
	උපලබ්ධි නොවූ ශුද්ධ විදේශ විනිමය (ලාභය) / අලාභය	14,658,179	(18,489,302)
	අනෙකුත් ප්‍රතිපාදන	(277,325)	(906,932)
	එකතු කළා / (අඩු කළා) අනිකුත් කාරක ප්‍රාග්ධන විෂයයන් ගේ චලනය		
	තොගවල / (වැඩිවීම) /අඩුවීම	(400,888)	(453,299)
	ලැබිය යුතු පොලිය (වැඩිවීම) /අඩුවීම	(523,788)	(647,192)
	විවිධ බැරකම්වල වැඩිවීම / (අඩුවීම)	(5,583)	(483,074)
	ගෙවිය යුතු පොලිය වැඩිවීම / (අඩුවීම)	145,736	262,810
	අනෙකුත් ලැබිය යුතු මුදල් වල වැඩිවීම / (අඩුවීම)	46,330	(26, 213)
	එකතු කළා / (අඩුකළා) ආයෝජන සහ මූල්‍යනය ක්‍රියාකාරකම්		
	ආයෝජනවලින් ආදායම	(622,913)	(67,893)
	ලාභාංශ ලැබීම්	(25,343)	-
	දේපල, යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලාභය	(16,582)	-
	උපලබ්ධි නොවූ වෙළෙඳපොළ වටිනාකමෙහි ශුද්ධ වෙනස්වීම	90,502	(185,630)
	විලම්බිත ප්‍රදානයන් ක්‍රමක්ෂය වීම	(218,676)	(159,322)
	මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	2,046,975	1,926,108
20	**රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් නිකුතු / (ආපසු ගැනීම්)**		
	ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කළඹ පරිණතවීම	(133,512,344)	(78,680,476)
	ආයෝජන කළඹ සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම	102,127,387	127,281,072
	ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ	(5,728,286)	(3,199,282)
	ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම / (අඩුවීම)	4,955,200	3,587,200
	රජය සහ රජයේ ඒකක සමග ශේෂ (වැඩිවීම) / අඩුවීම	(39,157)	248,573
	රජයේ ප්‍රධාන ලැබීම්	(67,877)	-
		(32,265,077)	49,237,087
21	**බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු /(ආපසු ගැනීම්)**		
	බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂ (වැඩිවීම) / අඩුවීම	(1,181,024)	(9,387,516)
	බැංකු සහ මූල්‍ය ආයතනයන්ට සලසන ලද දවස තුළ ද්‍රවශීලතා පහසුකමේ (වැඩිවීම) / අඩුවීම	(10,432,493)	(3,002,000)
		(11,613,517)	(12,409,516)
22	**පියවීම් මුදල් ශේෂ**		
	විදේශීය මූල්‍ය වත්කම්		
	අනිකුත් විදේශීය බැංකු සමග මුදල් ශේෂ	146,128,811	143,510,890
	පියවීම් මුදල් ශේෂ	146,128,811	143,510,890

අංක II - 1 සංඛ්‍යා සටහන
ශේෂපත්‍ර දිනට විනිමය අනුපාත

මුදල් වර්ගය	2005	2004
ඔස්ට්‍රේලියානු ඩොලර්	74.6987	81.5448
කැනේඩියානු ඩොලර්	87.7484	86.8704
යුරෝ	120.9629	142.3203
රන්පවුම්	175.9428	201.3629
ජපන් යෙන්	0.8661	1.0179
එක්සත් ජනපද ඩොලර්	102.1172	104.6050
විශේෂ ගැණුම් හිමිකම් (වි.ගැ.හි)	145.9530	162.4520

1.9 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදයම් සහ වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන් තුළින්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු වලින් ලැබීම් ආයෝජනය සහ බැංකු කටයුතු වලට අදල වන්නා වූ වත්කම් සහ බැරකම් දේශීය මුදල් ක්‍රියාකාරකම් තුළින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම තුළින්, බැංකුවේ මූල්‍ය තත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදනම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත්කිරීම අපේක්ෂාකරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි විඥපන අගය දුර්වල කෙරෙන බව බැංකුව විසින් සලකනු ලැබේ.

ආයෝජනයන් සියල්ලම මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර, ආයෝජනයට අදල අත්පත්කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් කළ ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මූලික අගය කිරීමෙන් අනතුරුව වන මිනුම් පදනම් පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් සියල්ලම වෙළෙඳම් කෙරෙන දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී, සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළෙහි පවත්නා සම්ප්‍රදය මගින් නියමිත කාල රාමුව තුළ භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ හෝ මූල්‍ය වත්කම් වන්නේය.

(අ) සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වලින් ලාභ හෝ අලාභ

වෙළෙඳම සඳහා ලෙස වර්ග කර ඇති මූල්‍ය වත්කම්, සුරැකුම්පත් ලෙස ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට දක්වා ඇත. මෙම සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම්, අලෙවිකළ හැකි සුරැකුම්පත් වල අගයෙහි වැඩිවීම් ලෙස හෝ අඩුවීම් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වන අර එම ලාභ හෝ අලාභ ආදයම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

තවදුරටත් සුරැකුම්පත් අයිතිව තිබේ නම් ලාභය හෝ අලාභය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යගනයෙන් ලාභයක් (අලාභයක්) ලෙස වාර්තා කරනු ලැබේ. ලාභය හෝ අලාභය උපලබ්ධි වූ අවස්ථාවන්හි දී (සුරැකුම්පත් විකිණීමෙන්) එය මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වූ ලාභය/(අලාභය) ලෙස වාර්තා කරනු ලැබේ.

(ආ) වෙළෙඳම සඳහා ඇති විදේශ මූල්‍ය සුරැකුම්පත්

වෙළෙඳම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම්, වෙළෙඳම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත් අගයෙහි වැඩිවීම් ලෙස හෝ අඩුවීම් ලෙස ශේෂ පත්‍රයෙහි සංචිත යටතේ දක්වනු ලැබේ. වෙළෙඳම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගත වන ලාභය හෝ පාඩුව, එම ආයෝජන විකුණන, ප්‍රතිග්‍රහණය කරන හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ (එවැනි අවස්ථාවකදී, කලින් හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය ලෙස වාර්තා කෙරුනු සමුච්චිත ලාභය හෝ පාඩුව ආදයමට අන්තර්ගත කරනු ලැබේ.) හිමිකරුවන්ගේ ප්‍රාග්ධනයේ වෙනම කොටසක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඇ) වෙළෙඳම සඳහා වන සුරැකුම්පත් - රන්

විදේශීය ගනුදෙනු පාර්ශ්වකරුවන් වෙතැති රන් සුරැකුම් ආරම්භයේදී පිරිවැය මත වාර්තා කරනු ලැබේ. වෙළෙඳපොළෙහි රන් අගය වෙනස්වීමෙන් උද්ගත වන ලාභ හෝ පාඩු ආදයම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. රන් අයිතිය තවදුරටත් පවතී නම්, ලාභ හෝ පාඩු උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙහි ලාභ (අලාභ) ලෙස වාර්තා කරනු ලැබේ. ලාභ හෝ අලාභ උපලබ්ධි වී නම් (රන් විකිණීම මගින්) මිල වෙනස් වීම් මගින් උපලබ්ධි වූ ලාභ (අලාභ) ලෙස වාර්තා කරනු ලැබේ.

(ඈ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන්

බැංකුව විසින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු වශයෙන් නොව තම බලතල ප්‍රකාර සිදු කරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමග සිදු කෙරන ලද ගනුදෙනු සියල්ලම එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමග වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත වි.ගැ.හි.

ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ජා.මූ.අ. සමග වූ ශේෂයන්ට අදාල අන් සියළු ගාස්තු සහ පොලිය වහාම ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

(ඉ) මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන්ට, විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු අඩංගු වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන්, ශ්‍රීලංමබැ ඇතැම් ආදායම් ඉපයීම ද, ඇතැම් වියදම් දැරීම ද සිදු කරන නමුත් ඒවායින් මුදල් ගලා යෑමක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වේ. ඒවාට ප්‍රධාන වශයෙන් ශ්‍රී.ලං. රජය සමග සහ දේශීය මූල්‍ය ආයතන සමග ගනුදෙනු අඩංගු වේ. ශ්‍රී ලංකා රජය සමග කරනු ලබන ගනුදෙනුවල දී මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගයක් ලෙස රජය මගින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල දයක නොවූ කොටස අත්කර ගනු ලැබේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් සහ ඒ සඳහා පොලිය හුදෙක්, ශ්‍රී.ලං.ම. බැංකුවේ වාර්තාවල පොත් සටහන් වශයෙන් පිළිබිඹු වේ. මේවා මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 20 සහ 21 දරණ සටහන්වල වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

ශ්‍රී.ලං.ම. බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී.ලං.ම. බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින්, ලබා ගන්නා භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටට යන මුදල් ප්‍රවාහයන්ට ඇතුලත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා වන මුදල් සහ මුදල් සමානයන්ට, මුදල් සහ මුදල් විධානයන්ගේ ගලායෑම් (ශුද්ධ) හැරුනු විට, ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් අඩංගු වේ.

(ඊ) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත් වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවල විකුණුම් මිල සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගනිමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ.

ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත රඳවා ගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්) වත්කමක් ලෙස ශේෂපත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු දෙකම, යම්කිසි උපචිත ආදායමක් හෝ වියදමක් වී නම් එයද සමග වූ ගනුදෙනු වටිනාකම මත වාර්තා කරනු ලැබේ.

(උ) ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

බැංකුවේ ආයෝජන සංතකය, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගත් භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් උත්පාදිත ණය නියෝජනය කෙරෙන බැවින් එම ආයෝජන සංතකය ක්‍රමක්ෂය පිරිවැයට ශේෂපත්‍රයෙහි සටහන් කර ඇත.

(ඌ) රජයට දෙන ලද ණය

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද තාවකාලික අත්තිකාරම් වලින් රජයට දෙන ලද ණය නියෝජනය වේ.

(එ) අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය, අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදලක් අඩුකර, ආරම්භයේ දී ප්‍රදානය කළ මුදල අනුව හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළුම මුදල් බැංකුවට අයකර ගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේනම්, ඒ සඳහා (ණය අඩාල වීම් සඳහා) අඩමාන ණය ප්‍රතිපාදනයන් කරනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය, දරන්නාවූ මුදල් ප්‍රමාණයන් සහ අයකර ගත හැකි ලෙස ඇස්තමේන්තු කළ මුදල් ප්‍රමාණයෙන් අතර වෙනස වන්නේය. බොල් ණය හඳුනාගත් පසු කපා හරිනු ලැබේ.

(ඒ) විදේශීය මුදල් කාලීන බැරකම්

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැය මත පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම්, කාලීන බැරකම්වල වටිනාකමෙහි වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂපත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වටිනාකම් වෙනස්වීම මගින් උද්ගත වන ලාභ හෝ පාඩු, වියදම් ලෙස වහාම ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ. බැරකම් අයිතිය තවදුරටත් පවති නම් ලාභය හෝ පාඩුව උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන් (ලාභය) පාඩුව ලෙස වාර්තා කරනු ලැබේ. ලාභය හෝ පාඩුව උපලබ්ධි වූයේ නම් (බැරකම ගෙවා දැමීම මගින්) මිල වෙනස්වීම

මගින් උපලබ්ධි වූ (ලාභ) පාඩු වශයෙන් වාර්තා කරනු ලැබේ.

(ඹ) මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ

මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත්වලට අදාළ වේ. එවැනි මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. ඉදිරි විනිමය කොන්ත්‍රාත්තුවල සාධාරණ වටිනාකම ගණනය කරනු ලබන්නේ ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත්තුවලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින් ය. ලාභ හෝ පාඩු තත්වයේ පවතින සියළුම මිල ගිවිසගත් ලියවිලි, විදේශීය මුදල් වෙළෙඳම හෝ විකිණීමට තිබෙන පුරුකුම්පත් ශේෂය යටතේ ශේෂ පත්‍රයෙහි වාර්තා කරනු ලැබේ.

(ඕ) අනෙකුත් මූල්‍ය වත්කම් සහ බැරකම්

දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් ගනුදෙනුවේ දින වටිනාකමට හඳුනා ගනු ලැබේ.

(ක) මූල්‍ය වත්කම් වල හානිකරණය

බැංකුව විසින් ශේෂපත්‍ර දිනයන්හි දී කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි සමාලෝචනය කරනු ලැබේ.

(i) කාලීන නිදහස් කිරීමේ පිරිවැයට ධාරණය කළ වත්කම්

කාලීන නිදහස් කිරීමේ පිරිවැයට ධාරණය කළ ණයක් හානිකරණ වී ඇතිබවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය වන්නේ වත්කමේ ධාරණ අගය හා ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවල (නොදරූ අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොලී අනුපාතයෙන් වට්ටම් කළ අගයන් අතර වෙනසයි. වත්කමක ධාරණ අගය සෘජුව හෝ වක්‍රව, දීමනා ගිණුමක් මගින් අඩුකරනු ලැබේ. අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත්, තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්දැයි සමාලෝචනය කරනු ලැබේ. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව සමාලෝචනය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇතිබව සාධාරණ සාක්ෂි නොමැතිබවට තීරණය කළහොත් හා එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම් සමග ඇත්නම්, එම සියළුම මූල්‍ය වත්කම් හානිකරණය සඳහා සලකා බලනු ලැබේ. හානිකරණය සඳහා තනිව සමාලෝචනය කෙරෙන වත්කම්, එම වත්කම් වලට අදාලව එම හානිකරණ අලාභ හඳුනා ගැනෙන විටෙක ඒවා සාමූහික හානිකරණය සඳහා සලකා බලනු නොලැබේ.

පසුකලකදී හානිකරණ අලාභය අඩුවී ඇත්නම් හා එම අඩුවීම, එම අලාභ හඳුනාගන්නා අවස්ථාවට පසුව ඇතිවූ සිද්ධියකට සම්බන්ධ නම්, එම හඳුනාගත් හානිකරණ අලාභය නැවත ගලපනු ලැබේ. කිසියම් හානිකරණ අලාභයක්, ආදායම් ප්‍රකාශනයේ නැවත ගලපන්නේ, නැවත ගලපන දිනට එම වත්කමේ ධාරණ අගය, එහි ක්‍රමක්ෂය පිරිවැය නොඉක්මන අගයක් දක්වා පමණි.

(ii) වෙළෙඳම සඳහා ඇති ආයෝජන

වෙළෙඳම සඳහා ඇති ආයෝජනයක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම හා ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, ලාභ හෝ අලාභයට පෙර හඳුනාගත් හානිකරණ අලාභ අඩුකර, හිමිකරුවන්ගේ ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

වෙළෙඳම සඳහා ඇති වර්ගකරන ලද ප්‍රාග්ධන උපකරණ වල නැවත ගැලපීම් ලාභයට හඳුනාගනු නොලැබේ. ණය උපකරණයක සාධාරණ අගය වැඩිවීම, හානිකරණ අලාභ ලාභ හෝ අලාභ තුළ හඳුනාගැනීමට පසු සිද්ධියකට සම්බන්ධ නම්, ඒවායේ ඇතිවන හානිකරණ අලාභ නැවත ගැලපීම්, ලාභ හෝ අලාභ තුළට ගලපනු ලැබේ.

1.10 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

ආශ්‍රිත සමාගම්වල බැංකුවේ ආයෝජන පසුව අපහරණය සඳහා රඳවා ගෙන ඇති ඒවා ද සමග, පිරිවැය ක්‍රමයට ගිණුම්ගත කර තිබේ.

1.11 රන් තොගය

ඉතාමත් ද්‍රවශීල භාණ්ඩයක් වන රන් තොග පිරිවැය මත පවත්වා ගනු ලැබේ.

1.12 තොග

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනමට පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් චලනය වන තොග සඳහා වෙන් කිරීමක් සිදු කරනු ලැබේ.

1.13 දේපල, පිරියත සහ උපකරණ

දේපල පිරියත හා උපකරණ ආරම්භයේ දී එදිනෙද සේවා වියදම් හැර, එහි සමුච්චිත ක්ෂය හා යම් සමුච්චිත හානිකරණ අලාභ වේ නම් එයද අඩුකර පිරිවැයට ධාරණය කළ යුතුය. හඳුනාගැනීමේ මූලධර්මය අනුව දේපල, පිරියත හා උපකරණ අයිතමයක් කොටසක් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන පිරිවැය අස්තිත්වයක් එම පිරිවැය දරන අවස්ථාවේ හඳුනාගැනීමේ නිර්නායකයන් තෘප්ත කෙරේ නම් අදල

පිරිවැයට ඇතුලත් වේ. ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගනණ දිනෙන් පසු ගොඩනැගිලි ක්ෂයවීම් හා හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගයට මනිනු ලැබේ.

ඉඩම් හැර වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීව කාලය තුළ සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

අංක II - 2 සංඛ්‍යා සටහන

ස්ථාවර වත්කම්වල ඵලදායී ජීව කාලය

වත්කම් වර්ගය	ජීව කාලය
නිදහස් දේපලවල ඇති ගොඩනැගිලි	වර්ෂ 50 තුළ
කල්බදු දේපල සහ ගොඩනැගිලි	කල්බදු සීමාව ඇතුළත
පිරියත හා පිරියත උපකරණ	වර්ෂ 20 තුළ
ලී බඩු සහ උපකරණ	වර්ෂ 10 තුළ
මෝටර් වාහන	වර්ෂ 5 තුළ
පරිගණක දෘඨාංග හා මෘදුකාංග	වර්ෂ 4 තුළ
කියවීමේ ලිපි	වර්ෂ 3 තුළ

පිරියත හා උපකරණ වල ධාරණ අගයන් නැවත අය කරගත නොහැකි බවට සලකුණු ඇත්නම්, හානිකරණ අලාභ සඳහා සලකා බලනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි පළමුවෙන්ම ප්‍රත්‍යාගණන වටිනාකමට පවත්වාගෙන යන අතර එය ගොඩනැගිලිවල සමුච්චිත ක්ෂයවීම් හා පසු සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ වටිනාකමයි. ප්‍රත්‍යාගණන වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයන් විශාල ලෙස වෙනස්වීම් මඟහරවා ගැනීමට, නිතරම අගයකිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය යටතේ ශේෂ පත්‍රයේ දක්විය යුතුය. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි වියදමක් ලෙස ආදයම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන, ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේවුවද ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යගණන අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමඟ ගලපනු ලැබේ. වත්කමක් ඉවත්කිරීමේ දී කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේනොත් එය රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැති නම්, එය දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක ඇතිවන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල හා ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදී ම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

වත්කම්වල ශේෂ අගයන්, ජීව කාලයන් හා ක්‍රම සමාලෝචනයට භාජනය කරන අතර, නිතරම ඒ පිළිබඳව අදාල ගැලපීම් කරනු ලැබේ.

1.14 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම්, අඩමාන ණය සඳහා නිසි වෙන් කිරීම්වලට පසුව අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

1.15 විවිධ වත්කම්

විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

1.16 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇති විටකදී එම වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍ය වීමත්, එම වගකීම පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් සැලසීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීම බැංකුව විසින් අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූරණය නිසැකයෙන්ම තහවුරුවන අවස්ථාවලදී එය වෙනම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

1.17 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා වූ බැරකම, මුහුණත වටිනාකම මත ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

1.18 විශ්‍රාම වැටුප් හා අනෙකුත් පසු සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම

(අ) නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම

බැංකුව විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂිකය හා පසු සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලබයි. ඉහත පළමු යෝජනා ක්‍රම තුන සඳහා බැංකුව විසින් දායකවීම් දරමින් වෙනමම අරමුදල් මෙහෙයුම් කරනු ලබයි. විශ්‍රාම පාරිතෝෂිකය සහ පසු සේවක වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අරමුදල්ගත කර නොමැති අතර, අනෙකුත් සියළුම යෝජනාක්‍රම අරමුදල් ගතකර ඇත. නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, ප්‍රක්ෂේපණ ඒකක බැර ක්‍රමය මත තීරණය කළ ආයුගණක අගය මත එම යෝජනාක්‍රම සඳහා, වෙනමම තීරණය කරනු

ලැබේ. ආයුගණක අගයකිරීම් වර්ෂ තුනකට එක් වතාවක් කරනු ලැබේ. එක් එක් සැලසුමට අදල සමුච්චිත හඳුනා නොගත් ආයුගණන ලාභ අලාභ, නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ සහ සැලසුමේ වත්කම්වල සාධාරණ අගය හෝ වැඩි සංඛ්‍යාව සියයට 10 ඉක්මවන අවස්ථාවලදී ආයුගණක ලාභ හෝ පාඩු ආදයම් හෝ වියදම් ලෙස හඳුන්වනු ලැබේ. එම ලාභ හෝ අලාභ, මෙම යෝජනා ක්‍රම සඳහා සහභාගිවන සේවකයන්ගේ අපේක්ෂිත ඉතිරි වැඩකරන කාලය මත සටහන් කරනු ලැබේ.

(ආ) නිශ්චිත දයක යෝජනා ක්‍රම

අදල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දයකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දයකත්වයට සුදුසුකම් තිබේ. ඒවා වෙනම පරිපාලනය කෙරෙන නිශ්චිත දයක සැලසුම් වන අතර, බැංකුව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් පිළිවෙලින් 24% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දයකයන් වශයෙන් ගෙවනු ලැබේ.

1.19 ප්‍රදනයන්

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදනයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇති විට ඒවා හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදනයන් වියදම් විෂයයකට අදළ වන අවස්ථාවකදී වියදමට සරිලන කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත ආදයම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදනයන් වත්කමකට අදල වන අවස්ථාවකදී, එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදන ගිණුමකට බැර කරනු ලබන අතර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ආදයම් ප්‍රකාශයට මුදා හරිනු ලැබේ.

1.20 සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම්වලට, මූළ කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුලත්ය. වැටුප් සම්බන්ධිත වියදම් සහ වර්ෂය අවසානයේ දී උපචිත නිවාඩු අනෙකුත් දේශීය ගෙවිය යුතු මුදල් යටතේ වාර්තා කරනු ලැබේ.

1.21 ක්‍රියාත්මක කල් බදු

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හිදී, කල්බදුගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කල්බදු කුලිය, එය බලපවත්නා කාපරිච්ඡේදය තුළ ආදයම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

1.22 ආදයම් බදු

බැංකුවේ ආදයම, 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 118 වගන්තිය යටතේ ආදයම් බද්දෙන් නිදහස් වේ.

1.23 භාරකාරත්වය සහ පරිපාලනමය කටයුතු

භාරකාරත්වය හෝ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල් ප්‍රමාණයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත.

1.24 ආදයම් සහ වියදම්

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලා ඒමේ හැකියාව සහ ආදයම නිසැකව මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදයම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදයම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදයම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරනු ලබන සියළු වියදම්, වර්ෂය සඳහා ලාභය ගණනය කිරීම පිණිස ආදයමට එරෙහිව සටහන් කර ඇත.

ආදයම් සහ වියදම් හැඳින්වීමට පෙර පහත දක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන්ද සපුරාලිය යුතුය.

(අ) පොලිය

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම් මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදයිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොලී ආදයම සහ වියදම ආදයම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදයම් ආයෝජන සහ වෙළෙඳම් කෙරෙන සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් ලියවිලි මත උපචිත වට්ටම් සහ අධිමිල පොලී ආදයමට ඇතුළත්ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවන්හිදී පොලී ආදයම අත්හිටුවන අතර ඒවා ලැබෙන තුරු පොලී ආදයමෙන් බැහැර කරනු ලැබේ.

(ආ) ලාභාංශ

ලාභාංශ ආදයම කොටස් හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුන්වනු ලැබේ.

(ඇ) විවිධ

විවිධ ආදයම් සහ වියදම් උපචිත පදනම මත හඳුන්වනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගත වන ආදයම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද මුදලින් අඩුකර ආදයම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අපහරණයේ දී, එකී වත්කමට අදළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවත්නා මුදල සෘජුව සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකාරකම්වලට ආනුෂංගික ක්‍රියාකාරකම් වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනුවලින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකර ශුද්ධ පදනම මත වාර්තා කර ඉදිරිපත් කරනු ලැබේ.

1.25 ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ඇතුළු අසම්භාව්‍යයෙන් සහ බැඳීම්

ශේෂ පත්‍රයේ බාහිර විෂයයන් නිරූපනය කෙරෙන ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු හා අනෙකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයක් ලෙස හඳුනාගෙන අදල ශීර්ෂ යටතේ දක්වා ඇත.

1.26 ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රතිපත්ති සහ පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමනාකරණය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිව යුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පාරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දේ ඇතුළත්ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම
- මුදල් නිකුත් කිරිම
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරඟකාරිත්වය සහ ස්ථායිතාව සැලසීම
- නිශ්චිත මූල්‍ය ආයතන සඳහා අවසර දීම සහ අධීක්ෂණය
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය සහ කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියා කරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ රජයේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියා කිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සපුරා ගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දක්විය හැකිය.

(අ) විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වේ. විදේශීය සංචිත කළමනාකරණ සංතකය විදේශීය මුදල් මැදිහත් වීමේ කාර්යයන් සඳහා වූ (විදේශීය සංචිත) විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳකටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම් වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වලින් පවත්වනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද ඩොලර්, යූරෝ, රන්පවුම් සහ ජපන්යෙන් වලින් හඳුන්වා ඇත. මෙම විදේශීය මුදල් සන්තක තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් සෙවරි සුරැකුම්පත් ප්‍රතිවර්තිත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වානිජ බැංකු සහ බේරුම් කිරීමේ ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම් වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් හා බැරකම් ද කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

(ආ) දේශීය මුදල් ගනුදෙනු

දේශීය මුදල් ගනුදෙනු පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදු කරනු ලැබේ.

(ii) සංසරණයේ පවත්නා මුදල් නිරූපනය කෙරෙන බැරකමට ආධාරකව ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් පවත්වාගැනීම බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ, මෙම ආයෝජන වෙළෙඳම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා රඳවා ගැනීමටය.

2. බැංකු අධීක්ෂණ

මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර ලබාදෙන බැංකු ආයතනයන් පිළිබඳව මහ බැංකුවේ විධිමත්කරණ හා අධීක්ෂණ කාර්යය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. බැංකු ක්‍රමයේ සුරක්ෂිතභාවය හා මනා ක්‍රියාකාරිත්වය සහ තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ ආරක්ෂාව අරමුණු කොට මෙම විධිමත්කරණය සහ අධීක්ෂණය සිදු කෙරේ. 2005 වර්ෂය අවසාන වනවිට බලපත්‍රලාභී බැංකු 36 ක් එනම්, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 14 ක් මහ බැංකුවේ විධිමත්කරණය සහ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. 2005 වර්ෂය අවසාන වනවිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් වලට පහත සඳහන් ද මූලික වශයෙන් ඇතුළත් විය.

2.1 විචක්ෂණ රෙගුලාසි නිකුත් කිරීම

2005 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නව විචක්ෂණ රෙගුලාසි සහ මාර්ගෝපදේශ කිහිපයක් මෙන්ම වර්තමාන විචක්ෂණ අවශ්‍යතාවයන් කිහිපයක් සඳහා සංශෝධන ද නිකුත් කරන ලදී. මෙම වාර්තාවේ 3 වන කොටසේ මෙම රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳ විස්තර සඳහන් වේ. නව අවශ්‍යතාවයන්, බැංකු අග්‍රම කිරීමේ ක්‍රියාවලිය ඉස්ලාම් බැංකු කටයුතු සඳහා පහසුකම් සැලසීම, ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම මනා සාංගමික පාලනය, අවදානම් අඩු කිරීම හා මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම වෙළෙඳපොළ අනාවරණය කිරීම ආදියට පහත සඳහන් අන්දමට සම්බන්ධ වේ.

(අ) 2005 වර්ෂයේදී බැංකු පනතේ (සංශෝධිත) 42 වන වගන්තිය අනුව බැංකු අධ්‍යක්ෂකවරුන් එම තනතුර හෙබවීම සඳහා සුදුසු පුද්ගලයන් බවට දිවුරුම් පෙත්සමක් හා ප්‍රකාශනයක් බාරදිය යුතුවීම.

(ආ) වර්තමාන විචක්ෂණ අවශ්‍යතාවලට අනුකූලවීමට යටත්ව ඉස්ලාම් මූල ධර්ම මත පදනම්ව බැංකුවලට බැංකු කටයුතු ඉදිරිපත් කිරීමට අනුමැතිය දීම.

(ඇ) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

ශක්තිමත් බැංකු සහිතව බැංකු අංශය ඒකාබද්ධවීම දිරි ගැන්වීමේ අරමුණ ඇතිව බලපත්‍රලාභී වාණිජ බැංකුවල අවම ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 500 සිට රුපියල් දශ ලක්ෂ 2,500 දක්වාත් ප්‍රාදේශීය සංවර්ධන බැංකු හැර අනෙක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අවම ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 200 සිට රුපියල් දශ ලක්ෂ 1,500 දක්වාත් ඉහළ දමන ලදී. ප්‍රාග්ධනයේ හිඟයෙන් සියයට 50ක් 2006 වර්ෂයේදී සපුරාලීමේ කොන්දේසියට යටත්ව දනට පවතින ඉහළ දමූ ප්‍රාග්ධනය සපුරාලීමට 2007 දෙසැම්බර් දක්වා කාලය ලබාදෙන ලදී.

(ඈ) සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබාදෙන බැංකු පහසුකම්

අධ්‍යක්ෂකවරයෙකුට හෝ අධ්‍යක්ෂකවරයෙකුගේ සමීප ඥාතියෙකුට ප්‍රදානය කළ හැකි උපරිම බැංකු පහසුකම් වල සීමාව අනුමත සුරැකුම්වලට එරෙහිව රුපියල් 500,000 ක්ද, සුරැකුම් වලින් තොරව ණයකාඩ්පත් සඳහා රුපියල් 500,000 ක්ද ලෙස නියම කිරීම.

(ඉ) කේවල ණය සීමාව

කේවල ණය සීමාව ප්‍රාග්ධනයෙන් සියයට 30ක් ලෙස හා කේවල ණය සීමාව ලෙස සියළුම බැංකු වලට පොදු ලෙස නියම කිරීමටත් පහත සඳහන් ණය එම ණය සීමාවෙන් නිදහස් කිරීමටත් රෙගුලාසි සංශෝධනය කරන ලදී.

(i) 'A' ණය ශ්‍රේණිගත කිරීමක් ඇති ජාත්‍යන්තර හා දේශීය බැංකු නිකුත් කර ඇති ඇප හෝ විදේශීය බැංකු සම්බන්ධයෙන් නම් එහි ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කළ ඇප/ප්‍රතිඥා සුරැකුම් මත ලබාදෙන පහසුකම්.

(ii) අවම වශයෙන් සියයට 50ක් ශ්‍රී ලංකාවෙන් පරිබාහිර මූලයන්ගෙන් හෝ ණය පහසුකම් ලබාදෙන බැංකු හැරුනුකොට වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු යන බැංකු සමූහයක් විසින් යටිතල පහසුකම් සංවර්ධන යෝජනා ක්‍රම සඳහා සපයන ලද පහසුකම්.

(ඊ) මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම

වෙළෙඳපොළ චර්යාව හා අවදානම් ඇගයීමේ ඉහළ නැංවීමේ අරමුණ ඇතිව අක්‍රීය ණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, ද්‍රවශීලතාවය, ණය සහ තැන්පතු පොලී පරතරය, මෙහෙයුම් වියදම් හා ලාභදායීත්වය වැනි තෝරාගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇතුලත්ව බැංකුවල කාර්තුමය මූල්‍ය තොරතුරු පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීම සඳහා ඊට නිර්දේශිත ආකෘතිය සංශෝධනය කරන ලදී.

මීට අමතරව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු කර්මාන්තය සඳහා 2007/2008 වන විට බාසල් II ප්‍රාග්ධන සම්මුතිය, මූලික ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙලක් හඳුන්වා දෙන ලදී. බාසල් II ක්‍රියාත්මක කිරීම සඳහා ස්වයං ඇගයීමක් කිරීමටද බැංකු වලින් ඉල්ලීමක් කරන ලදී. ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි ගැටළු විසඳීම සඳහා බැංකු හා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවන ලදී. 2006 මාර්තු සිට බල පැවැත්වෙන පරිදි වෙළෙඳපොළ අවදානම අවදරණය සඳහාද ප්‍රාග්ධනය තබාගත යුතු වීම පිළිබඳ විධානයේ කෙටුම්පත තීරණය කළ අතර ඒ පිළිබඳව බැංකුවල අදහස් බලාපොරොත්තුවෙන් පසුවිය. මහ බැංකුව විසින් "ආසියා පැසිපික් කලාපය තුළ බාසල් II ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම" සහ "බාසල් II හා මෙහෙයුම් අවදානම් සඳහා වූ 10 වෙනි SEACEN - FSI කලාපීය සම්මන්ත්‍රණය" යනාදිය කොළඹදී පැවැත්වීමට අනුග්‍රහය සහ සහයෝගය දක්වන ලදී.

2.2 බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකකයන් සඳහා අනුමැතිය ලබාදීම.

2005 වර්ෂය තුළ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු පනතට අනුව බැංකු බලපත්‍ර හා බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකකයන් විවෘත කිරීම්, වසා දැමීම හා ප්‍රතිස්ථානගත කිරීම සඳහා වූ ඉල්ලීම් පිළිබඳව කටයුතු කරන ලදී. එස්.එම්.ඊ බැංකුවට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කිරීමට බලපත්‍රය නිකුත් කරන ලදී. බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වූ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව හා බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වූ සීමාසහිත එන්.ඩී.බී. බැංකුව යනාදියෙහි ව්‍යාපාර කටයුතු පවරාගත් සීමාසහිත ජාතික සංවර්ධන බැංකුවට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කිරීමට බලපත්‍රය නිකුත් කරන ලදී. ඉන්දියානු අයි.සී.අයි.සී.අයි බැංකුවට, ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා තාවකාලික අනුමැතිය ලබා දෙන ලදී. මෙම වර්ෂය තුළදී නව බැංකු ශාඛා 50 ක්

සඳහා ද ශාඛා 85 ක් ප්‍රතිස්ථානගත කිරීමට ද, ව්‍යාප්ති කාර්යාල, උකස් මධ්‍යස්ථාන සහ ශිෂ්‍ය ඉතුරුම් ඒකක වැනි අනෙකුත් බැංකු ඒකක 93 ක් සඳහා ද, බැංකු ඒකක 17 ක් ප්‍රතිස්ථානගත කිරීමට හා 6 ක් ඉහලට ශ්‍රේණිගත කිරීම සඳහා ද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 38 ක් සඳහා ද සහ එක් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ද අනුමැතිය ලබාදෙන ලදී.

මේ අනුව 2005 වර්ෂය අවසානයේදී ශාඛා 1,507 ක්ද අනෙකුත් බැංකු ඒකක 2,314ක්ද හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 836 ක්ද ක්‍රියාත්මකව පැවතින.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යය සඳහා ප්‍රවේශ දෙකක් ඇත. එනම්, දුරස්ථ පරීක්ෂාව තුළින් බැංකුවේ යහ පැවැත්ම නොකඩවා අධීක්ෂණය කිරීම හා නිශ්චිත ව්‍යවස්ථාපිත කාල සීමාවක් අතරතුර බැංකුවල එතැන් පරීක්ෂාව සිදු කිරීම යනාදියයි.

2.3 බලපත්‍රලාභී බැංකුවල දුරස්ථ පරීක්ෂණය

දුරස්ථ පරීක්ෂණ ක්‍රමය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් කාලීනව ඉදිරිපත් කරන ලද තොරතුරු පදනම් කර ගනිමින් එම බැංකුවල මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. වෙන් වෙන්ව බැංකු මෙන්ම බැංකු පද්ධතිය සමස්ථයක් ලෙස ගෙන බැංකු මුහුණ දෙන අවදානම පිළිබඳ ඇගැයීමක් සිදු කෙරේ. තවදුරටත් විමර්ශනය හා පරීක්ෂාව අවශ්‍ය වන බැංකුවල මූල්‍ය තත්ත්වයේ වැදගත් සහ තීරණාත්මක වෙනස්වීම හඳුනාගැනීම සඳහා උපකාරීවන පූර්ව අවදනම් හඳුනාගැනීම් ක්‍රියාවලියක් ලෙසද දුරස්ථ පරීක්ෂාව කටයුතු කරයි. බලපත්‍රලාභී බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් ආවරණය වන පරිදි, මහ බැංකුවේ මධ්‍ය තොරතුරු පද්ධතියක් තුළින් ක්‍රියාත්මක වන නව මාර්ගගත ජාලමය ක්‍රමයක් හරහා බැංකු වල මූල්‍ය තොරතුරු මහ බැංකුවට වාර්තා කිරීමේ ක්‍රමයක් වර්තමානයේ සැකසමින් පවතී. 2005 වර්ෂයේදී මෙම ක්‍රමය පරීක්ෂණ මට්ටමින් දියත් කළ අතර 2006 දී එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු ඇත.

2.4 බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත එතැන් පරීක්ෂණ

මුදල් නීති පනතේ හා බැංකු පනතේ විධිවිධානයන්ට අනුකූලව සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු, ව්‍යවස්ථාපිත පරීක්ෂාවන් යටත් වන අතර මුදල් මණ්ඩලයේ තීරණය අනුව අවම වශයෙන් එක් පරීක්ෂණ කාල පරිච්ඡේදයක් තුළ එක් වරක්වත් පරීක්ෂණය සිදුකළ යුතු මෙම එතැන් පරීක්ෂණය වර්තමානයේදී වසර 2කට වරක් සිදු කෙරේ. බැංකු අවදනම් හඳුනාගැනීම, එම අවදනම් කළමනාකරණය හා එම අවදනම් ආවරණය සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණය ඇගයීම ආදිය කෙරෙහි අවධානය යොමු කරන අවදනම් පාදක එතැන් පරීක්ෂණ ක්‍රියාවලියක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලැබේ. 2004 වසරේ ආරම්භ කළ බැංකු පරීක්ෂණ 10 ක් සම්පූර්ණ කිරීමත්, 2005 වසරේ ආරම්භ කළ නව පරීක්ෂණ 12 ක් ඇතුලත්ව 2005 වසරේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ 22 ක් සිදු කරන ලදී. 2005 වසරේ ආරම්භ කළ පරීක්ෂණ 12 කින් 8 ක පරීක්ෂණ සම්පූර්ණ කරන ලද අතර අනෙක් බැංකු හතරෙහි පරීක්ෂණ අවසන් වී නොතිබුණි. ඒ අනුව 2005 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ 18 ක් සම්පූර්ණ කරන ලදී.

2.5 ප්‍රමුඛ සේවින්ග්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් බෑන්ක් ලිමිටඩ් පිළිබඳ විසඳුම් ක්‍රියාමාර්ග

2002 ඔක්තෝබර් මාසයේදී ප්‍රමුඛ බැංකුවේ ව්‍යාපාරික කටයුතු අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු බලපත්‍රය 2002 දෙසැම්බර් 18 වන දින අවලංගු කිරීමටත්, මුදල් නීති පනතේ විධිවිධාන අනුව ප්‍රමුඛ බැංකුව ඈවර කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීමට බැංකු අධීක්ෂක අධ්‍යක්ෂක වෙත නියෝග කිරීමටත් මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මුදල් මණ්ඩලයේ තීරණය අභියෝගයට ලක් කරමින් ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුවන් කණ්ඩායම් කිහිපයක් සහ එහි කළමණාකාරිත්වය විසින් අධිකරණයේ ගොනුකල නඩු මත මහාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් පසුව දෙන ලද තීන්දු අනුව නීත්‍යානුකූලව ප්‍රමුඛ බැංකුවේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට ඇති විකල්පයක් මහ බැංකුව සලකා බලන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමටත් එහි ව්‍යාපාර කටයුතු නැවත ඇරඹීමටත් පාර්ශව කිහිපයක් කැමැත්තක් දක්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන උපදේශකයකු වන අර්නස්ට් සහ යන්ග් හි සහාය ඇතිව එම පාර්ශවයන් විසින් ඉදිරිපත් කළ යෝජනා හා අදහස් ඇගයීමක් සිදුකළ අතර කිසිදු යෝජනාවක් ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුවන්ගේ හා ණය හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමුඛ බැංකුවට නව ප්‍රාග්ධනය ලබාදීමට හා එය ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ තරම් ප්‍රායෝගික නොවීය. මේ අනුව, බැංකු පනතේ 76 M (i) වගන්තියට අනුව ප්‍රමුඛ බැංකුවේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමටත් මුදල් පනතේ 30 (10) (ආ) වගන්තියට අනුව බැංකු බලපත්‍රය අවලංගු කිරීමටත්, මුදල් පනතේ 30(3) වගන්තියට අනුව ප්‍රමුඛ බැංකුව ඈවර කිරීම සඳහා අදළ අධිකරණයකට ඉල්ලීමක් කිරීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට නියම කිරීමටත් 2004 අගෝස්තු 3 වන දින මුදල් මණ්ඩලය තීරණය කරන ලදී. මේ අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් ප්‍රමුඛ බැංකුව ඈවර කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 168/CO දරණ නඩුවක් ගොනු කරන ලදී. ඒ සමඟම ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුවෙක් මුදල් මණ්ඩලය විසින් ප්‍රමුඛ බලපත්‍රය අවලංගු කිරීමට හා බැංකුව ඈවර කිරීමට ගත් තීරණය නිශ්ප්‍රභා කිරීමට ඉල්ලමින් අභියාචනාධිකරණයේ අංක 1955/2004 දරන නඩුවක් ගොනු කරන ලදී. අභියාචනාධිකරණය විසින් සිය අවසන් තීන්දුව ලබාදෙන තුරු ඈවර කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටවීමේ නියෝගයක් අතුරු අභියාචනාධිකරණය විසින්

නිකුත් කරන ලදී. 2005 ජූනි වනවිට නඩුව සඳහා පක්ෂව හා විපක්ෂව හේතු දැක්වීම අවසන් වූ අතර අධිකරණ තීන්දුව බලාපොරොත්තුවෙන් පසු විය. 2005 දෙසැම්බර් මාසයේදී, තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ යහපත අරමුණු කොට ප්‍රමුඛ බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමට රජය සිය කැමැත්ත ප්‍රකාශ කළ අතර මේ පිළිබඳව ශක්‍යතා යෝජනාවක් ගරු රාජ්‍ය බැංකු සංවර්ධන ඇමතිතුමාට යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. මේ අනුව, 2006 ජනවාරි මාසයේදී, ප්‍රමුඛ බැංකුවේ සියළුම වගකීම් හා ගුණාත්මක වත්කම් පවරාගැනීම සඳහා නව රාජ්‍ය බැංකුවක් ආරම්භ කිරීමටත්, ප්‍රමුඛ බැංකුවේ බොල් වත්කම් පවරාදීමට වත්කම් කළමණාකරන සමාගමක් පිහිටුවීමටත් යෝජනාවකට අනුමැතිය දෙන ලදී.

2.6 මූල්‍ය ආරක්ෂක දැල - තැන්පත් රක්ෂණ ක්‍රමයේ පරිපාලනය

1987 දී ආරම්භ කළ ස්වේච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මෙම තැන්පතු ක්‍රමය මහ බැංකුවේ බලපත්‍රලාභී බැංකු ආයතනවලට හා 1972 අංක 5 දරණ සමූපකාර සමිති නීතිය යටතේ තැන්පත් භාරගැනීම සඳහා ලියාපදිංචි සමූපකාර සමිති සඳහා විවෘත වේ. 2005 දී, එක් විවිධ සේවා සමූපකාර සමිතියක් එහි ග්‍රාමීය බැංකුවල තැන්පත් වගකීම් සඳහා මෙම ක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබාගෙන ඇත. රක්ෂණ වාරික මුදල් ලැබීම් හා 1997 දී ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදුන් රුපියල් දශ ලක්ෂ 50 ඇතුලත් තැන්පත් රක්ෂණ අරමුදල 2005 දෙසැම්බර් 31 වන දිනට රුපියල් දශ ලක්ෂ 186 ක් විය මෙම අරමුදල් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇති අතර දැනට එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 201 ක් විය. වර්තමාන ස්වේච්ඡා ක්‍රමය වෙනුවට අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමේ යෝජනාව ප්‍රතිපත්තිමය වශයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කොට ඇති අතර එය මූල්‍ය ප්‍රතිසංස්කරණ සභාවන්හි සාකච්ඡා කොට ශක්‍යතාව පරීක්ෂා කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදේශකයන් කණ්ඩායමක් මෙම යෝජනාවේ ශක්‍යතාව සමාලෝචනය කොට රක්ෂණ ක්‍රමයට උපකාරී වන මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සහ රක්ෂණ ක්‍රමය සැලසුම් කිරීමත් සමගාමීව කළ යුතු බවට නිර්දේශ කරන ලදී.

මේ අනුව මෙම අනිවාර්ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සම්පාදනය සඳහා තීරණයක් ගනු ලැබිණි.

2.7 පොදු බැංකු සංසදය

බැංකු ගැටළු විවාදයට හා සාකච්ඡාවට භාජනය කිරීම සඳහා මහ බැංකුව තුළ පොදු සංසදයක් සඳහා වූ ආයතන වැඩපිළිවෙල මූලික වශයෙන් පහත දැක්වේ.

(අ) බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ මහ බැංකු අධිපතිතුමා පවත්වන මාසික රැස්වීම්:

බැංකු කටයුතු හා සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්ති පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමටත්, බැංකු හා මහ බැංකුව අතර සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමටත් මෙම රැස්වීම් උපකාරි වේ. සුනාමියෙන් හානියට පත් වූ කුඩා, මධ්‍යම හා සුළු ව්‍යාපාරිකයන්ට සහායවීමට "සුසහන ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම, ප්‍රාග්ධන අවශ්‍යතාවයට වෙළෙඳපොළ අවදානම සඳහාද ප්‍රාග්ධනය නියම කිරීම, බාසල් II ප්‍රාග්ධන සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්වීම, ජාලගත වෙළෙඳපොළමය පිරමීඩ වලට ගෙවීම සඳහා ජාත්‍යන්තර ණයපත් අනවසර ලෙස භාවිතා කිරීම සහ බැංකු ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ නියමයන් පිළිපැදීම, වාණිජ බැංකු අංශයේ පවතින ඉහළ මූල්‍ය අතරමැදිකරණ පිරිවැය, වෙළෙඳපොළ පොලී අනුපාතිකන්ට සාපේක්ෂව තැන්පතු අනුපාතයන් වැඩි කිරීම, පළ කරන මූල්‍ය වාර්තාවල කාර්තුමය පදනමක් මත පුවත්පත්වල පළකිරීම් සඳහා වූ ආකෘතිය සංශෝධනය කිරීම සහ විවිධ විචක්ෂණ අවශ්‍යතා පිළිබඳ සංශෝධනයන් යනාදිය සාකච්ඡා කෙරුණු ප්‍රධාන කරුණු කිහිපයකි. මීට අමතරව, ප්‍රධාන විධායක නිලධාරීන් විසින් ගනු ලබන ව්‍යාපාරික තීරණවලට උපකාරී වීම පිණිස රටේ ආර්ථික හා මූල්‍යමය සංවර්ධනයන් පිළිබඳව අඛණ්ඩව මෙම රැස්වීම් වලදී ඇගයීමට භාජනය කෙරින.

(ආ) මූල්‍ය ප්‍රතිසංස්කරණ හා මූල්‍ය ස්ථායීතාව සඳහා වූ කමිටු දෙකෙහි රැස්වීම්

(i) මූල්‍ය අංශයේ කමිටුව:

මූල්‍ය අංශයේ කමිටුව ව්‍යවස්ථාවේ 33 වන වගන්තියට යටතේ 2004 ජූනි මස අතිගරු ජනාධිපතිතුමිය විසින් පත් කරන ලද ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කොමිසම යටතේ පිහිටුවා ඇත. භාණ්ඩාගාර ලේකම් විසින් මූලසුන උසුලන ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කොමිසම, සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සමන්විත වේ. අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් හඳුනාගැනීම් හා සමාලෝචනය කිරීම හා යෝග්‍ය නිර්දේශයන් සකස් කිරීම සඳහා මෙම කොමිසමට සහාය වීමට කමිටු 24 ක් පත් කරනු ලැබ ඇත. මූල්‍ය අංශ කමිටුව හැරුණු කොට අනෙකුත් කමිටු අතර බදුකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොළ, නීතිය, ඇඟළුම්, විදුලි සංදේශ, සුළු හා මධ්‍ය ව්‍යාපාර, අපනයන, ප්‍රවාහන, සංචාරක ව්‍යාපාරය හා වෙළෙඳාම හා තීරුබදු යන අංශයන් ආවරණය කෙරෙන කමිටු ඇතුළත් වෙයි. සෑම කමිටුවක්ම සම මූලාසන වලින් හා අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින් සහ වෘත්තිකයන්ගෙන් යුත් සාමාජිකයන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පාන ප්‍රායෝගික අවහිරතා සහ රාජ්‍ය ව්‍යාපෘති හා වැඩ සටහන්වල වාසි ආර්ථිකයේ ඉලක්කගත කොටස්වලට බාධාවකින් තොරව අඛණ්ඩව ගලා යන බවට සහතික වෙමින් ඒවා කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගැනීම සඳහා අවධානය යොමු කිරීම මෙම කමිටු වලින් බලාපොරොත්තු වේ.

මූල්‍ය අංශ කමිටුවේ ප්‍රධාන අරමුණු දෙක වන්නේ මූල්‍ය ස්ථායිතාව වර්ධනය කිරීමටත් දේශීය ව්‍යවසායකයන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා ග්‍රාමීය අංශයට ඇති මූල්‍ය අවකාශ වර්ධනය කිරීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමයි. මූල්‍ය අංශ කමිටුව සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සම මූලාසනය දරයි.

මූල්‍ය අංශ කමිටුවේ රැස්වීම් 7 ක් 2005 වර්ෂයේදී පවත්වා ඇත. මෙම කමිටුවේ කටයුතු වලට මූලික වශයෙන් යෝජිත අනිවාර්ය තැන්පත් රක්ෂණ ක්‍රමයේ ශක්‍යතා අධ්‍යයනය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැපැල් ඉතුරුම් ඒකක ප්‍රතිසංස්කරණය තුළින් වැඩි වූ මූල්‍ය පහසුකම් වැඩිකිරීම සහ අවසන් නොවූ මූල්‍ය නීති සම්පාදනය පිළිබඳ පසු විපරම් කිරීම යනාදිය අයත් විය.

(ii) මූල්‍ය ස්ථායිතා කමිටුව:

මූල්‍ය ස්ථායිතා කමිටුවේ මූලික කාර්යය වන්නේ රටේ මූල්‍ය පද්ධතියේ දැඩි අස්ථායිතාවයන්ට හේතු විය හැකි අවදනම් සහ හානිදායක තත්ත්වයන් ඇගයීම සහ මහ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණු දෙකෙන් එකක් වන මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය ප්‍රවර්ධනයට අවශ්‍ය ප්‍රතිපත්ති නිර්දේශ කිරීමයි. 2005 වර්ෂය අවසාන වන විට මූල්‍ය ස්ථායිතා කමිටුව සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, නියෝජ්‍ය අධිපතිවරු දෙදෙනා සහ මූල්‍ය ස්ථායිතාවයට සෘජුවම සම්බන්ධ වන ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ 11 දෙනෙකු මෙයට ඇතුළත් වේ. 2005 වර්ෂය තුල මූල්‍ය ස්ථායිතා කමිටුව සිය ප්‍රථම මූල්‍ය ස්ථායිතා විවරණ වාර්තාව හා පත්‍රිකා 4 ක් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, කාර්යයන් හා සංවිධානය, විදේශ විනිමය ගණුදෙනු සඳහා මාර්ගෝපදේශයක්, මිල ස්ථායිතාව හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව යනාදිය මූල්‍ය ක්‍රමය පිළිබඳ මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම පිණිස නිකුත් කරන ලදී. මීට අමතරව මුදල් මණ්ඩලයේ අනුමැතිය මත, මූල්‍ය සමූහයන්ගේ ක්‍රියාකාරිත්වය නිසා පැන නඟින අවදනම් ඇගයීම හා අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය ස්ථායිතා කමිටුව විසින් මූල්‍ය අංශයේ නීතිමය අධිකාරිත්වයෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීමට පියවර ගන්නා ලදී. මූල්‍ය ස්ථායිතා කමිටුවේ අවධානය යොමු වූ අනෙකුත් අංශ වන්නේ මූල්‍ය ආරක්ෂක වැඩපිළිවෙලක් ලෙස අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමය සඳහා වූ යෝජනාව, බැංකු හා මූල්‍ය ආයතනවල තොරතුරු අධීක්ෂණය සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, ගෙවුම් පද්ධතිය අධීක්ෂණය කිරීම හා මූල්‍ය ආයතනවල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ හා ආපදා ප්‍රතිප්‍රාප්ති සැලසුම් යනාදියයි.

2.8 මූල්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම

මහජනතාවගේ මූල්‍ය ක්‍රමය පිළිබඳව දැනීම ඉහළ නැංවීමේ අරමුණින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2005 වර්ෂය තුළදී පුවත්පත් තුළින් ප්‍රකාශන 2 ක් නිකුත් කරන ලදී. එනම්, "බැංකු පොලී පිළිබඳ හැඳින්වීමක්" නම් වූ එක් පිටු පුවත්පත් දැන්වීම සහ "මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමට නීතිමය වශයෙන් අනුමැතිය ලැබූ ආයතන" නම් වූ පිටු බාගයක පුවත්පත් දැන්වීමයි. මේ ප්‍රකාශන මගින් මූල්‍ය ආයතන සමඟ කරන ගණුදෙනු වල ඇති අවදනම් හා ප්‍රතිලාභ ඇගයීමටත් ඒ පිළිබඳ සුපරීක්ෂාකාරී වීමටත් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාවට අවවාද කරනු ලැබීය.

3. ව්‍යවහාර මුදල්

3.1 ව්‍යවහාර මුදල් නිකුතුව

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලධරයා වශයෙන් ශ්‍රී ලංකාව තුළ ගනුදෙනු කිරීම සඳහා වලංගු මුදල් නිකුත් කිරීමේ කාර්යභාරය 2005 වසර තුළ දී ද ඉටු කරන ලදී. 2004 වර්ෂය අවසානයේ සංසරණයේ පැවති රුපියල් බිලියන 116 ක් වූ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි ප්‍රමාණය සමග සසඳන කළ 2005 වර්ෂය අවසානයේදී මෙම මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 132 ක් විය. මෙතෙක් රට තුළ වාර්තා වූ ඉහළම ව්‍යවහාර මුදල් සංසරණය මෙය විය. සංසරණය වූ නෝට්ටු ප්‍රතිශතය සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන් සියයට 97 ක් වූ අතර ඉතිරිය කාසි වලින් සමන්විත විය. 2004 වසරේ දී වාණිජ බැංකු සඳහා නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 272 ක වටිනාකමින් යුත් කාසි දශ ලක්ෂ 112 හා සසඳන කළ මෙම වසර තුළ දී එය රුපියල් දශ ලක්ෂ 250 ක වටිනාකමින් යුත් කාසි දශ ලක්ෂ 115 ක් විය. වාණිජ බැංකු සඳහා 2000 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නිකුත් කරන ලද කාසි ප්‍රමාණයන් සහ ඒවායේ වටිනාකම අංක II - 3 සංඛ්‍යා සටහනේ දක්වේ.

3.2 සංසරණයට එක් වූ නව කාසි කාණ්ඩය

දිගුකාලයක සිට අපේක්ෂා කල අරමුණු කීපයක් ඉෂ්ටකරමින් කාසිවල ප්‍රමාණය හා බර සහ එම කාසි සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය අඩු කිරීම උදෙසා ප්‍රමාණයෙන් කුඩා වූ ද බරින් අඩු වූ ද නව කාසි කාණ්ඩයක් බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. නව කාසි කාණ්ඩය හඳුන්වා දීම නිසා 2005 වර්ෂයට අදළ කාසි නිෂ්පාදනය සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කල පිරිවැයෙන් රුපියල් දශ ලක්ෂ 600 ක් පමණ ඉතිරි කර ගැනීමට බැංකුවට හැකි විය. 2005 දෙසැම්බර් මස 14 වන දින සංසරණයට නිකුත් කල මෙම නව කාසි කාණ්ඩය රුපියල් 5, රුපියල් 2, රුපියල් 1, සත 50 සහ සත 25 වටිනාකම් සහිත කාසිවලින් සමන්විත විය. නව කාසිවල මුහුණත සහ පිටුපස මෝස්තර දැනට සංසරණයේ පවතින සම වටිනාකමැති කාසි හා සමාන වේ. රුපියල් 5 සහ රුපියල් 2 නව කාසි ප්‍රමාණයෙන් හා වර්ණයෙන් දැනට සංසරණයේ පවතින සම වටිනාකමැති කාසි හා එක සමාන වන අතර ඒවායේ බර සහ ලෝහ සංයුතිය වෙනස් කර ඇත. රුපියල් 1, සත 50 සහ සත 25 කාසි පහසුවෙන් හඳුනාගනුවස් දැනට සංසරණයේ පවතින සම වටිනාකමැති

කාසි වලට වඩා වෙනස් ලෝහ සංයුතිවලින් සහ වර්ණවලින් ද නිමවා ඇත. මෙම නවකාසි දැනට සංසරණයේ පවතින එම වටිනාකමැති කාසි හා සමගාමීව සංසරණය වනු ඇත.

3.3 ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම

ව්‍යාජ නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා දරන උත්සාහයන් මැඩලීම සහ අවම කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් අංශය සමග වඩාත් සහයෝගයෙන් ඊට අදාළ කටයුතු තවදුරටත් කරගෙන යන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2004 වර්ෂයේ රට තුළ දී සොයාගන්නා ලදුව මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහතික ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාජ නෝට්ටු ප්‍රමාණය සැලකිල්ලට ගත් කල එම සංඛ්‍යාව සංසරණයේ පවතින නෝට්ටු දශ ලක්ෂයකට නෝට්ටු 4.5 ක් වූ අතර 2005 වර්ෂයේදී එය නෝට්ටු 11.8 ක් දක්වා වැඩි විය.

අංක II - 3 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු වෙත
නිකුත් කරන ලද කාසි ප්‍රමාණ සහ ඒවායේ වටිනාකම් 2000 - 2005

වර්ෂය	කාසි ප්‍රමාණය (දහස්)										මුළු කාසි ප්‍රමාණය (දහස්)	මුළු වටිනාකම (රුපියල් දහස්)
	රු.10	රු.5	රු.2	රු.1	සත 50	සත 25	සත10	සත 05	සත 02	සත 01		
2000	10,693	15,413	16,186	4,876	6,936	4,320	1,955	1,287	75	430	62,171	226,057
2001	6,136	20,726	22,668	19,328	4,286	5,996	2,380	399	60	205	82,184	233,557
2002	10,965	16,820	19,968	11,991	8,466	5,752	1,770	396	185	425	76,738	251,553
2003	5,735	23,512	27,187	29,160	8,276	5,964	2,905	294	195	220	103,448	264,384
2004	5,670	24,677	25,218	34,093	9,220	9,184	2,785	549	105	80	111,581	271,829
2005	1,601	27,983	21,543	43,297	11,374	8,396	152	225	280	15	114,866	250,126

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

අංක II - 4 සංඛ්‍යා සටහන
විකිණීම පිණිස ඇති සමරු කාසි සහ නෝට්ටු

අයිතම අංක	විස්තරය	කාසියේ සඳහන් වර්ෂය	මුහුණත වටිනාකම (රු)	ලෝහය/ද්‍රව්‍ය	විකුණුම් මිල (රු)
1	රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ 3 වන පදවි ප්‍රාප්ති සංවත්සරය (ප්ලාස්ටික් ඇසුරුම)	1992	1	තඹ/නිකල්	250
2	එක්සත් ජාතීන්ගේ 50 වන සංවත්සරය (ප්ලාස්ටික් ඇසුරුම)	1995	5	නිකල්/පිත්තල	200
3	ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සංවත්සරය (නෝට්ටු ෆෝල්ඩරය)	1998	200	පොලිමර්	400
4	ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 50 වන සංවත්සරය (විශේෂ කාසිය /පෙට්ටිය සහිත)	1999	1	නිකල් ආලේපිත වානේ	400
5	ශ්‍රී ලංකා නාවුක හමුදාවේ 50 වන සංවත්සරය (විශේෂ කාසිය/පෙට්ටිය සහිත)	2000	1	තඹ/නිකල්	500
6	ශ්‍රී ලංකා නාවුක හමුදාවේ 50 වන සංවත්සරය (පෙට්ටිය සහිත)	2000	1	නිකල් ආලේපිත වානේ	200
7	ශ්‍යාමෝපාලි මහා නිකායේ 250 වන සංවත්සරය (කාසි ඇසුරුම)	2003	රු. 5 x 10	නිකල්/පිත්තල	100

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

3.4 භාවිතයට නුසුදුසු මුදල් නෝට්ටු විනාශ කිරීම

වසර තුළ දී මුදල් නෝට්ටු හරිවැරදි බැලීමේ ගණන් කිරීමේ හා තේරීමේ (සී.වී.සී.එස්.)යන්ත්‍ර දෙක මගින් සේවා නිසි සහ සේවා අනිසි ගණවලට අයත් නෝට්ටු දශ ලක්ෂ 130.7 ක් ගණනය කරණ ලදී. දෙපාර්තමේන්තුව විසින් 1996 වර්ෂයේ සිට සුරක්ෂිතාගාරවල එක්රැස්ව තිබූ විනාශ කිරීම සඳහා තෝරා වෙන්කරන ලද භාවිතයට නුසුදුසු නෝට්ටු දශ ලක්ෂ 168 ක් බාහිර ආයතනවල ධාරා ඌෂ්මක යන්ත්‍ර උපයෝගී කර ගනිමින් පුළුස්සා විනාශකර දමන ලදී.

3.5 සමරු නෝට්ටු සහ කාසි අලෙවිය

කාසි එකතුකරන්නන් සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අය වෙනුවෙන් සමරු නෝට්ටු සහ කාසි විකිණීම දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. රන් සහ රිදී සමරු කාසිවල විකුණුම් මිල ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ කවුන්ටර් අංශයේ ප්‍රදර්ශනය කරනු ලබන අතර මෙම කාසි පිළිබඳ යාවත්කාලීන විස්තර මහ බැංකු වෙබ් අඩවියේ සඳහන් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් මිලදී ගතහැකි අනෙකුත් සමරු නෝට්ටු සහ කාසි සහ ඒවායේ මිල ගණන් පිළිබඳ විස්තර අංක II - 4 සංඛ්‍යා සටහනින් දැක්වේ.

3.6 දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, නෝට්ටු පිරිසිදුව පරිහරණය කිරීමේ වැදගත්කම සහ නවකාසි කාණ්ඩයක් හඳුන්වාදීම අරමුණු කරගෙන බැංකු නිලධාරීන්, පොලිස් නිලධාරීන්, පාසැල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රසිද්ධ දේශන, සමුළු, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. නව කාසි පද්ධතිය නිකුත් කිරීම සහ ව්‍යාජ නෝට්ටු මුද්‍රණය යන කරුණු සම්බන්ධයෙන් පුවත්පත් සහ සඟරා සඳහා ලිපි කීපයක්ද පළ කරන ලදී.

නව කාසි කාණ්ඩය හඳුන්වා දීම සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ රෝයල් මින්ට් ආයතනයේ දායකත්වයෙන් මහ බැංකු සහ වාණිජ බැංකු නිලධාරීන් සඳහා කොළඹ මහ බැංකු මූලස්ථානයේ දී සහ මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලවල මූලිකත්වයෙන් මහනුවර, මාතර සහ අනුරාධපුරයේදී වැඩ සටහන් හයක් සංවිධානය කරන ලදී.

වසර තුළ දී එක්සත් රාජධානියේ ඩිලා රූ ආයතනයේ දායකත්වයෙන් ව්‍යාජ මුදල් හඳුනාගැනීම සම්බන්ධයෙන් මහ බැංකු සහ වාණිජ බැංකු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු සහ පොලිස් නිලධාරීන් සඳහා කොළඹ, මහනුවර, මාතර, කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය, කළුතර, වවුනියාව, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කවල දී වැඩ සටහන් 14 ක් ද පවත්වන ලදී.

මුදල් භාවිතය සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුවත් භාවය වැඩි දියුණු කිරීම උදෙසා දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රදර්ශන සඳහා දායකත්වය සපයන ලදී.

(අ) 2005 අප්‍රේල් 26 සිට මැයි 01 දක්වා කෑගල්ලේ දී මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද 245 වන මහපොළ ප්‍රදර්ශනය.

(ආ) 2005 අගෝස්තු 01 දින වත්තල සාන්ත අන්තෝනි විද්‍යාලය විසින් වාණිජ දිනය සැමරීම වෙනුවෙන් සංවිධානය කල ප්‍රදර්ශනය.

(ඇ) 2005 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 02 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී ප්‍රවාත්ති හා ජන මාධ්‍ය අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද "අගයමු ළමා විය" ප්‍රදර්ශනය.

(ඈ) 2005 නොවැම්බර් 02 සිට 06 දක්වා රුවන්වැල්ලේ දී මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද "තුරුණු ශක්ති" ප්‍රදර්ශනය.

(ඉ) 2005 දෙසැම්බර් 6 සිට 8 දක්වා කැළණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශය මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනය.

ඉහත ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රදර්ශන කුටිය සඳහා පාසල් සිසුන් සහ මහජනතාවගේ අනර්ග සහභාගිත්වයක් දක්නට ලැබුණි.

4. දේශීය කටයුතු

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳ කටයුතු (වි.වෙ.ක.) සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය නියම කිරීම මගින් මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ වාණිජ බැංකු සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීම යන ද්විත්ව කාර්යයන්හි තවදුරටත් නිරත විය. මීට අමතරව, ලංකාසෙට්ල්හි එනම්, රටෙහි තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි කටයුතු සුමට ලෙස ක්‍රියාත්මක වීම සහතික කරනු වස් උපකාරක සේවාවක් වශයෙන් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමද, දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

4.1 මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

(අ) විවට වෙළෙඳ කටයුතු (වි.වෙ.ක.)

2003 දි මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ වෙළෙඳපොළාභිමුඛ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ විවට වෙළෙඳ කටයුතු පවත්වා ගෙන යනු ලැබීය. මෙම රාමුව යටතේ විවට වෙළෙඳ කටයුතුවලට මෙහෙයුම් කටයුතු කිහිපයක් ඇතුළත් වේ. ඒවා නම්, (අ) අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීම සඳහා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු හෝ ද්‍රවශීලතා හිඟයක් ඇත්නම්, ද්‍රවශීලතාවය

සපයාදීම සඳහා ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා දෛනික පදනමක් මත වෙන්දේසි පැවැත්වීම, (ආ) නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් පහසුකම් සැපයීම, (ඇ) මහ බැංකුවේ අභිමතය පරිදි දිගුකාලීන පදනමක් මත ද්‍රවශීලතාවය උකහා ගැනීමට හෝ සපයාදීම සඳහා ස්ථිර පදනමක් මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම හෝ භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික වෙළෙඳපොළෙහි හෝ ද්විතියික වෙළෙඳපොළෙහි) සහ භාණ්ඩාගාර බැඳුම්කර (ද්විතියික වෙළෙඳපොළෙහි පමණක්) ස්ථිර පදනමක් මත මිලදී ගැනීමය. මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය මත වූ පොලී අනුපාතික කොරිඩෝව තුළ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරනු ලැබීය. ප්‍රතිමිලදී ගැනුම් සඳහා සුරැකුම් ලෙස භාණ්ඩාගාර බිල්පත් භාවිතා කරනු ලැබූ අතර ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා සුරැකුම් ලෙස භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර යන දෙවර්ගයම භාවිතා කෙරුණි. තවදුරටත් සියළුම වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් මේ ක්‍රමය යටතේ සහභාගී ආයතන ලෙස කටයුතු කරන ලදී.

වර්ෂය තුළ, මුදල් වෙළෙඳපොළ සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 10.5 ක පමණ අතිරික්ත ද්‍රවශීලතාවයක් සහිතව ඉහළ ද්‍රවශීලතාවයකින් යුතුව පැවතුණි. වර්ෂයේ මුල් මාස හතර තුළ අතිරික්ත ද්‍රවශීලතාවය සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 15.5 ක් පමණ ඉතා ඉහළ අගයක් ගත් අතර එය රුපියල් බිලියන 7 - 26 අතර පරාසයක පැවතුණි. විශාල අතිරික්ත ද්‍රවශීලතාවයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ විශේෂයෙන්ම, සුනාමි ව්‍යසනයෙන් පසුව, මහ බැංකුවට විකුණනු ලැබූ ශුද්ධ විදේශීය විනිමය ලැබීම්ය. එවැනි විශාල අතිරික්ත ද්‍රවශීලතාවයක්, දැනටමත් ඉහළ අගයක් ලෙස සැලකෙන ණය ප්‍රසාරණයට රුකුලක් විය හැකි හෙයින්, දෛනික වෙන්දේසිය තුළින් සමස්ත අතිරික්ත ද්‍රවශීලතාවයම දෛනික පදනමක් මත උකහා ගන්නා අතරම අතිරික්ත ද්‍රවශීලතාවය නිශ්චිත පදනමක් මත අඩු කිරීම සඳහා මහ බැංකුව සිය භාණ්ඩාගාර බිල්පත් දැරීම්වලින් කොටසක් ස්ථිර පදනමක් මත විකිණීම 2005 අප්‍රේල් මාසයේදී ආරම්භ කරනු ලැබීය. රටෙහි ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වයක් සහතික කරනු වස් සුනාමි ව්‍යසනයෙන් පසු, වහාම බැංකු ක්‍රමයට ඉහළ අතිරික්ත ද්‍රවශීලතාවකින් යුතුව ක්‍රියාකිරීමට ඉඩ සැලසීම කාලෝචිත බව සලකනු ලැබීය.

(i) විවට වෙළෙඳපොළ කටයුතු යටතේ දෛනික වෙන්දේසිය

ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

මුල් මාස කිහිපය තුළ වෙළෙඳපොළ ඉතා ද්‍රවශීලව පවත්වා ගැනීමට ගනු ලැබූ තීරණය හා සමගාමීව, දෛනික වෙන්දේසිය තුළින් ද්‍රවශීලතාවය උකහා ගැනීම මුල් අවස්ථාවේදී ඇස්තමේන්තුගත අතිරික්ත ද්‍රවශීලතාවයෙන් සියයට 50 කට පමණ අඩු කරනු ලැබූ අතර, ජනවාරි 5 සිට පෙබරවාරි 21 දක්වා කාලය තුළ දෛනික වෙන්දේසිය තුළින් අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීම අත්හිටුවනු ලැබීය. දෛනික වෙන්දේසිය 2005 පෙබරවාරි 21 දින නැවත ආරම්භ කරනු ලැබූ අතර 2005 මාර්තු මුල් කාලය වන විට ඇස්තමේන්තුගත සමස්ත ද්‍රවශීලතාවයම පාහේ දෛනික වෙන්දේසිය තුළින් උකහා ගැනීම දක්වා ක්‍රමයෙන් වැඩිකරනු ලැබීය.

2005 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ බොහොමයක් දිනවල වාර්තා වූ අතිරික්ත ද්‍රවශීලතාවය දෛනික පදනමක් මත, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම් පදනමක් මත දෛනික වෙන්දේසිය තුළින් විකිණීම මගින් උකහා ගනු ලැබීය. සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 10 ක් පමණ වෙන්දේසියට පිරිනමනු ලැබූ අතර එය ඇස්තමේන්තුගත අතිරික්ත ද්‍රවශීලතාවයෙන් සියයට 97 ක් පමණ විය. ලැබූ ලංසු ප්‍රමාණය සහ පිළිගනු ලැබූ ප්‍රමාණයන් පිළිවෙළින්, පිරිනමනු ලැබූ ප්‍රමාණයෙන් සියයට 97 සහ සියයට 92 ක් විය. බැංකු ක්‍රමයේ ද්‍රවශීලතාවය පුළුල් වශයෙන් සමතුලිත තත්ත්වයක පැවති හෙයින්, මැයි මාසයේ දින පහක් ද, ජුනි මාසයේ දින අටක් ද, දෙසැම්බර් මාසයේ දින පහක් ද දෛනික වෙන්දේසිය නොපැවැත්විය.

සුනාමියට පෙර අවසාන ව්‍යාපාරික දින වූ 2004 දෙසැම්බර් 24 දින සියයට 7.88 ක් වූ බරතබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය වෙන්දේසිය නැවත ආරම්භ කරනු ලැබූ පෙබරවාරි 21 දින සියයට 7.59 දක්වා පහත වැටුණු අතර 2005 මාර්තු අවසානය තෙක් පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාව (සියයට 7.5) ආසන්නයේ පැවතුණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ වෙන්දේසිය තුළින් අතිරික්ත ද්‍රවශීලතාවයට වඩා අඩු ප්‍රමාණයක් උකහා ගැනීමය. 2005 මාර්තු මුල් කාලයේ සිට දෛනික වෙන්දේසිය තුළින් සමස්ත අතිරික්ත ද්‍රවශීලතාවයම පාහේ උකහා ගනු ලැබුවද, සහභාගි ආයතන වෙන්දේසියට සිය ලංසු ඉදිරිපත් කිරීමේදී වඩාත් සැලකිලිමත් වූ හෙයින් මුල් අවස්ථාවේදී ඵලද අනුපාතික පහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, විශේෂයෙන්ම, ද්‍රවශීලතාවය ස්ථිර පදනමක් මත උකහා ගැනීම සඳහා 2005 අප්‍රේල් මාසයේදී භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමක් මත විකිණීම ආරම්භ කිරීමත් සමඟ ඵලද අනුපාතික, පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය දෙසට ක්‍රමයෙන් වැඩි විය.

ප්‍රතිවිකුණුම් ගනුදෙනු

වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව, ද්‍රවශීලතා හිඟය රුපියල් බිලයන 3.7 ක් පමණ වූ දිනෙක, එනම් 2005 ජුනි 20 දින ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා පළමු වෙන්දේසිය පැවැත්විය. වෙන්දේසියට පූර්ණ දායකත්වයක් ලැබුණු අතර වෙන්දේසියට පිරිනමනු ලැබූ රුපියල් බිලියන 2 ක ප්‍රමාණය පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යයෙහි වූ පොලී අනුපාතිකයක් වන සියයට 9.0කට පිළිගනු ලැබුවේය.

(ii) නිත්‍ය පහසුකම්

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙහි ගනුදෙනු වලින් සහ විවට වෙළඳ කටයුතු යටතේ වූ දෛනික වෙන්දේසි තුළින්

සිය කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සම්පූර්ණ වශයෙන් කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතන සඳහා පහසුකම් සැපයීමේ මාර්ගයක් ලෙස නිත්‍ය පහසුකම් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබීය. මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය මත මෙම පහසුකම් සපයනු ලැබූ අතර මෙම අනුපාතිකයන් පියවර හතරකදී පදනම් අංක 125 කින් 2005 දෙසැම්බර් මාසයේදී පිළිවෙළින්, සියයට 8.75 සහ සියයට 10.25 දක්වා වැඩිකරනු ලැබීය.

ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

දෛනික වෙන්දේසිය තුළින් ද්‍රවශීලතාවය උකහා ගැනීම අත්හිටුවීම හෝ අඩු කිරීම හේතුවෙන්, වර්ෂයේ මුල් මාස තුන ඇතුළත නිත්‍ය පහසුකම් යටතේ විශාල ප්‍රමාණයක ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු (සාමාන්‍ය වශයෙන් දිනකට රුපියල් බිලියන 9ක් පමණ) සිදුවිය. කෙසේ වුවද, වර්ෂයේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ, අතිරික්ත ද්‍රවශීලතාවය මූලික වශයෙන් දෛනික වෙන්දේසිය තුළින් උකහා ගනු ලැබූ හෙයින්, නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සාමාන්‍ය වශයෙන් දිනකට රුපියල් බිලියන 1 කට පමණ සීමා විය.

ප්‍රතිවිකුණුම් ගනුදෙනු

බැංකු ක්‍රමයෙහි ද්‍රවශීලතා හිඟයක් තිබෙන අවස්ථාවල සාමාන්‍යයෙන් සහභාගිත්ව ආයතන ප්‍රතිවිකුණුම් ගනුදෙනු තුළින් මහ බැංකුවෙන් අරමුදල් ලබාගනී. කෙසේ වුවද, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය පුළුල් ලෙස සමතුලිත තත්ත්වයක පවතින අවස්ථාවල හෝ සාපේක්ෂ වශයෙන් සුළු ද්‍රවශීලතා අතිරික්තයක් සහිතව වෙළෙඳපොළ ක්‍රියාත්මක වන අවස්ථාවල පවා නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සිදුවී තිබේ. බැංකු ඔවුනොවුන් අතර ණයදීම් සඳහා ඔවුන් විසින්ම ඇති කරගත් සීමාවන් හේතුවෙන් සමහර සහභාගී ආයතනවලට අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙන් අරමුදල් සපයා ගැනීමට අපහසුවීම නිසා ඇතිවූ වෙළෙඳපොළෙහි පැවැති දෘඪතාවය මෙමගින් පිළිබිඹු කරයි. ඒ අනුව, නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිවිකුණුම් ගනුදෙනු මුදල් වෙළෙඳපොළේ චංචලතාවයන් වළක්වා ගැනීමට උපකාරී විය. වර්ෂය තුළ දී දින පනස් හතරක් තුළ සාමාන්‍ය වශයෙන් දිනකට රුපියල් බිලියන 1.5 ක ප්‍රතිවිකුණුම් ගනුදෙනු සිදුවිය.

(iii) ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු මුළු ප්‍රමාණය

දෛනික වෙන්දේසිය සහ නිත්‍ය පහසුකම් යන ක්‍රම දෙකම යටතේ වූ මුළු ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවල වටිනාකම 2005 දී රුපියල් බිලියන 2,507 ක් විය. එය 2004 දී වූ රුපියල් බිලියන 1,602 සිට සියයට 56 ක වර්ධනයකි. ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල මුළු වටිනාකම 2004 දී රුපියල් බිලියන 37 සිට 2005 දී රුපියල් බිලියන 80 දක්වා වැඩි විය.

(iv) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු

ස්ථිර පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීම සඳහා 2005 අප්‍රේල් මාසයේදී, මහ බැංකුව විසින් දරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමක් මත විකිණීම සඳහා වෙන්දේසි පැවැත්වීම ආරම්භ කරනු ලැබීය. වර්ෂය තුළ වෙන්දේසීන් 18 ක් පැවැත්වූ අතර ඉන් 13කටම අධිදායකත්වය සැපයිනි. පිළිගත නොහැකි තරම් ඉහළ එලද අනුපාතිකයන් යටතේ ලංසු ලැබුණු හෙයින්, එක් වෙන්දේසියක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලැබීය. විකුණනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල සම්පූර්ණ වටිනාකම රුපියල් බිලියන 37.2 ක් වූ අතර එය විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ප්‍රමාණයෙන් සියයට 85 ක් විය. මෙම භාණ්ඩාගාර බිල්පත් ඉතා කෙටිකාලීන වූ අතර ඒවායෙහි පරිණතිය දක්වා වූ ඉතිරි දින ගණන දින 7 සිට දින 58 (වැඩි ප්‍රමාණයක් දින 32 - 45 අතර) දක්වා විය. මෙම විකුණුම්වල එලද අනුපාතිකයන් ස්ථිර පදනමක් මත විකිණීම සිදු කරන අවස්ථාවේ ප්‍රාථමික වෙළෙඳපොළේ දින 91 බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය අනුපාතිකයට සංසන්දනාත්මක අනුපාතිකයන්ට වඩා අඩුවිය.

(ආ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය

දෙපාර්තමේන්තුව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියමය ක්‍රියාත්මක කිරීම තවදුරටත් කරගෙන යනු ලැබූ අතර එය ශ්‍රී ලංකා රුපියල් වලින් වූ වාණිජ බැංකුවල තැන්පතු වගකීම් වලින් සියයට 10 ක් ලෙස පැවතුණි.

(ඇ) බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, බැංකු අනුපාතිකය යටතේ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබා නොගත් හෙයින් මෙම අනුපාතිකය අක්‍රියව පැවතුණි.

4.2 වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය

(අ) මූල්‍ය ආයතනවල ගිණුම්

මහ බැංකුවට බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සලස්වමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් සහ පියවුම් ක්‍රමයක් සහතික කරනු වස්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සැපයීමෙහි තවදුරටත් නිරත විය. මෙම ගිණුම් මහ බැංකුවේ ස්වයංක්‍රිය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවීම් පදනමක් මත ක්‍රියාත්මක විය.

(ආ) රජයේ ගිණුම්

මහ බැංකුවට රජයේ බැංකකරු වශයෙන් සේවය කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිතායතන සහ ආයතන, සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය බැංකු පහසුකම් සපයමින් ගිණුම් පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කරන ලදී. 2005 වර්ෂය අවසානයේදී එසේ පවත්වා ගෙන යනු ලැබූ ගිණුම් සංඛ්‍යාව

රූප සටහන් II - 1
වී. වෙ. ක. ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි
(මාසික සාමාන්‍යයන්)



රූප සටහන් II - 2
මාසික ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය
(2004 සහ 2005)



රූප සටහන් II - 3
2005 දී ලබා ගත්. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්



33 කි. වර්ෂය තුළ දී රජයේ ඉල්ලීම අනුව ගිණුම් හයක් විවෘත කරනු ලැබූ අතර 28 ක් වසා දැමීය. මුදල් නීති පනතේ 89 වගන්තියට අනුව මහ බැංකුව රජයට කෙටි කාලීන අත්තිකාරම් ලබාදීම තවදුරටත් සිදු කරන ලදී. මෙවැනි අත්තිකාරම්වල සීමාව (රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10) 2005 වසරේදී රුපියල් බිලියන 5.6 කින් රුපියල් බිලියන 41.2 දක්වා වැඩි විය. මෙම අත්තිකාරම් සඳහා පොලී අයකිරීමක් නොවීය.

4.3 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

ලංකාසෙට්ල්හි මෙහෙයුම් කටයුතු සුමට හා කාර්යක්ෂම ලෙස සිදුවීම සහතික කරනු පිණිස දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සඳහා සහභාගිත්ව ආයතන විසින් කරණු ලබන ඉල්ලීම් හා ඔවුන්ගේ ආපසු ගෙවීම් නිසි අයුරින් සපුරාලීම සහ එදිනම ලංකාසෙට්ල්හි වැඩ අවසන් කිරීමට පෙර, ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් පියවීමට අපොහොසත් වන ආයතනවලින් එම පැහැර හැරීම වෙනුවෙන් නිසි පරිදි වන්දි පොලියක් අයකිරීම මෙම වගකීම් ඉටුකිරීමට ඇතුළත් වේ. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබාදීම ගාස්තුවකින් තොරව රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් තවදුරටත් සිදු කරනු ලැබීය. සුරැකුම්පත්වල වටිනාකම ඒවායේ වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් අනුව ගණනය කරනු ලබන අතර, එයට දවස තුළ ඇතිවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ගැලපීමක් කරනු ලැබේ.

වර්ෂය තුළ ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් වල මුළු වටිනාකම රුපියල් බිලියන 543 ක් විය. මෙය සාමාන්‍යයක් ලෙස ගත්කළ එක් දිනකට රුපියල් බිලියන 2.3 ක් පමණ වූ අතර එය 2004 දී සාමාන්‍ය වශයෙන් එක් දිනකට ලබාගත් රුපියල් බිලියන 2.7 ට වඩා අඩු විය. 2005 වසරේදී, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම පියවීම් මගහැරීම සිදුනොවීය. බැංකු අනුපාතිකය අනුව දඩ පොලියක් නියම කිරීම සහ නැවත නැවතත් ආපසු ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක මෙම පහසුකම අත්හිටුවීම වැනි පියවරයන් ගෙන තිබීම හේතුකොට ලංකාසෙට්ල්හි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට පෙර දවස තුළ ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම නිසි ලෙස සිදුවීම සහතික වී ඇත.

5. ආර්ථික පර්යේෂණ

මුදල් නීති පනතේ 25 වන වගන්තියේ විධිවිධානවලට අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට මුදල් මණ්ඩලයට හා මහ බැංකු කළමනාකාරිත්වයට සහායවීම සඳහා අවශ්‍ය දත්ත සකස් කිරීම හා ආර්ථික පර්යේෂණවල නියැලීම සිදුකළ අතර එම ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම ද සිදුකරනු ලැබීය.

සියළුම වැදගත් ආර්ථික විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ දත්ත සකස් කිරීම, දෛනිකව, සතිපතා, මාසිකව, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික පදනම් මත සිදුකරනු ලැබීය. මූල්‍ය සමීක්ෂණය, පොලී අනුපාත, ගෙවුම් තුලනය, විනිමය අනුපාත සහ විනිමය අනුපාත දර්ශක, විදේශ සංචිත තත්ත්වය, වෙළෙඳ දර්ශක, අපනයන ඉපැයුම් විමර්ශනය, අයවැය තත්ත්වය, කාර්මික නිෂ්පාදන දර්ශකය, කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය සහ මහ කොළඹ නිවාස අනුමත කිරීම් දර්ශකය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලැබූ වැදගත් ආර්ථික දත්තයන්ට අයත් වේ.

ආර්ථික පර්යේෂණ කටයුතු මූලිකවම මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි යොමු වූ අතර

දේශීය හා බාහිර අංශයේ ප්‍රතිපත්ති සඳහා උචිත සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද යොමු විය. මෙහි දී මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. එසේම මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාම හෝ වෙනස් කිරීම සිදුකළ යුතු ද යන්න පිළිබඳව පුළුල් ආර්ථික විශ්ලේෂණයක යෙදෙමින්, මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සාකච්ඡාවලට අවශ්‍ය තොරතුරු සපයා දෙමින් දෙපාර්තමේන්තුව වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබූ අතර මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ අදහස් හා අවධාරණය කළයුතු කරුණු ඇතුළත් වාර්තා මුදල් මණ්ඩලයට සපයනු ලැබීය. එමෙන්ම පූර්ව ප්‍රකාශිත දින දර්ශනයක් අනුව මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මුදල් මණ්ඩලයේ තීරණයන් පුවත්පත් නිවේදන මගින් ප්‍රකාශයට පත්කරනු ලැබීය. මෙයට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් කාලීන වැදගත්කමක් ඇති විෂයයන් පිළිබඳ පර්යේෂණ කටයුතුවල නියැලුණි. සමහර පර්යේෂණ අධ්‍යයනයන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සංස්කරණය කරනු ලබන" මාණ්ඩලික පත්‍රිකා" වෙළුම් දෙකක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබීය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියැසන් මධ්‍යස්ථානය(SEACEN Centre), සාර්ක්ෆිනෑන්ස් (SAARCFINANCE), යූඑන් එස්කැප් (UN-ESCAP), වැනි ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධ වී පර්යේෂණ කටයුතුවල නියැලුණි. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙක් බැංකුව තුළ මෙන්ම ඉන් පරිබාහිරව විවිධ වැදගත් කමිටුවල සේවය කළහ. මේවායින් ඇතැම් ඒවා සාර්ක් රටවල් සමග ඇති කර ගැනීමට නියමිත වෙළෙඳ ගිවිසුම් සඳහා සූදානම් වීමේ රැස්වීම් වූ අතර සමස්තයක් වශයෙන් එම සාකච්ඡා පකිස්ථානය සහ එක්සත් ජනපදය සමග ඇති කර ගැනීමට නියමිත ගිවිසුම්වලට අදාළ කමිටු සහ ඉන්දියාව සමග ඇති කර ගැනීමට නියමිත විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුමට අදාල සාකච්ඡාවන් විය. දෙපාර්තමේන්තුවේ මෙම නිලධාරීහු ආයතන කීපයක අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයන් ලෙස සේවය කළ අතර, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය හා අනෙකුත් විදේශීය හා දේශීය සංවිධානයන් විසින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් හි සම්පත් දායකයන් වශයෙන් ද සේවය කළහ. දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ඇති වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුව වැනි විවිධ කමිටුවලට අවශ්‍ය තොරතුරු සැපයූ අතර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම කමිටු රැස්වීම්වලටද සහභාගි විය. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් පශ්චාත් උපාධි අධ්‍යයනයන්හි යෙදීමට බලාපොරොත්තුවන නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීමට මෙන්ම ඔවුන්ගේ පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය මග පෙන්වීමද සිදුකරන ලදී. තේ, රබර්, හා පොල් සඳහා වන ස්ථායීකරණ අරමුදල්වල සභාපති වශයෙන් ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ කටයුතු කළ අතර ආරම්භයේ සිටම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අරමුදල් කළමනාකරණය කරනු ලැබීය. කෙසේ නමුත් මෙම අරමුදල්වල සියලුම බැර ශේෂ 2005 දී මහා භාණ්ඩාගාරය විසින් කළ ඉල්ලීමක් මත මහා භාණ්ඩාගාරයට මාරු කරන ලදී.

බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා හා අනෙකුත් පර්යේෂණ වාර්තා භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් වේ. 2004 මහ බැංකු වාර්ෂික වාර්තාව, මෑත කාලීන ආර්ථික ප්‍රවණතා - 2005 විශේෂ සිදුවීම් හා 2006 වර්ෂයේ අපේක්ෂාවන් සහ මාසික විවරණිකාව යන වාර්තා ප්‍රකාශයට පත්කිරීම, 2005 දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී. මීට අමතරව මුදල් නීති පනත යටතේ මුදල් ඇමතිවරයාට මහ බැංකුව විසින් සැපයිය යුතු ව්‍යවස්ථාපිත වාර්තා සම්පාදනය කිරීම ද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වගකීමක් විය.

ව්‍යවස්ථාපිත වාර්තා හා සතිපතා හා මාසිකව ප්‍රකාශයට පත්කරන තෝරාගත් ආර්ථික දර්ශක මගින් සහ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය හා පුවත්පත් නිවේදන මගින් තොරතුරු බෙද හැරීම, මෙම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරනු ලැබීය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව 2005 දී ජාත්‍යන්තර වෙළෙඳම පිළිබඳ මාසිකව හා ගෙවුම් තුලනය පිළිබඳ කාර්තුමය වශයෙන් පුවත්පත් නිවේදන නිකුත් කිරීම ද අඛණ්ඩව සිදුකරනු ලැබීය. ගුණාත්මක භාවය වර්ධනය කිරීම, ආවරණය පුළුල් කිරීම සහ අප්‍රමාදව දත්ත නිකුත් කිරීම මෙන්ම ප්‍රවේශයන් පුළුල් කිරීම තුළින් දත්ත සහ තොරතුරු බෙදහැරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව කටයුතු කළේය.

බහුපාර්ශ්වීය ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග පවතින සම්බන්ධතාවයන් සම්බන්ධීකරණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඉටු කරනු ලැබීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, විශේෂයෙන්ම IV වන වගන්තිය යටතේ උපදේශනය, රටවල් විසිහතරකින් සමන්විත අන්තර් රාජ්‍ය කණ්ඩායම (G- 24), පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා වන සියැසන් මධ්‍යස්ථානය, සියැන්සා කණ්ඩායම හා මහ බැංකු අධිපතිවරුන් හා මුදල් ලේකම්වරුන්ගෙන් සමන්විත සාර්ක් ෆිනෑන්ස් කණ්ඩායම සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවයන් සම්බන්ධීකරණය කිරීමද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය ආධාරකරුවන් සමග අදළ කටයුතු සම්බන්ධීකරණයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශයට සහාය විය. 2005 ජනවාරි මාසයේ දී සියැසන් විධායක කමිටුව හා 2005 ජූනි මාසයේ දී "පිරමිඩ ක්‍රම මර්දනය කිරීම" යන මාතෘකාව යටතේ වූ සාර්ක් ෆිනෑන්ස් සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් විය.

කාර්ය මණ්ඩල කුසලතා වර්ධනය ඉලක්ක කර ගනිමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එහි මූලික කාර්යයන්ට අදළ ක්ෂේත්‍ර තුළ, දේශීය මෙන්ම ජාත්‍යන්තර වැඩසටහන්

යටතේ පුහුණුව ලබාදීම අඛණ්ඩව සිදුකරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුවේ සතිපතා හා මාසික සම්මන්ත්‍රණවලට මෙන්ම ඉන් පිටත පවත්වනු ලැබූ වැදගත් සම්මන්ත්‍රණ හා වැඩමුළුවලටද සහභාගි විය. කාර්ය මණ්ඩලය, කාලීන විෂයයන් පිළිබඳව සාකච්ඡා කිරීමට හා නිලධාරීන් සහභාගී වූ පුහුණු වැඩසටහන් මගින් ලත් දැනුම අනෙකුත් නිලධාරීන් සමග හුවමාරු කර ගැනීමට දෙපාර්තමේන්තුව තුළ සතිපතා විශේෂ සම්මන්ත්‍රණ පැවැත්වීය.

6. සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලෙහි (සේ.අ.අ.) භාරකරු වශයෙන් 2005 වර්ෂය තුළ දී ද සිය කටයුතු සාර්ථකව පවත්වා ගෙන යන ලදී. සේ.අ.අ. පනත ප්‍රකාරව මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් වනුයේ දායක මුදල් රැස් කිරීම, අධිභාර රැස් කිරීම, ආයෝජන ආදායම් ලැබීම, ලියාපදිංචි සේවා යෝජකයන් - සාමාජිකයන් සහ අරමුදල වෙනුවෙන් ගිණුම් පවත්වා ගැනීම, අතිරික්ත අරමුදල් උචිත ආයෝජන මාධ්‍යයන්හි ආයෝජනය කිරීම සහ සාමාජිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමයි. කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය සමග සමීප සබඳතාවයෙන් යුතුව මෙම කටයුතු පවත්වාගෙන යනු ලබයි.

6.1 පද්ධති නවීකරණයන්

අරමුදලේ විවිධ වූ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක්ම 2005 වසර තුළ දී සිදු කරනු ලැබිණි. විද්‍යුත් මාධ්‍ය මගින් දයක මුදල් විස්තර රැස්කිරීමේ ක්‍රියාවලිය සේවායෝජකයන් අතර ප්‍රචලිත කිරීම සඳහා අවධානය යොමුකළ අතර, එහිදී අරමුණු කරගනු ලැබුයේ, සේවකයන් 150 කට වඩා වැඩියෙන් සේවයේ යොදවා ඇති සේවායෝජකයන් සියල්ලක්ම 2006 පළමු අර්ධය තුළ දී මෙම ක්‍රමයට ඇතුළත් කර ගැනීමයි. එවිට දයක මුදල් ගෙවනු ලබන මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට 75 ක් පමණ ආවරණය වනු ඇත.

වඩාත් ඵලදයී සාමාජික සන්නිවේදනයක් අරමුණු කරගෙන, දැනට දයක මුදල් නොගෙවන සාමාජික ගිණුම් සඳහා ද වාර්ෂිකව සාමාජික ගිණුම් ප්‍රකාශ ලබාදීම සඳහා ඔවුන්ගේ තත්කාලීන තොරතුරු රැස්කිරීමට වැඩ පිළිවෙළක් 2005 වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. (වර්තමානයේදී, දයක මුදල් ගෙවනු ලබන සාමාජික ගිණුම් වෙනුවෙන් පමණක් අර්ධ වාර්ෂිකව සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කරනු ලබයි.) සාමාජිකයන් හා අනෙකුත් පාර්ශවකරුවන් සමහ වඩාත් යහපත් සන්නිවේදනයක් සඳහා සේ.අ.අරමුදලේ වෙබ් අඩවිය (www.epf.lk) නව අංගයන්ගෙන් සමන්විත වන සේ ප්‍රතිසැලසුම්කරණයකට ලක් කරන ලදී. සේ. අ. අරමුදල් කටයුතු සම්බන්ධව සාමාජිකයන්ට හා සේවායෝජනයන්ට අදාලවන සියළුම පෝරම මෙම වෙබ් අඩවිය තුළින් ලබාගැනීමේ හැකියාව පවතී. 2006 දෙවන කාර්තුවේ දී ස්ථාපනය කිරීමට සැලසුම් කරමින් ගිණුම්කරණ හා ආයෝජන කටයුතු සඳහා විශේෂිත පරිගණක මෘදුකාංගයක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍යය වන්නා වූ සියළුම කටයුතු 2000 වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලද අතර මෙම පරිගණක මෘදුකාංගය මගින් අරමුදලෙහි සමස්ත ගිණුම්කරණ කටයුතු, ආයෝජන කටයුතු හා අවදනම් කළමනාකරණ කටයුතුවල කාර්යක්ෂමතාවය වර්ධනය කෙරෙනු ඇත.

2004 වාර්ෂික ගිණුම් ප්‍රකාශ සහ 2005 වසර සඳහා අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන 2005 වර්ෂය තුළ දී, සාමාජිකයන් වෙත ඔවුන්ගේ සේවායෝජකයන් හරහා ලැබීමට සලස්වන ලදී. මෙහෙයුම් ක්‍රියාකාරිත්වයන් සඳහා දැනටමත් හඳුන්වා දී ඇති කාර්යක්ෂමතා වර්ධනයන් හේතුකොටගෙන සාමාජික ගිණුම් ප්‍රකාශ පෙර වර්ෂයට වඩා මාස 2-3 කට ප්‍රථම සාමාජිකයන් වෙත නිකුත්කිරීමේ හැකියාව ලැබුණි.

6.2 මහජන දැනුවත් කිරීම්

අරමුදලට සම්බන්ධ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්, 2005 වර්ෂය තුළ දී ද සාර්ථකව සිදු කරගෙන යනු ලැබිණි. සාමාජිකයන් වෙත ක්ෂණිකව තොරතුරු ලබා දීම සඳහා පිහිටුවනු ලැබූ "සේවක අර්ථසාධක අත්වැල" මගින් සාමාජිකයන් සමග යහපත් සන්නිවේදනයක් පවත්වාගෙන යන ලදී. තවද, 2005 වසර තුළ දී දිවයිනේ වතු ආශ්‍රිතව ජංගම සේවාවන් 11 ක් පවත්වනු ලැබූ අතර, එහිදී සාමාජිකයින්ගේ ගැටලු සඳහා තත්කාලීනව විසඳුම් ලබාදීමට හැකි විය. එසේම දයක මුදල් එවීමේ දී සිදුවන වැරදි ඉවත්කර ගැනීම හා විද්‍යුත් මාධ්‍ය මගින් දයක මුදල් විස්තර එවීමේ ක්‍රමය ප්‍රචලිත කිරීම අරමුණු කරගෙන සේවායෝජකයන් සඳහා වැඩමුළු කීපයක්ම 2005 වර්ෂය තුළ දී පවත්වන ලද අතර "සේවක අර්ථසාධක අරමුදල් අත්පොත" මැයින් අරමුදලේ මෙහෙයුම් කටයුතු පිළිබඳ අත්පොතක් ද ප්‍රකාශයට පත්කරන ලදී.

6.3 කුසලතා සංවර්ධනය

සේවා මණ්ඩල කුසලතා සංවර්ධන වැඩසටහන් ගණනාවක් 2005 වසර තුළ දී ක්‍රියාවට නංවන ලදී. දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වලින් ලබාගත් දැනුම විවිධ සම්මන්ත්‍රණ හා වාර්තා මාර්ගයෙන් සෙසු අය සමග හුවමාරු කරගන්නා ලද අතර මෙසේ ලබාගත් දැනුම උපයෝගී කරගෙන අරමුදලේ කාර්යයන් වඩාත් ඵලදායීව කරගෙන යාම සඳහා අවශ්‍ය වටපිටාවක් සකසා දීමට කළමනාකාරිත්වය සැමවිටම වගබලා ගන්නා ලදී. වසර දෙකක සාර්ථක පුහුණුවකින් පසුව තරුණ වෘත්තිකයන් 13 දෙනෙකු අරමුදල් කළමනාකරණ අංශයෙහි විවිධ ඒකකයන් වෙත අනුයුක්ත කරන ලදී. මෙම සියළු කුසලතා සංවර්ධනයන්හි අරමුණ වූයේ කුසලතා සපිරුණු සේවකයන් පිරිසක් බිහිකිරීම තුළින් සේවා විශිෂ්ටතාව අරමුදල තුළ ගොඩනැගීමයි.

6.4 නිවාස ණය පහසුකම්

1988 වර්ෂයේ දී සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වෙත හඳුන්වා දෙන ලද නිවාස ණය පහසුකම් වැඩ පිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. 2005 වර්ෂය තුළ දී සේ.අ.අ. විසින් රුපියල් දශ ලක්ෂ 2,766 ක් වූ අනුමත ණය මුදලක් වෙනුවෙන් සාමාජික ශේෂ සහතික 14,600 ක් නිකුත් කරන ලදී. පළමු ණය මුදල සාර්ථකව ගෙවා නිමකළ සාමාජිකයන්ට දෙවන ණය සඳහා ද ඉල්ලුම් කළ හැක. කෙසේ වෙතත්, මේ සම්බන්ධව වඩා වැදගත්ම නිරීක්ෂණය වන්නේ, ණය දෙන ආයතන විසින් ගෙවීම් පැහැර හැරීම වෙනුවෙන් සියයට 36 ක් වැනි ඉහළ දඩ පොලියක් අය කල ද, සාමාජිකයන් වැඩි වශයෙන් ගෙවීම් පැහැර හැරීමට යොමුවන බවයි. දඩ පොලිය සහ හිඟ වාරික සියල්ල සාමාජිකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් අයකර ගෙන ණය දෙන ආයතන වෙත ගෙවීමට අරමුදල බැඳී ඇති නිසා ගෙවීම් පැහැර හරින සාමාජිකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂ සීඝ්‍ර ලෙස බාධනයකට ලක්වනු ඇත. තවද, මෙසේ ගෙවීම් පැහැර හරින්නන් දෙවන ණය සඳහා හිමිකම් නොලබන අතර, ශ්‍රමෝද නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 4 ක පහසු පොලියට නිවාස ණයක් සඳහා හිමිකම් පෑමේ අයිතිය ද අහිමි වේ. නිවාස ණය පිළිබඳ විස්තර අංක II -5 සංඛ්‍යා සටහනේ දක්වේ.



II - 4 රූප සටහන
භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළෙඳපොළ ඵලද අනුපාතිකයේ වෙනස්වීම

6.5 ශ්‍රමෝද නිවාස ණය යෝජනා ක්‍රමය

විශේෂිත වූ නිර්ණායක කීපයක් සපුරාලීම මත සේ.අ.අ. සාමාජිකයන් හට උපරිමය රු.300,000 කට යටත්ව වාර්ෂිකව සියයට 4 පොලී අනුපාතයට "ශ්‍රමෝද" නමින් නව නිවාස ණය යෝජනා ක්‍රමයක් කම්කරු සබඳතා හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2005 දෙසැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. මෙහිදී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC) සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) යන මූල්‍යායතන ණය පහසුකම් සඳහා සහභාගී ආයතන ලෙස කටයුතු කරති. මෙම මූල්‍යායතන විසින් අදාළ සාමාජිකයින්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව අගය කර ණය මුදල ලබා දෙනු ඇත. ණය ආපසු ගෙවීම පැහැර හැරීමක දී අදාළ ණය දෙන ආයතන විසින්, ඇපයට තබා ඇති දේපල අත්පත් කරගැනීමේ හැකියාව පවතින අතර, සේ.අ.අ. මගින් කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබෙ යි. කෙසේ වෙතත්, සේවක අර්ථසාධක අරමුදල ඇපයට තබා නිවාස ණය ලබාගෙන ගෙවීම් පැහැර හැර ඇති සාමාජිකයන් ශ්‍රමෝද ණය යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් නොලබති. මෙම ණය යෝජනා ක්‍රමය තුළින් අරමුදලේ සාමාජිකයන් හට සියයට 4 ක් වැනි සහනදායී පොලී අනුපාතයකට දේපල හිමිකම් ලැබීමට ඉඩප්‍රස්ථාව සලසා දෙනු ලබන අතරම, සාමාජික ශේෂය ඇපයට තබා ලබාගත් නිවාස ණය ගෙවීම් පැහැර හැරීම් සංඛ්‍යාව අඩු කිරීමට ද අපේක්ෂිත වේ.

II - 5 සංඛ්‍යා සටහන
සේ.අ.අ. සාමාජිකයන් සඳහා ඇති නිවාස ණය පහසුකම්

වර්ෂය	නිකුත් කරන ලද සාමාජික ශේෂ සහතික (සංඛ්‍යාව)	අනුමත ණය ප්‍රමාණය(රු. දශ ලක්ෂ)	ගෙවීම පැහැර හරින ලද නිවාස ණය (සංඛ්‍යාව)	ගෙවීම පැහැර හරින ලද නිවාස ණය සඳහා සේ.අ.අ. විසින් ගෙවන ලද ප්‍රමාණය (රු.දශ ලක්ෂ)
2000	12,938	1,648	19,944	262
2001	16,066	2,091	24,202	381
2002	19,502	2,673	31,574	541
2003	18,689	2,792	40,085	670
2004	14,307	2,452	43,108	735
2005	14,600	2,766	47,000*	750*

*ඇස්තමේන්තු

මූලය : සේ.අ.අ.

6.6 ආයෝජන කටයුතු සහ ප්‍රතිලාභ

සමාලෝචිත වර්ෂය තුළ දී අරමුදලේ සමස්ත ආයෝජන කළඹ සියයට 12.5 ක වර්ධනයක් වාර්තා කළ අතර, එහි වටිනාකම 2005 වර්ෂය අවසාන වනවිට රුපියල් බිලියන 405 ක් විය. පසුගිය වර්ෂ 08 ක කාලය තුළ පැවති උපනතියට අනුකූලව, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන තවදුරටත් වර්ධනය වූ අතර 2005 වර්ෂය අවසනට ඒවායේ මුළු වටිනාකම සමස්ථ ආයෝජන වලින් සියයට 83 ක් විය. මෙම අගය පසුගිය වර්ෂයේ සටහන් වූයේ සියයට 77 ක් ලෙසිණි. මීට සමගාමීව, සමාලෝචිත වර්ෂයේ දී රජයේ රුපියල් සුරැකුම්පත්වල සිදුකල ආයෝජනය සියයට 20 සිට සියයට 14 දක්වා පහළ වැටිණ. 2005 වර්ෂය අවසානයේ දී අරමුදලේ සමස්ත ආයෝජනයෙන් සියයට 97.8 ක් පමණ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබුණි.

සමස්ත ආයෝජනවලින් වැඩි කොටසක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබීම හේතුවෙන් සේ.අ. අරමුදලේ සමස්ත ආයෝජන ආදයම සහ සාමාජිකයන් සඳහා ගෙවනු ලබන පොලී අනුපාතිකයන් සඳහා රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොළ පොලී අනුපාතයන් බලපානු ලබයි.

2004 හා 2005 යන වසරවලදී භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළෙඳපල පොලී අනුපාතිකය සියයට 8 - 11 ක් වැනි පරාසයක පැවතුනි. කෙසේ වෙතත්, මෙම පොලී අනුපාතයන්, 2001 හා 2002 වර්ෂවලදී පැවති පොලී අනුපාතිකයන් වූ සියයට 15 - 22 ත් අතර අගයන්ට සාපේක්ෂව, සැලකිය යුතු පහළ මට්ටමක පැවතුනි. මෙම තත්ත්වය යටතේ අරමුදලේ ආයෝජන මත අපේක්ෂිත ඉපයුම් අනුපාතයන්ගේ ද පහත වැටීමක් සිදුවිය.

කෙටිකාලීන උච්චාවචන මධ්‍යයේ වුවද, 2001 වර්ෂයේ දී ආරම්භ වූ කොටස් වෙළෙඳපොළෙහි වර්ධනය 2005 වර්ෂයේ ද අඛණ්ඩව පැවැතිණ. 2005 නොවැම්බර් මැද භාගයවන විට සමස්ත කොටස් මිල දර්ශකය වාර්තාගත වැඩිම අගය වූ ඒකක 2,551 දක්වා ඉහළ ගියේය. 2005 අග භාගයවන විට සාම ක්‍රියාදාමය කෙරෙහි වූ තාවකාලික පසුබෑම හේතුවෙන් සියයට 27 කින් පහළ ගිය සමස්ත මිල දර්ශකය 2006 මුල් කාර්තුවවන විට යථාතත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරන ලදී. කෙටිකාලීන ලාභ උපයා ගන්නා අතරම ලාභදායී දිගුකාලීන ආයෝජනයන් තෝරා ගැනීමේ අවස්ථාවක් ද මෙම කාලච්ඡේදයේ දී සේ.අ.අරමුදලට ලැබුණි. 2005 වසර තුළ දී අරමුදලේ කොටස් වෙළෙඳපොළ ආයෝජනයන් විසින් රුපියල් දශලක්ෂ 908 ක උපලබ්ධි ආදායමක් වාර්තා කරන ලද අතර, මෙය කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය ආයෝජනයෙන් සියයට 39 ප්‍රතිලාභ අනුපාතයක් පෙන්නුම් කරන ලදී. (සංඛ්‍යා සටහන් අංක II-6). 1998 සිට 2005 දක්වා ආයෝජන කාලසීමාව තුළ සේ.අ.අ. එහි කොටස් වෙළෙඳපොළ ආයෝජනයන්ගෙන් සියයට 23 ක ප්‍රතිලාභයක් උපලබ්ධි කරගත හැකි විය. කෙසේ වුවත්, කොටස් වෙළෙඳපොළ ආයෝජනයන් අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 0.7 ක් තරම් සුළු ප්‍රතිශතයක් විය.

II - 6 - සංඛ්‍යා සටහන

සේ.අ.අ. කොටස් වෙළඳපල ආයොජන කළඹෙහි ප්‍රතිලාභ 2004 - 2005

රු. දශ ලක්ෂ

අයිතමය	2004	2005
සාමාන්‍ය ආයෝජන කළඹ	1,064	2,335
මුළු ලාභාංශ ආදායම	112	91
මුළු ප්‍රාග්ධන ලාභය	318	817
මුළු ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ	**430**	**908**

මූලය : සේ.අ.අ

වෙළෙඳපොළ සාධක හේතුවෙන් රජයේ සුරැකුම්පත්-වලින් උපලබ්ධි කරගත හැකි වූ ප්‍රාග්ධන ලාභය 2004 වර්ෂයට සාපේක්ෂව 2005 වර්ෂයේ දී පහත වැටිණි. කෙසේ වෙතත්, කොටස් වෙළෙඳපොළ ආයෝජනයන්ගෙන් උපයාගත් ප්‍රාග්ධන ලාභය වූ රුපියල් දශ ලක්ෂ 817 ක් හේතුවෙන් 2005 වසර තුළ දී අරමුදල විසින් උපයාගත් මුළු ප්‍රාග්ධන ලාභය රුපියල් බිලියන 1,591 ක මට්ටමක පවත්වාගෙන යාමේ හැකියාව ලැබුණි.

6.7 සමස්ත සාමාජික ගිණුම් ශේෂ මත 2005 සඳහා පොලී අනුපාතිකය

සේ.අ.අ. සමස්ත සාමාජික ගිණුම් ශේෂය සියයට 12 ක වර්ධනයක් වාර්තා කළ අතර, 2005 වර්ෂය සඳහා පොලී අනුපාතිකය වන සියයට 9 ක් ගිණුම්ගත කිරීමෙන් අනතුරුව වර්ෂය අගට රුපියල් බිලියන 418 ක අගයක් පෙන්වන ලදී. ව්‍යවස්ථාපිතව වර්ෂය අගදී සාමාජික ශේෂ මත පොලී අනුපාතිකය ප්‍රකාශ කෙරේ. මේ අනුව සියයට 9.13 ක සඵල පොලී අනුපාතිකයක් සාමාජිකයන්ට හිමිවන අතර, මෙය වාණිජ බැංකුවල සාමාන්‍ය තැන්පතු අනුපාතය වූ සියයට 5.64 ට වඩා සියයට 3.49 කින් ද සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතය වූ සියයට 8.26 වඩා සියයට 0.87 කින් ද වැඩි අගයක් ගන්නා ලදී.

සේ.අ.අ. විශේෂිත සංඛ්‍යාන විස්තර සංඛ්‍යා සටහන් අංක II - 8 මගින් දක්වේ.

II - 7 සංඛ්‍යා සටහන

සේ.අ.අ.: 2004 හා 2005 වර්ෂවලදී ද්විතීය වෙළෙඳපොළ කටයුතු

රු. දශ ලක්ෂ

අයිතමය	මිලදී ගැනීම්**		විකිණීම් **		ප්‍රාග්ධන ලාභ	
	2004	2005	2004	2005	2004	2005
භාණ්ඩාගාර බැඳුම්කර	13,311	5,188	20,094	11,433	1,225	774
භාණ්ඩාගාර බිල්පත්	2,572	196	6,634	381	5	0.12
ව්‍යාපාර කොටස්	824	2,703	380	1,628	318	817
එකතුව	**16,707**	**8,087**	**27,108**	**13,442**	**1,548**	**1,591**

** පිරිවැය වට්නාකම අනුව   මූලය : සේ.අ.අ

II - 8 - සංඛ්‍යා සටහන

සේ.අ.අ.: ප්‍රධාන තොරතුරු

අයිතමය	2004	2005
සමස්ත ගිණුම් සංඛ්‍යාව	10,307,477	10,778,876*
- වර්තමානයේ දායක මුදල් එවන ගිණුම්	1,973,601	2,045,000*
- වර්තමානයේ දායක මුදල් නොඑවන ගිණුම්	8,333,876	8,733,876*
දායක මුදල් එවන සේවායන් සංඛ්‍යාව	53,567	56,067*
වාර්ෂික දායක මුදල් ලැබීම් (රු.දශ ලක්ෂ.)	23,330	27,315
ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රු.දශ ලක්ෂ.)	16,617	17,024
ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව	98,666	93,841
සමස්ත ආයෝජන කළඹ (රු.බිලියන)	360	405
රජයේ සුරැකුම්පත් ආයෝජන, සමස්ත ආයෝජන කළඹේ ප්‍රතිශතයක් ලෙස (%)	98.2	97.8
පෞද්ගලික අංශයේ ආයෝජන, සමස්ත ආයෝජන කළඹේ ප්‍රතිශතයක් ලෙස (%)	1.8	2.2
සාමාන්‍ය ආයෝජන කළඹ මත උපලබ්ධි වූ ප්‍රතිලාභ අනුපාතිකය (%)	11.56	10.92
සාමාජිකයන්ගේ සමස්ත ගිණුම් ශේෂය (රු.බිලියන)	373	418
සමස්ත දළ ආදායම (රු.දශ ලක්ෂ.)	39,315	41,818
ආදායම් බදු (රු.දශ ලක්ෂ)	4,735	3,201
මුළු පරිපාලන වියදම් (රු.දශ ලක්ෂ.)	360	418
දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස මුළු පරිපාලන වියදම් (%)	0.9	0.9
සාමාජික ශේෂ මත ගෙවූ වාර්ෂික පොලී අනුපාතිකය (%)	9.50	9.00
සාමාජික ශේෂ මත ගෙවූ සඵල පොලී අනුපාතය (%)	9.59	9.13

*තාවකාලික   මූලය : සේ.අ.අ

7. විනිමය පාලන

විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කර්තව්‍ය වනුයේ රටතුලට සහ රටෙන් පිටතට සිදුවන විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් කළමනාකරණය හා මෙහෙයවීමයි. 2005 වර්ෂය තුළදී ජංගම ගනුදෙනුවලට සහ ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදල සියලුම විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම්, බලයලත් වෙළෙඳුන් ලෙස පත්කර ඇති වාණිජ බැංකු හරහා සීමාවකින් තොරව ඔවුන්ගේ අභිමතය පරිදි තිසි පරීක්ෂාවෙන් මුද්‍ර හැරිම නොකඩවා කරගෙන යනු ලැබීය. බලයලත් වෙළෙඳුන්ට අමතරව, මුදල් මාරු කරන්නන්, සංචාරක හෝටල් හිමිකරුවන්, සංචාරක නියෝජිතයන් හා තීරු බදු රහිත සාප්පු හිමිකරුවන් තම නිශ්චිත කටයුතු වන මුදල් මාරු කිරීම දිගටම කරගෙන යනු ලැබිණි. මෙම කාර්යයන්ට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි බාරගැනීම සහ හුවමාරු කිරීම, සංචාරක චෙක්පත් සහ මුදල් නෝට්ටු වශයෙන් විදේශ විනිමය නිකුත් කිරීම, විදේශිකයන් වියදම් නොකළ ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල්වලට පරිවර්තනය කිරීමද ඇතුලත් වේ. 2005 වර්ෂයේදී විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් එහි කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතුවල කොටසක් ලෙස බලයලත් වෙළෙඳුන් සහ සීමිත පරිදි විදේශ විනිමය ගනුදෙනු කරන්නන් සඳහා මෙහෙයුම් උපදෙස් සහ මග පෙන්වීම් උපදෙස් නිකුත් කිරීම දිගටම කරගෙන යනු ලැබූ අතර ඔවුන්ගේ විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ මෙහෙයුම් හා පරීක්ෂණ බාහිර සහ අභ්‍යන්තර වශයෙන් කරගෙන යන ලදී. විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය කළ පුද්ගලයන්ට මෙන්ම සංස්ථාපිත හා සංස්ථාපිත නොකළ ව්‍යාපාර ආයතන සඳහා දඩ නියම කිරීමද කරගෙන යනු ලැබීය. මෙයට අමතරව ශ්‍රී ලාංකික සමාගම් විදේශයන්හි කරන ආයෝජන, විදේශ විනිමය ණයට ගැනීම් සහ වෙනත් රටවලට විගමනය වන ශ්‍රී ලාංකිකයන්ගේ පැවරුම් වැනි ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අවසර ලබාදීම දෙපාර්තමේන්තුව මගින් නොකඩවා කරගෙන යනු ලැබීය. විදේශ විනිමය ගෙවීම් කළහැකි කාර්යන් පිළිබඳව යම් සැකයක් ඇතොත් එය දුරු කිරීමටත්, කාඩ්පත් දරන්නන් තමා කරන ගෙවීම් පිළිබඳව වගකිවයුතු බවට දැනුවත් කිරීමටත් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් නිකුත් කරනු ලබන බැංකු සමඟ පැවති සාකච්ඡාවලින් පසුව විනිමය පාලන දෙපාර්තමේන්තුව හඳුන්වා දෙනු ලැබූ මෙහෙයුම් යෝජනා ක්‍රමය, 2005 වසරේදී තවත් වර්ධනයක් පෙන්නුම් කරන්නක් විය. මේ පිළිබඳව විනිමය පාලන පනත යටතේ නිවේදනයක් අංක.1411/5 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙය විශාල පරිමාණයෙන් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් අවභාවිතා කරමින් පිරමිඩ ජාලීය අලෙවිකරණ ක්‍රමයන්ට අන්තර්ජාලය මගින් කරන ලද ගෙවීම් පිළිබඳව අනාවරණය කරගැනීමේ ප්‍රතිඵලයක් විය.

7.1 2005 වර්ෂයේ සිදු වූ ප්‍රධාන වර්ධනයන්

2005 වසරේදී රටේ විදේශ විනිමය කළමනාකරණ ක්‍රමයෙහි ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබීය. මේ අතර වඩාත් වැදගත් වන්නේ අපනයන ඉපයීම් ලංකාවට ගෙන ඒම පිළිබඳව මෙහෙයුම් ක්‍රමයක් හඳුන්වා දීමයි. මේ අනුව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සහ ලියාපදිංචි නොවූ අපනයනකරුවන් 3,000 ක් ආවරණය වන පරිදි ඉතා සූක්ෂම මට්ටමේ සමීක්ෂණයක් මගින් අපනයන ඉපයීම් පිළිබඳව තොරතුරු ලබාගන්නා ලදී. 2005 වර්ෂය තුළදී, සියලුම රාජ්‍ය නොවන සංවිධාන විසින් රට තුළ කරගෙන යනු ලබන සමාජ සංවර්ධන සහ සහන කටයුතු සඳහා ලැබෙන ආමුඛ ප්‍රේෂණ මුදහැරීමේ ගිණුමක් ලෙස "පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම" නමින් විශේෂිත රුපියල් ගිණුමක් හඳුන්වා දෙන ලදී. මෙම ගිණුම්වලට ලැබෙන අරමුදල් ප්‍රමාණයන් නියමිත පරිදි පුවත්පත් නිවේදන සහ විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. විනිමය පාලන තවදුරටත් නිදහස් කරමින් ගුවන් සමාගම්වලට තම ගුවන් ප්‍රවේශ පත්‍රවල මිල ගණන් එ. ජ. ඩොලර් වලින් නියම කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. අපනයන අංශය සඳහා අතිරේක පෙළඹවීමක් ලෙසින්, වක්‍ර අපනයනකරුවන්හට සෘජු අපනයනකරුවන් විසින් කෙරෙන ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් ලබාගැනීම සඳහා "වක්‍ර අපනයනකරුවන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම" යනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හඳුන්වා දෙනු ලැබිණ.

අධීක්ෂණ සහ රෙගුලාසිගත කිරීමේ කටයුතු යටතේ මුදල් හුවමාරුකරන්නන් පත් කිරීම පිළිබඳව අලුත් නිර්ණායකයන් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව ඔවුන්ගේ මූල්‍ය තත්ත්වයන් වර්ධනය කිරීමේ අරමුණින් මෙම ක්ෂේත්‍රයට අලුතින් ඇතුළුවන සහ දැනට සිටින මුදල් හුවමාරු කරන සමාගම්වල ප්‍රාග්ධන අවශ්‍යතාවය දශ ලක්ෂ 1 සිට දශ ලක්ෂ 10 දක්වා වැඩි කරන ලදී. තවද 2005 වසරේදී විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් දරන්නන්ට ඔවුන්ගේ කාඩ්පත් මගින් කිරීමට අවසර දී ඇති විදේශ විනිමය ගෙවීම් සහ අනේවාසික ආයතනවලට ඔවුන්ගේ කාඩ්පත් මගින් අවසර ලබා දී ඇති ගෙවීම් සහ එම ගෙවීම්වල වගකීම දැරිය යුතු බවට කාඩ්පත් දරන්නන් දැනුවත් කිරීම සඳහා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

7.2 ප්‍රාග්ධන ගනුදෙනු

(අ) ආයෝජන

2005 වර්ෂය තුලදී ශ්‍රී ලාංකිකයන් විසින් විදේශයන්හි කරන ලද ආයෝජන සහ අනේවාසිකයන් විසින් ශ්‍රී ලංකාව තුල කරන ලද ආයෝජන සඳහා පැවැති විනිමය පාලන රෙගුලාසිවල කිසිදු වෙනසක් නොවීය. ශ්‍රී ලංකාව තුල කෙරෙන සෘජු විදේශීය ආයෝජන සඳහා පහසුකම් සලසන්නා ලෙස ආයෝජන මණ්ඩලය තවදුරටත් කටයුතු කරන ලදී. ශ්‍රී ලාංකික සමාගම් විදේශයන්හි කරන ආයෝජන සඳහා ඉදිරිපත් කරන යෝජනා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් ඇගයීමෙන් පසුව එම ආයෝජන වලින් ඇති ප්‍රතිලාභ මත අදළ නිර්දේශ සමග ගරු මුදල් අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලැබිණ. 2005 වර්ෂයේ දී, අනුබද්ධ ව්‍යාපාරවල, පූර්ණ අයිතිය සහිත උප සමාගම්වල සහ විදේශීය ශාඛා කාර්යාලවල ඇමරිකානු

එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 38.4 ක ආයෝජනයක් කිරීම සඳහා ශ්‍රී ලාංකික සමාගම් පහලවකට අවසර දෙන ලදී.

(ආ) විදේශ ව්‍යවහාර මුදල් ණයගැනීම

විනිමය පාලන පනතින් සම්පූර්ණයෙන්ම නිදහස් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතෙහි 17 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද සමාගම් හැර අනෙකුත් නේවාසික සමාගම් විසින් විදේශීය ණය ලබා ගැනීමේදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල මූල්‍ය ආයතන දෙකකට සහ නේවාසික සමාගම් දෙකකට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 22.3 ක මුදලක් ණය වශයෙන් ලබා ගැනීමට විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අවසර දෙන ලදී.

7.3 වෙළෙඳ ගනුදෙනු

විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් පදනම මත ගෙවීම් කරන ලද භාණ්ඩ මෙරටට ගෙන එන ලද්දේ යැයි තහවුරු කර ගැනීම සඳහා ඒ පිළිබඳ මෙහෙයුම් තවදුරටත් කරගෙන යන ලදී. 2005 වර්ෂය තුළදී වෙළෙඳ ගනුදෙනු වලට අදාළව කැපී පෙනෙන වෙනසක් වූයේ වෙළෙඳ, වාණිජ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් අංක 1393/21 දරණ 2005/5/20 දිනැති රජයේ විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද රෙගුලාසි මගින් අංක: 1022/06 දරණ 1998/04/08 දිනැති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද රෙගුලාසි 2 (i) (ඇ) යටතේ පනවන ලද ආනයන සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවීම එ. ජ. ඩොලර් 7,500 සිට එ. ජ. ඩොලර් 10,000 දක්වා වැඩි කිරීමයි.

7.4 භාණ්ඩ නැව්ගත කරන්නන් ලියාපදිංචි කිරීම සහ විදේශ විනිමය ගනුදෙනු සඳහා බලපත්‍ර නිකුත් කිරීම

භාණ්ඩ නැව්ගත කරන්නන් ලියාපදිංචි කිරීම, සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා සංචාරක නියෝජිතයන් වෙත බලය පැවරීම සහ විදේශ මුදල් මාරු කරන්නන්, හෝටල්, තීරුබදු රහිත සාප්පු සහ සංචාරක නියෝජිතයන් වැනි අනෙකුත් ආයතනවලට විදේශීය මුදල් භාර ගැනීම සඳහා අවසර පත් නිකුත් කිරීම විනිමය පාලන දෙපර්තමේන්තුව විසින් නොකඩවා සිදුකරගෙන යන ලදී.

(අ) භාණ්ඩ නැව්ගත කරන්නන් ලියාපදිංචි කිරීම

2005 වර්ෂය තුළදී අළුතෙන් භාණ්ඩ නැව්ගත කරන්නන් හතලිස් දෙදෙනෙකු (42) ලියාපදිංචි කිරීමත් සමඟ වසර අවසාන වනවිට ලියාපදිංචි කළ භාණ්ඩ නැව්ගත කරන්නන්ගේ සංඛ්‍යාව 173 ක් විය. පසුගිය වර්ෂය හා සසඳ බලන විට 2005 වර්ෂයේදී භාණ්ඩ නැව්ගත කරන්නන්ගේ ලියාපදිංචිවීම ඉහළයෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1972 අංක 10 දරන නැව් නියෝජිතයන් සඳහා බලපත්‍ර දීමේ පනතේ 10 වැනි වගන්තිය සමඟ කියවෙන 3 වැනි වගන්තියට අනුව ගරු වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමා විසින් අංක 1402/19 දරණ හා 2005/07/22 දිනැති ආණ්ඩුවේ විශේෂ ගැසට් නිවේදනයෙන් ශ්‍රී ලංකාවේ භාණ්ඩ නැව් ගත කරන්නන්/නැව් අයත් නොවන භාණ්ඩ රැගෙන යන්නන් ලෙස කටයුතු කරන සමාගම් සඳහා රෙගුලාසි පනවමින් එම රෙගුලාසි යටතේ නාවික අධ්‍යක්ෂ වෙතින් බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පැනවීම නිසාය. විනිමය පාලන දෙපාර්තමේන්තුව, නැව් හා ගුවන් ගමන් නියෝජිතවරුන් මෙන්ම භාණ්ඩ නැව්ගත කරන්නන් විසින් පවත්වා ගෙන යනු ලබන රුපියල් ගිණුම්වල බැර හා හර ගනුදෙනු පිළිබඳ මෙහෙයුම් කටයුතු නොකඩවා සිදු කරන ලදී.

(ආ) මුදල් හුවමාරුකරන්නන්ට බලපත්‍ර නිකුත් කිරීම

මුදල් හුවමාරුකරන්නන් පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 1999 දී හඳුන්වාදෙනු ලැබූ නිර්ණායකයන් යටතේ විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් මුදල් හුවමාරු කිරීමේ කටයුතුවල නිරතවීම සඳහා ලංකාවේ ලියාපදිංචි වූ සමාගම් 13 කට 2005 වසරේදී අලුතින් අවසරපත් නිකුත් කරන ලදී. මෙම නිර්ණායකයන් 2005 මැයි මාසයේ සිට වෙනස් කරන ලද අතර ඒ අනුව මුදල් හුවමාරු කිරීමේ සමාගමක් ලෙස පත් කිරීම සඳහා සමාගමේ ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 1 සිට රුපියල් දශ ලක්ෂ 10 දක්වා වැඩි කරන ලදී. නව නිර්නායකයන් හඳුන්වා දීමෙන් පසුව අයදුම් පත් 5 ක් ලැබුණු අතර එයින් අලුත් නිර්නායකයන් යටතේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ එක් අයදුම්පතක් අනුමත කරන ලදී. ඒ අනුව 2005 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන විට බලයලත් මුදල් හුවාමරු කරන්නන්ගේ ගණන 62 ක් විය. ඔවුන් විසින් 2005 වසර තුළදී මිලදීගත පසුව බලය ලත් වෙළෙඳුන්ට බාරදුන් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඩොලර් දශ ලක්ෂ 70 ක් විය.

7.5 මෙහෙයුම්

1994 වසරේ විනිමය පාලනය ලිහිල් කිරීමේ සිට බලය ලත් විනිමය ගනුදෙනුකරුවන් හා අනුමත සංචාරක නියෝජිතයන්ට, නිසි පරීක්ෂාවෙන් තම අභිමතය පරිදි විදේශීය විනිමය සඳහා කරනු ලබන ඉල්ලීම්වල සත් භාවය සැලකිල්ලට ගෙන තමා සෑහීමකට පත් වන්නේ නම් ජංගම ගිණුම් ගනුදෙනු සඳහා සීමාවකින් තොරව විදේශ විනිමය මුද හැරීම සඳහා අවසර දී ඇත. බලයලත් වෙළෙඳුන් සහ අනුමත සංචාරක නියොජිතයන් තමන් විසින් අලෙවි කරන ලද සහ මිලදී ගත් විදේශීය මුදල් පිළිබඳ විස්තර විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත සැපයීම යාවත්කාලීනව සිදුකළ යුතුය. එක පුද්ගලයකුට එ. ජ. ඩොලර් 5,000 කට වඩා විදේශීය විනිමය අලෙවි කළහොත් ඒ බැව් දෛනිකව ද, එ. ජ. ඩොලර් 5,000 ට අඩු විදේශීය විනිමය අලෙවිය පිළිබඳව සතිපතා ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. විදේශීය අරමුදල් පැවරුම් කාඩ්පත් මගින් නිදහස් කළ විදේශ විනිමය සම්බන්ධයෙන් සළකනවිට, එක් පුද්ගලයකු විසින් මාසයක් තුළදී සිදුකර

ඇති ගනුදෙනුවල සමුච්චිත වටිනාකම එ. ජ. ඩොලර් 5,000 ක් ඉක්මවා ඇත්නම් එවැනි ගනුදෙනු වල සවිස්තරාත්මක වාර්තාවක් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් නිකුත් කරන ලද බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතුය. අනුමත නොවූ ප්‍රාග්ධන සංක්‍රාම අනාවරණය කර ගැනීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් අරමුදල් සැපයීම හෝ මුදල් විශුද්ධීකරණය සම්බන්ධයෙන් විදේශීය විනිමය මුදාහැරීම සම්බන්ධව අනාවරණය කර ගැනීම සඳහා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කෙරිණ. දැනට, තම විදේශීය විනිමය හුවමාරු සම්බන්ධයෙන් අදාල තොරතුරු විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් මාර්ගයෙන් සැපයීමේ කටයුතු වාණිජ බැංකුවල ප්‍රධාන කාර්යාල සහ වාණිජ බැංකුවල ශාඛා කාර්යාල කිහිපයක් විසින් අඛණ්ඩව සිදුකරගෙන යනු ලැබේ.

7.6 විමර්ශන කටයුතු

2005 වසරේදී ද පුද්ගලයන් සහ සංස්ථාපිත සමාගම් විසින් විනිමය ආඥා පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය වන අවස්ථා විමර්ශනයට භාජනය කරන ලදී. ඒ අනුව විනිමය ආඥා පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කළ අවස්ථා 29 ක් අනාවරණය කරගත් අතර ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 29.4 ක දඩ මුදල් නියම කෙරිණ. ඉහත සඳහන් මුදලින් රුපියල් දශ ලක්ෂ 28 ක ප්‍රමාණයක් එම වසරේදී දඩ මුදල් වශයෙන් අයකරගෙන ඇති අතර එම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ "විදේශීය විනිමය දඩ මුදල් ගිණුම" ට බැර කරන ලදී. විනිමය පාලන දෙපාර්තමේන්තුවට ලැබුණු තොරතුරු අනුව කොළඹ ව්‍යාපාරික පරිශ්‍රයක සිදුකරන ලද අනුමත නොවූ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශණයක් කරණු ලැබූ අතර, රුපියල් දශ ලක්ෂ 1.6 කට සමාන විදේශීය මුදල් නෝට්ටු සොයා ගැනීමට හැකි විය. එම පරිශ්‍රයේ අයිතිකරුට එරෙහිව අධිකරණය හමුවේ නඩු පවරා ඇත.

8. ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තොරතුරු බෙදාහැරීමේ මධ්‍යස්ථානය වශයෙන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් වෙත තොරතුරු බෙදාහැරීමේ කටයුතුද ඡායාරූපකරණ හා කලාත්මක නිර්මාණ සේවා සැපයුම ද 2005 වසර තුළදී තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අභ්‍යන්තර සංසරණය සඳහා ප්‍රවෘත්ති හා විශේෂාංග සඟරාවක් වන කවුළුව නොකඩවා පළ කරන ලදී. මෙය බැංකු කළමනාකරණයට සහ සේවක මණ්ඩලයට බැංකුවෙහි තොරතුරු හා නිවේදන හුවමාරුව පිණිස උපකාරි වූ අතර, 2005 වසර තුළ කාලීන තේමා ඇතුලත් කලාප 10ක් නිකුත් කර ඇත. දිනපතා යාවත්කාලීන කරනු ලබන ඉතා පුළුල් පරාසයක තොරතුරු ඇතුලත් අභ්‍යන්තර වෙබ් පිටුව පවත්වාගෙන යාම ද අඛණ්ඩව සිදුකරන ලදී. එමගින් බැංකුවේ සේවක මණ්ඩලයට දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය තොරතුරු සහ අනෙකුත් කාලීන ආර්ථික තොරතුරු ලබා ගැනීමට සුවිශේෂී සම්බන්ධතාවක් ලබාදෙන ලදී.

මහජනතාව වෙත තොරතුරු බෙදාහැරීම දෙපාර්තමේන්තුව විවිධාකාරයෙන් සිදුකර ඇත. දෛනික විනිමය අනුපාත, සතිපතා හා මාසික ආර්ථික දත්ත, පාරිභෝගික මිල දර්ශක, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ තොරතුරු, පුවත්පත් නිවේදන 934 ක්, ගැසට් නිවේදන 11ක් සහ ප්‍රචාරක දැන්වීම් 166 ක් 2005 වසරෙහි දී පළකර ඇත. මහජනතාව දැනුවත් කිරීම සඳහා ඔවුන් ඉලක්ක කර ගනිමින් සරල භාෂාවෙන් උපයුක්ත පත්‍රිකා මාලාවක් පල කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු ඇරඹීය. මෙම පත්‍රිකා මාලාවේ පළමු පත්‍රිකා 2 මිල ස්ථායිතාවය හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පිළිබඳව විය. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, කාර්යයන් සහ සංවිධානය පිළිබඳව භාෂා ත්‍රිත්වයෙන්ම පොත් පිංචක් පළකරන ලදී. කාලීන ආර්ථික ප්‍රවනතා හා සංවර්ධනයන් පිළිබඳ ප්‍රවෘත්ති සාකච්ඡා 8 ක් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ සංවිධානය කර ඇත. එමෙන්ම බැංකු අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද ප්‍රසිද්ධ දේශන මාලාව සඳහා මාධ්‍ය සම්බන්ධීකරණය ද දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. ද්වි මාසික ප්‍රකාශනයක් වන සටහන ප්‍රකාශනයෙහි කලාප 6ක්, කාර්තුමය ප්‍රකාශනයක් වන නිව්ස් සර්වේ කලාප 4ක් සහ සටහන සඟරාවේ දෙමළ පරිවර්තනය වන කුරිප්පඩු සඟරාව ද දෙපාර්තමේන්තුව අඛණ්ඩව ප්‍රකාශයට පත්කර ඇත.

මහ බැංකුවේ අරමුණු පිළිබඳව පාසැල් සිසුන් හා ගුරු භවතුන් දැනුවත් කිරීමේ අරමුණින් මිල හා ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම පිළිබඳ වාර්තා වීඩියෝ වැඩ සටහනක් නිර්මාණය කරන ලදී. කොටස් දෙකකින් යුත් වාර්තා වැඩ සටහනක පළමු කොටස මෙය වන අතර දෙවැනි කොටස මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වය පවත්වාගැනීම පිළිබඳව සැකසෙනු ඇත.

දෙපාර්තමේන්තුවෙහි අලෙවි කවුළු මගින් මෙන්ම දිවයින පුරා පිහිටි පොත් අලෙවිසල් ජාලය හරහා ද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අලෙවි කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු සිදු කෙරිනි. පෙර වසරෙහි මෙන්ම කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සඳහා 2005 වසරෙහි ද දෙපාර්තමේන්තුව සහභාගි විය. ඊට අමතරව මහපොළ ප්‍රදර්ශන දෙකකට, විශ්ව විද්‍යාල මගින් සංවිධානය කළ ප්‍රදර්ශනවලට සහ ජාත්‍යන්තර ළමා දිනය සැමරීම සඳහා පැවති ප්‍රදර්ශනයට ද දෙපාර්තමේන්තුව සහභාගි විය. මහ බැංකුවේ ප්‍රකාශන පිළිබඳව මහජනතාව වඩාත් දැනුවත් කිරීමට මේ මගින් හැකි විය.

අධ්‍යාපනික සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පාසැල්වලින් කෙරෙන ඉල්ලීම් අනුව අනෙකුත් දෙපාර්තමේන්තු ද සහභාගිකර ගනිමින් විවිධ මාතෘකා යටතේ දේශන හා සම්මන්ත්‍රණ පැවැත්වීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබීය. පාසැල් ළමුන් හා ගුරුභවතුන් උදෙසා එවැනි අධ්‍යාපන සම්මන්ත්‍රණ පහක් 2005 වසරෙහි පැවැත්වීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

බැංකු මුද්‍රණාලය මගින් බැංකුවෙහි මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම ද අඛණ්ඩව සිදුකරන ලදී. වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන, නිවුස්සර්වේ, සටහන, කවුළුව සහ මාණ්ඩලික පත්‍රිකා සාමාන්‍ය මුද්‍රණ කටයුතු අතර විය. වර්ෂය තුළ කරන ලද විශේෂ මුද්‍රණ කටයුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, කාර්යයන් සහ සංවිධානය පිළිබඳ පොත් පිංච, මිල ස්ථායීතාවය හා මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය පිළිබඳ පත්‍රිකා සහ පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාව ආදිය විය. මෙම මුද්‍රණ කටයුතු ද ඇතුලත්ව මුද්‍රණ පැවරුම් 306 ක් මුද්‍රණාලය විසින් වසර තුළ සිදුකර තිබේ.

පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය

පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් 2005 වසර තුළදී බැංකු කාර්ය මණ්ඩලය සහ වෙනත් ඉල්ලීම් සඳහා පුස්තකාල සේවා සැපයීම අඛණ්ඩව සිදුකරන ලදී. එහි මුළු පොත්පත් එකතුව 17,194 සිට 18,784 දක්වාත්, වාර්තා 11,887 සිට 12,916 දක්වාත්, සංයුක්ත තැටි 900 සිට 965 දක්වාත්, බඳින ලද සඟරා කාණ්ඩ 944 දක්වාත් වසර තුළදී වර්ධනය විය. බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ඇති පුස්තකාලයේ පොත් එකතුව ද 4,896 සිට 5,045 දක්වා වැඩි විය.

වාර සඟරා 90 කින් සමන්විත Science Direct Database නැමති දත්ත එකතුවට මංගතව (online) සම්බන්ධ වීමට හැකිවීම නිසා එහි භාවිතය පුළුල් විය. මෙ මගින් ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා මිතිය හා මූල්‍ය යන විෂයන් ආවරණය කෙරේ. මේ නිසා වාර සඟරා සඳහා වූ දායකත්වය 195 සිට 172 දක්වා අඩුකර ගත හැකි විය.

මෙම වසර තුළදී Recent Additions, List of Selected Articles, News on Central Banking, News Alert වැනි විද්‍යුත් ප්‍රකාශන සම්පාදනය කළ අතර, ඒවා අන්තඃජාලය (Intranet) හරහා බෙද හැරිනි. බැංකු කාර්ය මණ්ඩලය තුළ විද්‍යුත් පුස්තකාල පහසුකම් භාවිතය ධෛර්යමත් කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 12 ක් දෙපාර්තමේන්තු 11 ක් සඳහා පවත්වන ලද අතර බැංකු හා මූල්‍ය තොරතුරු ජාලයට සම්බන්ධ සහභාගිවන්නන් සඳහා ද වැඩ සටහනක් පවත්වන ලදී.

මුල්ම වරට පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය කියවීමේ මාසය වෙනුවෙන් මිලදීගත් අළුත් ග්‍රන්ථ 400 ක් ප්‍රදර්ශනය කරන ලද අතර මෙම ප්‍රදර්ශනයට බැංකු කාර්ය මණ්ඩලයේ ඉතා අගනා ප්‍රතිචාරයක් ලැබිනි.

බැංකු නිලධාරීන් අතර කියවීමේ රුචිය ප්‍රගුන කරවීම සඳහා "සාර්ථකත්වය උදෙසා කියවීම" (Reading for Success) මැයෙන් තේමා කරගත් සම්මන්ත්‍රණයක් ද පවත්වන ලදී.

9. තොරතුරු තාක්ෂණ

විමසුමට ලක්වූ 2005 වසර තුළදී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අවධානය යොමුවූයේ විශාල වූ මෙහෙයුම් බිඳ වැටීමකදී ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණාත්මක මෙහෙයුම් කටයුතු හැකි ඉක්මණින් නැවත ආරම්භ කිරීම සඳහා ආපද ප්‍රතිසාධන පහසුකම් ශක්තිමත් කිරීම සහ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්කරණය සඳහාය. මීට අමතරව සිය සුපුරුදු කාර්යභාරය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ පහසුකම් ව්‍යාප්ත කිරීමෙහිත්, සේවක මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිපුණතා වර්ධනය කිරීමෙහිත් අඛණ්ඩ දයකත්වයක් තවදුරටත් ලබා දෙන ලදී.

දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවාලන ලද කටයුතු ප්‍රධාන වශයෙන් මෙසේ කැටි කොට දක්විය හැකිය.

(අ) ආපද ප්‍රතිසාධන පහසුකම් සහ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්කරණය/කළමනාකරණය සවිමත් කරලීම.

(ආ) සේවක තොරතුරු තාක්ෂණ නිපුණතා වර්ධනය කරලීම.

(ඇ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කරලීම.

(ඈ) ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා, පරිශීලක දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන වැඩ කටයුතු තවදුරටත් ස්වයංක්‍රීයකරණය කිරීම.

(ඉ) ගෙවීම් පද්ධතිය, පරිගණක ජාල සහ අනෙකුත් තීරණාත්මක උපයෝග (Critical applications) නඩත්තු කරලමින් ඒවායේ යථා පැවැත්ම තහවුරු කිරීම.

(ඊ) තොරතුරු තාක්ෂණ පද්ධතියට ඇති අවදනම් සමීක්ෂණ මගින් හඳුනා ගැනීම සහ එකී මෙහෙයුම් අවදනම් අවම කරගැනීමෙහිලා ප්‍රතිකාරක මිණුම් දඬු හඳුන්වා දීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) කාර්යයන් වර්තමානයේ ඉතාමත් දියුණු ස්වයංකෘත පරිසරයක ක්‍රියාත්මක වීම හේතු කොටගෙන අනාගත මෙහෙයුම් බිඳ වැටීමක දී සිදුවිය හැකි අවදනම් අවම කිරීමෙහිලා අවශ්‍ය ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් සහ දුරස්ථ ආපද ප්‍රතිසාදන අංශ ස්ථාපනය කිරීමේ අවශ්‍යතා හඳුනා ගැනීමට මහ බැංකුවට සිදු විය. තවද, සිදුවිය හැකි හදිසි ආපද (Contingency events) සහ ඒ ඒ ආපදා වලට අනුරූප ප්‍රතිකර්ම හඳුනා ගැනීම සඳහා ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් පිළියෙල කරන ලදී. ආපද ප්‍රතිසාධන කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් 40 කට පමණ ප්‍රමාණවත් ලී බඩු සහ උපකරණ, පරිගණක හා සන්නිවේදන මෙවලම් සැපයීම මගින් ආපද ප්‍රතිසාධන අංශයේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තහවුරු කොට තිබේ. මෙවැනි පරිසරයක් තුළ දී තීරණාත්මක යැයි හඳුනාගනු ලබන ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීමෙහිලා ඊට අදළ කාර්ය මණ්ඩලයට අවශ්‍ය සියලු පහසුකම් සපයා දී ඇත. මහ බැංකුවේ ආපද ප්‍රතිසාධන කාර්ය මණ්ඩලයත්, වාණිජ බැංකු, ප්‍රාථමික වෙළෙඳුන් සහ ජාත්‍යන්තර ගෙවීම් පිළිබඳ අනෙකුත් විදේශීය ආයතනත් සහභාගිත්වයෙන් අත්හද බැලීම් පරීක්ෂාවන් කීපයක් ද සිදු කරන ලදී. ආපද ප්‍රතිසාධන අංශයේ සිට කරණු ලබන මෙවැනි පරීක්ෂණ මෙහෙයුම් මගින් එම කාර්ය මණ්ඩලයට එහි

ඇති පහසුකම් පිළිබඳ සමීපස්ථභාවයක් මෙන්ම උද්ගත වන ආපද අවස්ථාවන්හිදී ස්වකීය වගකීම් හා රාජකාරීන් නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය දනේ හුරුව සහ විශ්වාසනීයභාවය ලබා දෙනු ඇත.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට මෙන්ම රජයේ අනෙකුත් ආයතනවලට අවශ්‍ය තොරතුරු තාක්ෂණයට අදළ මිලදී ගැනීම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන ලදී. පරිගණක පද්ධතියේ ඇති විශ්වාසනීයභාවය තහවුරු කරලීම සඳහා පහත සඳහන් යටිතල පහසුකම් විමසුමට ලක්වූ වසර තුළ දී සිදු කරන ලදී.

(අ) වැඩිවන ඉල්ලුම් ධාරිතාවට සරිලන පරිදි සහ ආපද ප්‍රතිසාධන අංශයේ සිට ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීමට හැකි වන පරිදි පහසුකම් සලසමින් මහ බැංකු ප්‍රාථමික සහ ආපද ප්‍රතිසාධන අංශයන්හි AS/400 *I*-series පරිගණක පද්ධති යාවත්කාලීන කිරීම.

(ආ) අවසර නොලත් පිටස්තර පරිශීලකයන්ට පරිගණක ජාලයට ඇතුල්වීම වැලැක්වීම සඳහා අන්තර්ජාල firewall සහ බාහිර ප්‍රවේශගත firewall ස්ථාපනය කිරීම.

(ඇ) අන්තර්ජාලය හරහා පරිශීලකයන්ට තොරතුරු ලබාගැනීම/ ඇතුලත් කිරීම සඳහාSQL/Web සේවාදයකයන් ස්ථාපනය කිරීම

(ඈ) වෙබ් යෙදුම් ආරක්ෂණය සඳහා මධ්‍යගත තහවුරු පද්ධති Central authentication system ස්ථාපනය කිරීම.

(ඉ) තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම් පද්ධතිය සඳහා භාවිතා වන CAS 2.68 මෘදුකාංගය වඩාත් මිත්‍රශීලී අංගයන්ගෙන් සමන්විත CAS 3.3 දක්වා යාවත්කාලීන කිරීම.

(ඊ) පරිශීලක ආවරණය පුළුල් කිරීම සහ වෙබ් පදනම් යෙදුම් පිළියෙළ කිරීමෙහිලා පහසුකම් සපයමින් අන්තර් ජාල ධාරිතාව 256Mbps සිට 512Mbps දක්වා වැඩි කිරීම.

(උ) උද්ගතවන හදිසි ආපද අවස්ථාවන්හි දී, පුළුල් පැතුරුම් ජාලය මගින් ආපද ප්‍රතිසාධන අංශය වෙත ස්වයංක්‍රීයව සම්බන්ධ වීම සඳහා IPVPN තාක්ෂණය උපයෝගී කර ගැනීම.

මහ බැංකු පරිගණක ජාලය දනට පරිගණක 1,000 කට අධික සෘජු සබඳතාවයකින් යුක්ත වේ. කාර්යාල කටයුතු ස්වයංක්‍රීයකරණයට සහ තොරතුරු කරා පහසුවෙන් ළඟාවීමට අවස්ථාව ලබා දෙමින් මෙකී ජාල පරිසරය විද්‍යුත් තැපැල ලිපිනයන් 900 කින් සහ අන්තර්ජාල පහසුකම් 300 කින් පමණ සමන්විත වේ.

සේවකයන්ගේ තොරතුරු තාක්ෂණ දනුම වර්ධනය කිරීමෙහිලා දයක වෙමින්, ඊට අදළ පාඨමාලා පැවැත්වීම සඳහා බැංකු අධ්‍යයන කේන්ද්‍රය වෙත දෙපාර්තමේන්තුවේ සම්පත්දයකයන් මුදහැරීම තව දුරටත් සිදු කරන ලදී. වැඩි දියුණු කරන ලද ආරක්ෂක උපාංග පිළිබඳව සහ පරිගණක භාවිතයේදී ප්‍රගුණ කළයුතු යහපත් පුරුදු පිළිබඳ මාර්ගෝපදේශන ලබා දෙමින් දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ සම්බන්ධතා නිලධාරීන් සමග නිරන්තර රැස්වීම් පවත්වන ලදී. මෙම වසර තුළ දී හඳුන්වා දුන් තොරතුරු තාක්ෂණ ආරක්ෂක ප්‍රතිපත්ති ලේඛනය පිළිබඳව සේවක මණ්ඩලය දනුවත් කිරීමේ වැඩ සටහන් කිහිපයක් ද දියත් කරන ලදී.

ගනුදෙනු තත්කාලීනව පියවීම සඳහා වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය, නිර්ලේඛන සුරැකුම් පියවීම් පද්ධතිය, භාණ්ඩාගාර ගනුදෙනු සුපරීක්ෂාකාරිත්ව පද්ධතිය (TDRMS) සහ පොදු ලෙජරය යන අංගයන්ගෙන් සමන්විත ගෙවීම් පද්ධතියේ උපරිම පැවැත්ම සාක්ෂාත් කරලමින් එය නඩත්තු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම් වලින් එකක් වෙයි. මෙම වසර තුළ දී එහි සියයට 99.4 උපයෝගීතාවක් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව සමත් විය.

තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම් පියවීම් පද්ධතිය සඳහා මෙතෙක් භාවිතා කරන ලද CAS 2.68 උපයෝග මෘදුකාංග වඩාත් උසස් මුහුණුවරකින් යුත් CAS 3.3 දක්වා යාවත්කාලීන කරන ලදී. මෙම පද්ධතීන් අතර ගනුදෙනු කර ගැනීම සඳහා භාවිතා වන පණිවුඩ හුවමාරු ක්‍රමය වන SWIFT යාවත්කාලීන කරලීම සඳහා ද මෙම නව මෘදුකාංගය අවශ්‍ය විය. ගෙවීම් පද්ධතියේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය තහවුරු කරමින්, එය නඩත්තු කරන්නා වූ මෘදුකාංග සැපයුම්කරුවන් සමඟ සබඳතා පවත්වාගෙන යාමේ වගකීමද දෙපාර්තමේන්තුව දරන ලදී.

දෙපාර්තමේන්තුව මගින් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන සියළු උපාංග, නඩත්තු කටයුතු පහසු කරලීම සඳහා හැකිතාක් දුරට වෙබ් පරිසරයක නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. මෙහි ආරම්භක පියවරක් ලෙසට වාණිජ බැංකු වලින් මහ බැංකුවට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකිවන අයුරින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා මධ්‍යගත තොරතුරු පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙය තව දුරටත් බැංකු නොවන මූල්‍ය කටයුතු සහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවල අවශ්‍යතා සඳහා පුළුල් කිරීමට බලාපොරොත්තු වෙයි. තවද, රජයේ සුරැකුම්පත් මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි (CDS) හිමිකාරත්වයේ වෙනස්කම් පිළිබඳ අර්ථලාභී හිමිකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ද මෙම ක්‍රමය උපයෝගී කර ගන්නා ලදී.

මීට අමතරව බැංකුවේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමේ කාර්යය ඵලදයී කර ගැනීම සඳහා මෘදුකාංග යෙදුම් (APPLICATION SOFTWARE) නිර්මාණ ව්‍යාපෘති කිහිපයක් අරඹන ලදී. ඒවානම්,

(අ) විදේශ ණය ආපසු ගෙවීම.

(ආ) ඩොලර් බැඳුම්කර නිකුතුව.

(ඈ) මුදල් සුරක්ෂිතාගාර අතර සිදුවන හුවමාරුවීම් වාර්තා කිරීම.

(ඈ) අපනයන ඉපැයුම් නිරීක්ෂණ ක්‍රමය.

(ඉ) රජයේ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර නිකුතුව ස්වයංකරණය.

(ඊ) ආපන ශාලා ගබඩා කළමනාකරණය.

(උ) නඩත්තු කටයුතු ගිවිසුම් සහ ගෙවීම් නිරීක්ෂණ ක්‍රමය.

මීට අමතරව අභ්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කරන ලද උපයෝග නඩත්තු කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී. මහ බැංකුවේ ප්‍රධාන පරිගණක පද්ධතියක් වන සේවක අර්ථ සාධක අරමුදල් ජාලය නඩත්තු කරමින් ඊට අදළ මෘදුකාංග සංවර්ධනයටත්, එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් දයක විය.

විමසුමට ලක් වූ 2005 වසර තුළ දී මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය සහ ගෙවීම් පද්ධති සඳහා වන ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම ද හඳුන්වා දෙන ලදී. වෙනස්වන පරිසරයට ප්‍රතිචාර දක්වමින් මෙකී ලේඛන තව දුරටත් යාවත්කාලීන කරන ලද අතර එය මහ බැංකුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් මණ්ඩල අනුමැතිය ද ලබා ගන්නා ලදී. තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායන සැලැස්ම ද දෙපාර්තමේන්තු ක්‍රියාපටිපාටි අත්පොත් ද 2005 වසර තුළ දී පිළියෙල කරන ලදී.

අවදනම් හඳුනා ගැනීමටත්, ඒවා විශ්ලේෂණය කිරීමටත්, ආරක්ෂක තර්ජනයන් අවම කිරීමටත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා බාහිර විශේෂඥ දැනුම ලබා ගන්නා ලදී. ශක්තිමත් කළයුතු අංශයන් හඳුනා ගැනීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ආරක්ෂණය පිළිබඳ සමීක්ෂණයක් 2005 වසර තුළ දී සිදු කරන ලදී.

10. ජාත්‍යන්තර කටයුතු

10. 1 විදේශ විනිමය සංචිත කළමනාකරණය

ශ්‍රී ලංකා රුපියලේ ජාත්‍යන්තර ස්ථායිතාව පවත්වාගෙන යාමත් ප්‍රවර්තන ජාත්‍යන්තර ගණුදෙනුවලදී භාවිතා කිරීමේ හැකියාවත් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව (ජා.ක.දෙ.) රටේ නිල විදේශ විනිමය සංචිතය කළමනාකරණය කරනු ලබයි. එය කරනු ලබන්නේ විදේශ විනිමය සංචිතයෙහි ද්‍රවශීලතාවය හා සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි සැළකිය යුතු ප්‍රතිලාභ ගෙනදෙන මාර්ගවල ආයෝජනය කිරීම තුලිනි. ඉහත කී අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිල ජාත්‍යන්තර සංචිතයෙන් සැළකිය යුතු කොටසක් ද්‍රවශීලතාවයෙන් ඉහළ විදේශ මුදල් වර්ගවල හා කේන්ද්‍රීය සංචිත වන රත්‍රන්වල පවත්වා ගත යුතු යැයි 1949 අංක 58 දරන මුදල් නීති පනතේ සඳහන් කර ඇත.

රටෙහි නිල විදේශ විනිමය සංචිතය ප්‍රධාන වශයෙන් ඉහළ ඇගයීමකට ලක්වූ විදේශීය රාජ්‍ය සුරැකුම්පත්, විදේශීය රාජ්‍ය වගකීම සහිත සුරැකුම්පත් හා රාජ්‍ය නියෝජනය ලත් ආයතනවල හා ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන විසින් නිකුත් කරන සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා, ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ස්ථාවර ආදයම් සුරැකුම්පත් හා මුදල් වෙළෙඳපොළ ආයෝජනයන් විවිධ විදේශ මුදල් වර්ගවලින් කර තිබිණ. මෙකී මුදල් වෙළෙඳපොළ ආයෝජන හා ස්ථාවර ආදයම් සුරැකුම්පත් යන දෙවර්ගයම ඉහළ ඇගයීමකට ලක්වූ ගණුදෙනුකාර පාර්ශවයන් සමඟ පමණක්ම පවත්වාගෙන යන ලදී. 2005 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිත වත්කම් ප්‍රධාන වශයෙන් එ.ජ.ඩොලර්, යූරෝ, ස්ටර්ලින් පවුම්, ඕස්ට්‍රේලියන් ඩොලර් හා රත්‍රන් වලින් සමන්විත විය.

විදේශ සංචිත කළමනාකරණ කමිටුව (වි.සං.ක.ක.) මගින් නිර්දේශ කරන ලදුව මුදල් මණ්ඩලය විසින් අනුමත කළ මෙහෙයුම් උපදෙස්වලට අනුව ජා.ක.දෙ. මගින් ජාත්‍යන්තර සංචිතයෙහි ආයෝජන කටයුතු පවත්වාගෙන යන ලදී. වි.සං.ක.ක යෙහි අනුමැතිය ලත් කලින් තීරණය කරන ලද සැසඳුම් නිර්ණායකයකට අනුව ආයෝජන කටයුතු පවත්වාගෙනයාම සසඳනු ලැබීය. මීට අමතරව අවදානම් දැරීමේ හැකියාව, වත්කම්වල සංයුතිය කලින් සකස් කරගත් සැසඳුම් නිර්ණායකය සහ සංචිත කළමනාකරණ කටයුතුවල සමස්ථ කාර්යක්ෂමතාවය වි.සං.ක.ක. මගින් නිරන්තර විමර්ශනයට භාජනය කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල් ආශ්‍රිත දේශපාලනික, සමාජමය වාතාවරණය, ආර්ථික මූලිකාංග සහ ඒ අනුව ප්‍රධාන මුදල් වර්ගවල, පොලී අනුපාතිකයන්ගේ සිදුවිය හැකි වෙනස්වීම් ද සැළකිල්ලට භාජනය කරමින් නියි අවස්ථාවන්හිදී විදේශ විනිමය සංචිතයේ සැකැස්ම සහ එක් එක් විදේශ මුදල් වර්ගවල ඇති ආයෝජන ප්‍රමාණයෙහි අවශ්‍ය වෙනස්කිරීම් ද ජා.ක.දෙ. මගින් සිදු කරනු ලැබීය. වත්කම්වල සුරක්ෂිතභාවය, ද්‍රවශීලතාවය හා ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව සැළකිල්ල යොමු කරමින් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ සුදුසුකම් සැපිරූ ගනුදෙනුකාර පාර්ශවයන් හරහා සියළුම ආයෝජනයන් මෙහෙයවනු ලැබීය. විදේශ විනිමය සංචිතයෙහි ආයෝජන සංයුතිය තීරණය කිරීමේදී බැංකුවේ ණය සේවා අවශ්‍යතාවයන් හා ආදයම් ඉපයීමේ හැකියාව ද සැළකිල්ලට ගන්නා ලදී. ආයෝජනයෙහි වටිනාකම ආරක්ෂා කිරීමට හා පොලී අනුපාත උච්චාවචනයන් නිසා නිරන්තරයෙන් බලපෑ හැකි වෙළෙඳපොළ අවදානම අවම කිරීම සඳහා සුදුසු අවස්ථාවන්හිදී ආයෝජන සංයුතිය ද වෙනස්කම්වලට භාජනය කරන ලදී. විදේශීය විනිමය සංචිත කළමනාකරණ කටයුතුවලින් 2005 වර්ෂයේදී උපයාගත් ශුද්ධ විදේශීය ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 77.0 ක් (ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 7,603) විය. මෙය 2005 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 73.1 ට වඩා වැඩිවූ අතර එම තත්ත්වය පොලී අනුපාතිකයන්ගේ අඛණ්ඩ ඉහළයාමත් සමඟ මුලදී කළ ආයෝජනවල ඉපැයීම් සාපේක්ෂව අඩුවීම හමුවේ අත්පත් කරගත හැකිවීම විශේෂිත වූවකි. ජා.ක.දෙපාර්තමේන්තුවේ ආයෝජන හා ඊට අදළ අනෙකුත් කටයුතුවල ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම විද්‍යුත් ක්‍රමයට අවතීර්ණ වීමද, මෙම

වර්ෂය තුළදී සිදු විය. තවද, සංචිත කළමනාකරණ කටයුතු නිවැරදිව ඇගයීමත් අවදානම හා ආයෝජන ඉලක්ක අතර මනා සම්බන්ධීකරණයක් ඇතිකිරීමත් සඳහා අභ්‍යන්තර සැසඳුම් නිර්නායකයක් හඳුන්වා දීමේ ක්‍රියාවලිය ද මෙම වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

10. 2 අවදානම් කළමනාකරණය

ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි කාර්යාලය මගින් විදේශ විනිමය සංචිත කළමනාකරණ කටයුතු හා බැඳුනු අවදානම් නිරීක්ෂණය හා කළමනාකරණය සඳහා අවශ්‍ය නිර්දේශයන් කරනු ලැබේ. සංචිත කළමනාකරණය හා බැඳුනු ප්‍රධානතම අවදනම් ලෙස විදේශ විනිමය අනුපාතික අවදානම, වෙළෙඳපොළ අවදනම, ද්‍රවශීලතා අවදනම හා මෙහෙයුම් අවදනම පෙන්වා දිය හැකිය.

විනිමය අනුපාතික උච්චාවචනයන්හි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධනයේ ඇතිවිය හැකි පහත වැටීම විනිමය අනුපාතික අවදනම ලෙස දක්වේ. බැංකුවේ විදේශ විනිමය සංචිත වත්කම් විවිධ විදේශ මුදල් වර්ග අතරේ ව්‍යාප්ත කිරීමෙන් විනිමය අනුපාතික අවදානම අවම කරගනු ලැබිණ. එක් එක් මුදල් වර්ග වලින් පවත්වාගෙන යනු ලබන ආයෝජන කලින් කලට නිරීක්ෂණය කිරීමෙන් ඉලක්කගත ආදයමට සරිලන අන්දමට අවශ්‍ය ගැලපීම් කරනු ලැබීය. පොලී අනුපාතික අවදානම නැතහොත් පොලී අනුපාතිකයේ උච්චාවචනයන්ට බඳුන්වන මහ බැංකුවේ ආයෝජන පරිමාව, වත්කම් කළඹ අනුව (Portfolio level) විවිධ වූ මුදල් පරිමාවන් හා අභ්‍යන්තරික සැසඳුම් නිර්නායකයන් (Internal Benchmarks) අනුව ගණනය කරනු ලබයි. ආයෝජන කළඹෙහි අභ්‍යන්තර සැසඳුම් නිර්නායකයන්ගෙන් වන විචල්‍යතාවයන් කාලීනව ඇගයුමට ලක් කරන ලද අතර ඒවා අනුමත සීමා සමඟ සැසඳීම් ද සිදු කෙරින.

මුදල් මණ්ඩලය මගින් අනුමත කළණි ගණුදෙනුකාර පාර්ශවයන් සඳහා වන ණය අවදනම් කළමණාකරන පද්ධතියේ සඳහන් පරිදි, අනුමත ගණුදෙනුකාර පාර්ශවයන් සඳහා ණය සීමාවන් පැණවීම, සුරැකුම්පත් නිකුත් කරන්නන්හට තනි තනිව ණය අවදනම් සීමා හඳුන්වාදීම, ආයෝජනයන් වඩාත් ගුණාත්මක මූල්‍ය උපකරණවලට සීමා කිරීම යනාදී වූ නියමිත අවශ්‍යතාවයන් පැනවීමෙන්, ණය අවදනම අවම කර ගන්නා ලදී. මෙහිදී සැළකිල්ලට ගන්නා ලද තවත් කරුණක් වූයේ ස්වාධීන ඇගයීම් ආයතන මගින් ගණුදෙනුකාර පාර්ශවයන් සඳහා දී තිබුණු ඇගයීමය. නිසි කලට සිය වගකීම් පියවීමට නොහැකිවීම තුළින් ඇතිවන අලාභ හා අධි පිරිවැය, ද්‍රවශීලතා අවදානම නිසා ඇතිවේ.මෙම අවදානම අවම කර ගැනීම සඳහා ජාත්‍යන්තර සංචිතයෙන් සැළකිය යුතු කොටසක් ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන මූල්‍ය උපකරණවල ආයෝජනය කරන ලදී.

මානව අතපසුවීම්, දෝෂ සහිත ක්‍රියා පද්ධති, අප්‍රමාණවත් ක්‍රියා පටිපාටීන් හා පාලන පද්ධති ආශ්‍රිතව ඇතිවන මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම පිණිස, ක්‍රියා මාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී. එනම් ගණුදෙනු සහ ඒවා නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලියට අයත් විවිධ කාර්ය භාරයන් හඳුනාගෙන ඒවා වෙන් කිරීම, විදේශ සංචිත කළමනාකරණ කාර්යයන් හා සම්බන්ධ වූ තීරණ ගැනීමේ බලය වි.සං.ක.ක. වෙත පැවරීම, ගණුදෙනු ක්‍රියාවලිය සඳහා පාලන පද්ධති හඳුන්වාදීම හා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම යනාදියයි. සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධ ක්‍රියාවලී අඩංගු වූ සවිස්තරාත්මක මාර්ගෝපදේශයන් සමඟ ක්‍රියාකාරී පද්ධතියේ සිදුවිය හැකි දෝෂ සහ ඇණහිටීම් අවම කිරීම පිණිස ස්වයංක්‍රීය සහ ස්වයංක්‍රීය නොවන උපස්ථක ක්‍රියාවලින් ද (Backup Procedures) ක්‍රියාත්මක කරන ලදී.

ගනුදෙනුකාර පාර්ශවයන් සමඟ සිදු කරන සාකච්ඡාවලදී පැන නැගිය හැකි මතභේදවල ප්‍රතිඵලයක් ලෙස සිදුවීමට ඉඩ ඇති මෙහෙයුම් අවදනම අවම කිරීම පිණිස 2005 ජනවාරි මස සිට ඉදිරි කාර්යාලයෙහි සිදුවන සාකච්ඡා තැටිගත කිරීමේ උපකරණ සවිකරන ලදී.

10. 3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම් පිළිබඳ අධීක්ෂණය කිරීම

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ මනා ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම හා ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් ක්‍රමවත්ව පවත්වා ගැනීම සඳහා, ජා.ක.දෙ. විසින් වාණිජ බැංකුවල දෛනික විදේශ විනිමය ප්‍රමාණයන් අධීක්ෂණය කිරීම 2005 වසර තුළදී ද සිදු කරනු ලැබීය.

2004 දෙසැම්බර් මස අවසානයේ එ.ජ.ඩොලරයට රුපියල් 104.61 ක්ව තිබූ රුපියලේ විනිමය අනුපාතිකය 2005 අවසානයේ එ.ජ.ඩොලරයට රුපියල් 102.12 දක්වා 2.44 ක ප්‍රතිශතයකින් අධිප්‍රමාණය විය. අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකවල ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති පිරිහීම නිසා රුපියල එම මුදල්වලට සාපේක්ෂව ද අධිප්‍රමාණය විය. 2004 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,279 ක්වූ අන්තර් බැංකු ගණුදෙනු පරිමාව 2005 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7,245 ක් දක්වා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,966 කින් හෙවත් සියයට 69 ක වර්ධනයක් පෙන්නුම් කෙරින. ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයෙහි ඇතිවන අසාමාන්‍ය විචලනයන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම යන දෙ අංශයෙන්ම වෙළෙඳපොළට පිවිසුණි. 2005 වර්ෂය තුළදී වාණිජ බැංකු වලින් මිලදී ගත් හා වාණිජ බැංකුවලට විකුණූ විදේශ විනිමය ප්‍රමාණය පිළිවෙලින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 290 ක් හා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 464 ක් විය.

තවද, ශ්‍රී ලංකා රුපියලේ විදේශ විනිමය අනුපාතිකයන් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා අනෙකුත් අදළ පාර්ශවයන් හට ලබාදීම මෙම දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් සිදුකරන ලදී.

10. 4 2005 වර්ෂයේදී නිකුත් කළ මෙහෙයුම් විධාන, චක්‍රලේඛන හා මග පෙන්වීම්

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි භාවිතා වන විදේශ විනිමය මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ විධිමත් පාලනයකට

නතුකර ලීමේ අරමුණින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සඳහා වර්ෂය තුළදී නව මෙහෙයුම් විධාන මාලාවක් නිකුත් කරන ලදී. මෙම විධාන මගින් පුළුල් වූත් ගැඹුරු වූත් විවිධාංගීකරණය වූ මූල්‍ය වෙළෙඳපොළක් ඇති කිරීමට අපේක්ෂා කෙරිණ. මෙම විධාන යටතේ වාණිජ බැංකුවලට පහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සඳහා අවසර දෙන ලදී. එනම් පොලී අනුපාතික හුවමාරු ගණුදෙනු (Interest Rate Swaps - IRS), පොලී අනුපාතික විකල්ප (Interest Rate Options - IRO), ඉදිරි අනුපාතික ගිවිසුම් (Forward Rate Agreements - FRA), හරස් විනිමය හුවමාරු ගණුදෙනු (Cross Currency Swaps-CCS), සහ මුදල් /භාණ්ඩ විකල්ප (Currency / Commodity Options -CCO) වෙයි. කෙසේ වෙතත් මෙයට ශ්‍රී ලංකා රුපියල් සහ විදේශ විනිමය සම්බන්ධිත ගනුදෙනු ඇතුලත් නොවේ. මුදල් භාණ්ඩ විකල්ප තෝරාගත් කාර්මික නිෂ්පාදන භාණ්ඩ හා වටිනා ලෝහ වලට පමණක් සීමා වේ.

11. නීති

2005 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති දෙපාර්තමේන්තුව විසින් නීතිය සම්බන්ධ කරුණුවල දී මහ බැංකුවට උපදෙස් දීම, බැංකුව වෙනුවෙන් අධිකරණ සහ වෙනත් විනිශ්චය සභා ඉදිරියේ පෙනී සිටීම සහ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ නීති ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දයකත්වය සැපයීම යන අංශවල එහි සේවය තව දුරටත් පවත්වාගෙන යන ලදී

මෙම වසර තුළ දී නීති දෙපාර්තමේන්තුව මූල්‍ය පද්ධතියේ මනා ක්‍රියාකාරිත්වය පිණිස පහසුකම් සලසනු සඳහා නව නීති හඳුන්වා දෙන අතරවාරයේ පවත්නා නෛතික රාමුව සමාලෝචනය කිරීමේ තම ප්‍රයත්නය තව දුරටත් පවත්වාගෙන යන ලදී. 1988 අංක 30 දරන බැංකු පනතේ පැවති නොයෙක් අවිනිශ්චිතතාවන් සහ හිඩැස් ආමන්ත්‍රණය කරමින් සහ නියාමන පාලකයන්ගේ විෂය පථය පුළුල් කරමින් 2005 පෙබරවාරියේ දී 2005 අංක 02 දරන බැංකු (සංශෝධන) පනත සම්මත කරන ලදී. මෙම සංශෝධනය මගින් හඳුන්වා දෙන ලද වඩාත් වැදගත් ප්‍රතිපාදන වන්නේ අධ්‍යක්ෂකවරුන් සඳහා නිසි සහ සුදුසු මෙහෙයුම් නිර්ණායකය, බලපත්‍රලාභී බැංකුවල අයිතියේ ඒකරාශී වීම අවම කිරීමේ ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සහ බලපත්‍රලාභී බැංකුවල පාලන විධි අංශ ශක්තිමත් කිරීමයි. මෙම සංශෝධනයන් සමගින් තැන්පත්කරුගේ ආරක්ෂාව තහවුරු වන පරිද්දෙන් "තැන්පතු" යන වචනයට අර්ථ නිරූපණයද හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීමෙහි ලා මෙම සංශෝධන වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.

2005 වසර තුළ දී තවත් වැදගත් වර්ධනයක් වූයේ මූල්‍ය පද්ධතියේ ස්ථාවර සහ මනා ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමට දයක වන කාර්යක්ෂම සහ විශ්වසනීය ක්‍රියාකාරිත්වයෙන් යුතු ගෙවීමේ පද්ධතියක් වශයෙන් ගෙවීමේ සේවාවන් පාලනය වන නෛතික රාමුව ශක්තිමත් කරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත පැනවීමයි. ගෙවීමේ, නිශ්කාෂණය කිරීමේ සහ බේරුම් කිරීමේ පද්ධතීන් විධිමත් කිරීම සඳහාත්, මූල්‍ය සේවා සැපයුම්කරුවන් විධිමත් කිරීම සඳහාත් සහ චෙක්පත් විද්‍යුත් ක්‍රමයෙන් ඉදිරිපත් කිරීම සඳහාත් වන විධිවිධාන මෙම පනතේ අඩංගු වේ.

කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය වූ අතර මෙමගින් අනෙකුත් දේ අතර කල්බදු සමාගම්වලට තම කල්බදු ආයෝජන සුරැකුම්කරණය කිරීමට හැකියාව ලබා දෙන ලදී. ඒ අනුව කල්බදු මූල්‍යකරණ සමාගම්වලට තම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යකරණය කිරීමට ඉඩ සැලසෙන අතර එමගින්, ඔවුන්ගේ ද්‍රවශීලතා හිඟයන් සම්බන්ධයෙන් වන ගැටළුවලට සහනයක් සැලසෙනු ඇත. කෙසේ වුවද, සුරැකුම්කරණය සම්බන්ධයෙන් සමස්තයක් වශයෙන් බලපාන පුළුල් ගැටළු, ඒ සඳහාම වෙන් වූ ව්‍යවස්ථාවක් හඳුන්වා දීමේ අපේක්ෂාවෙන් සළකා බැලෙමින් ද පවතී.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීමේ නීති සකස් කිරීමේ දී නීති දෙපාර්තමේන්තුව බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තු කිහිපයක් සහ රාජ්‍ය ආයතන සමග සමීපව කටයුතු කළේය. ශ්‍රී ලංකාව 2005 වසරේ මැද භාගයේ දී ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සම්මත කරමින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිටුදකීමේ ලෝක පරිශ්‍රමය හා අත්වැල් බැඳගත්තේය. මුදල් විශුද්ධිකරණය වළක්වාලීමේ සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ කෙටුම්පත් 2005 වර්ෂයේදී ව්‍යවස්ථාදයකය වෙත ඉදිරිපත් කෙරුණු අතර ඒවා 2006 ජනවාරි මාසයේ දී සම්මත විය.

12. කළමනාකාරිත්ව විගණන

කළමණාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 2005 වර්ෂය තුලදීද අවදනම මත පදනම් වූ ස්වාධීන විගණන කරගෙනයාමට කටයුතු කළ අතර, මහ බැංකුවේ ක්‍රියාකාරිත්වයේ හා පාලන පද්ධතීන්හි වර්ධනයට සහ අගය වැඩි කිරීමට හා බැංකුවේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඵලදයක ලෙස දායකවීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

මුදල් මණ්ඩලයේ විගණන කමිටුවද එහි කටයුතු ඉටු කරමින් වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම, විගණන ක්‍රියාවලින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ඒ හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ පරිචයන් හා අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳව සැළකිලිමත් වන ලදී. කළමණාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විගණන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියාත්මක වන ලදී.

විගණන ප්‍රඥප්තියට අනුකූලව 2005 සඳහා අවදනම මත පදනම් වූ වාර්ෂික විගණන සැලසුම සකස් කරන ලදී. හඳුන්වාදෙන ලද අභ්‍යන්තර පාලන ක්‍රමයන්ගේ නිසි ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම සඳහා අනුකූලතා විගණන කටයුතු නොකඩවා පවත්වාගෙන යන ලද අතර, අභ්‍යන්තර පාලනයන්ගේ ප්‍රමාණවත් බව තහවුරු කර

ගැනීම සඳහා තෝරාගත් විගණන පැවරුම් කීපයක් කිරීමත්, විය හැකි අවදානම් වලින් බැංකුව ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වා දීමත් වාර්ෂික විගණන සැලසුමට අනුව කරන ලදී. පසුගිය අවුරුදුවල මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණන විමර්ශනයන් ද කරන ලදී.

බැංකුවේ පාලන කටයුතු ක්‍රියාවලියට සම්බන්ධ වූ විශේෂ කටයුතු පිළිබඳව කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව වාර්තා කරන ලද අතර, වාර්ෂික විගණන සැලසුමේ ප්‍රතිඵල සහ තත්ත්වයන් පිළිබඳ වූ තොරතුරු කළමනාකාරිත්වයට සහ විගණන කමිටුවට කාලීනව සපයන ලදී.

වර්ෂය තුළ කරන ලද ප්‍රධාන විගණන කටයුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ වැටුප් ක්‍රමයේ විමර්ශනය (අර්නස්ට් සහ යං ආයතනය සමග බාහිර පැවරුම මගින්), මහ බැංකුවේ රක්ෂණ සහතික පිළිබඳ විමර්ශනය, සාමාන්‍ය නඩත්තු සඳහා වූ භාණ්ඩ මිළදී ගැනීම, අනුරාධපුර, මාතර සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු විමර්ශනය, කුලී රථ සේවාව පාවිච්චිය පිළිබඳ විමර්ශනය, මහ බැංකුවේ වාහන සඳහා ඉන්ධන පරිභෝජනය සහ ඒවායේ අළුත්වැඩියා සඳහා වූ පිරිවැය, ඇප ආවරණ යෝජනා යටතේ වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය වීමේ ව්‍යාපෘතිය, මැදරට නිත්‍යභෝග සංවර්ධන ණය ව්‍යාපෘතිය, කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සිව්වැනි) යන ව්‍යාපෘතිවල ඉල්ලුම්කරන ලද හිමිකම් පියවීම සහ මුද්‍රණාලයේ වියදම් විමර්ශනය, ව්‍යවහාර මුදල් සුරක්ෂිතාගාර, ප්‍රාදේශීය කාර්යාලවල ගබඩා හා ඉංජිනේරු ගබඩාවේ තොග පිළිබඳ භෞතික සත්‍යාපනය කරන ලදී.

2005 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමයක් සකස් කිරීම සහ හඳුන්වා දීම සඳහා අවශ්‍ය මූලික කටයුතු බැංකු අවදානම් තක්සේරුව සඳහා වූ කමිටුවේ මග පෙන්වීමට යටත්ව මුලපුරන ලදී. කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ වූ රීති හා මගපෙන්වීම් සියළුම දෙපාර්තමේන්තුවලට නිකුත් කරන ලදී. මහ බැංකු අවදානම් කළමනාකරණය කිරීමේ අදහසින් දෙපාර්මේන්තු විසින් හඳුනා ගනු ලැබූ අවදානම් වාර්තා කිරීමට අවශ්‍ය පරිගණකගත මෘදුකාංග සකස්කර සියළුම දෙපාර්තමේන්තුවල ස්ථාපනය කරන ලදී. දෙපාර්තමේන්තුවල ක්‍රියාවලිය ලියවුනු එහි කටයුතු පිළිබඳ අත්පොත කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ මූලිකත්වය සහ මග පෙන්වීම යටතේ 2005 වර්ෂය තුළ ඉතා සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

අභ්‍යන්තර සහ කළමනාකාරිත්ව විගණනයේ වෘත්තීයමය තත්ත්වය ගොඩනැංවීම සඳහා එක්සත් ජනපදය පදනම් කරගත් අභ්‍යන්තර විගණකයන්ගේ ආයතනයේ (IIA) විභාග ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමට විධිවිධාන යොදන ලදී. කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව "IIA" ශ්‍රී ලංකා ශාඛාව සමග එහි පාඨමාලා උසස් කිරීමට ක්‍රියාකාරීව සහයෝගීතාවයෙන් කටයුතු කරමින් සිටින අතර, ඒ අනුව බැංකුව එහි පාලන සභාව සහ අධ්‍යයන මණ්ඩලය යන දෙකෙහිම නියෝජනය කරනු ලබයි.

13. ගෙවීම් සහ පියවීම්

2005 වර්ෂය තුළ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ කාර්යයන් අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන ශක්තිමත් ස්ථාවර හා කාර්යක්ෂම මූල්‍ය ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඉටු කර ගැනීම උදෙසා ගෙවීම් පද්ධති අවේක්ෂණ කටයුතු සහ ගෙවීම් පද්ධති හා සම්බන්ධ නීති රාමුව ශක්තිමත් කිරීම මෙන්ම මූල්‍ය ආයතනවල ක්‍රියාකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැළසුම් (Business Continuity Planing) ශක්තිමත් කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබා දෙන ලදී. ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් වල කොඳුනාරටිය බඳු තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිත කළමනාකරණ කටයුතු සහ විවට වෙළෙඳ කටයුතුවලට අදාළ ගෙවීම් හා පියවීම් විධාන පිළියෙළ කිරීම සහ නිකුත් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් (SWIFT) සංනිවේදන කටයුතු මෙහෙයවීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා ලැබීම්වලට අදළ විද්‍යුත් ප්‍රවේශ කවුළුව මෙහෙයවීම, ආසියානු නිශ්කාෂණ සංගමයේ නිශ්කාෂණ ක්‍රියාවලිය යටතේ ගනුදෙනු සිදුකිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් විය.

13.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) මෙහෙයවීම

තත්කාලීන දළ පියවීම් පද්ධති මෙහෙයුම් අංශය විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම සහ සහභාගිත්ව ආයතන සඳහා උපකාරක සේවා ලබාදීම 2005 වසර තුළදීද සිදු කරනු ලැබිණි. 2005 වර්ෂය තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද ගනුදෙනු වල වටිනාකම රුපියල් බිලියන 17,543 ක් වූ අතර, එය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ අගය මෙන් හත් ගුණයක ඉහළ අගයකි. මෙම පද්ධතිය තුළ 2005 වර්ෂයේදී පියවූ දෛනික සාමාන්‍ය (Daily Average) ගනුදෙනු සංඛ්‍යාව 629 ක් වූ අතර දෛනික සාමාන්‍ය ගණුදෙනු වටිනාකම රුපියල් බිලියන 74 ක් විය. 2005 වර්ෂය අවසානය වන විට, තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සහභාගිත්ව ආයතන 32 ක් වූ අතර එයට බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ද බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන් 8 දෙනාද සේවක අර්ථසාධක අරමුදල ද අයත් විය.

13.2 ස්විෆ්ට් සංනිවේදන කටයුතු මෙහෙයවීම

2005 වසර තුළදීද ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ ස්විෆ්ට් සංනිවේදන අංශය ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් සංනිවේදන ක්‍රියාකාරකම්වල නියැලුණු අතර, ස්විෆ්ට්

සංනිවේදන පද්ධතියේ නවීකරණයන් හා වැඩිදියුණු කිරීම් වලට අදාළව පහත සඳහන් කටයුතුවලට සහභාගි විය.

(අ) ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයේ (Primary Site) ඇති ස්විෆ්ට් පද්ධතියේ (Primary Site) ස්විෆ්ට් එලයන්ස් ඇක්සස් (SWIFT ALLIANCE ACCESS) මෘදුකාංගය 5.00 වන සංශෝධනයේ සිට 5.5 වන සංශෝධනය දක්වා වැඩි දියුණු කිරීම.

(ආ) ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයේ ඇති ස්විෆ්ට් පද්ධතියේ ස්විෆ්ට්නෙට් ලින්ක් මෘදුකාංගය SNL 4.40 සිට SNL 5.00 දක්වා වැඩි දියුණු කිරීම.

(ඇ) නව මෘදුකාංග පද්ධතිය සමග MT 5XX කාණ්ඩය යාවත්කාලීන කිරීම.

13.3 ආසියානු නිශ්කාෂණ සංගමයේ (ආ.නි.සං.) ගනුදෙනු

ශ්‍රී ලංකාව ආසියානු නිශ්කාෂණ සංගමය හරහා කරන ලද මුළු ගනුදෙනුවල වටිනාකම, 2004 වසරේ දී රුපියල් බිලියන 161 සිට 2005 වසරේ දී රුපියල් බිලියන 167 දක්වා සියයට 4 ක සුළු වර්ධනයක් පෙන්විය. කෙසේ වෙතත්, 2005 වසරේ දී ආසියානු නිශ්කාෂණ සංගමයේ අනෙකුත් සාමාජික රටවලට කරන ලද අපනයනවල මුළු වටිනාකම, 2004 වසර හා සසඳන විට, සියයට 38 ක වර්ධනයක් වාර්තා කරන ලදී. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉන්දියාවට හා ඉරානයට කරන ලද අපනයනයන් ඉහළ යෑමය.

2005 දී ආසියානු නිශ්කාෂණ සංගමය හරහා කරන ලද ගනුදෙනුවල ශුද්ධ පියවීම් වටිනාකම රුපියල් බිලියන 138 ක් වූ අතර, එය පසුගිය වසර හා සසඳන විට සියයට 3 ක පහත වැටීමක් පෙන්නුම් කරයි.

ආසියානු නිශ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 34 වැනි වාර්ෂික රැස්වීම 2005 මැයි මාසයේ දී පකිස්ථානයේ ලාහෝර් නුවර දී පවත්වන ලදී. මෙම රැස්වීමේදී, ආසියානු

II - 9 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකාව, ආසියානු නිශ්කාෂණ සංගමයට අයත් රටවල් සමග කරන ලද වෙළෙඳ ගනුදෙනු සහ ආ.නි.සං. ගනුදෙනුවල වටිනාකම (රුපියල් බිලියන)

අයිතමය	2004	2005
ආ. නි. සං. හරහා කෙරුණු මුළු ගණුදෙනුවල වටිනාකම	161.1	166.8
ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවලට කරන ලද අපනයන වටිනාකම	51.0	70.6
ශ්‍රී ලංකාව ආ. නි. සං. රටවලින් කරන ලද ආනයන වටිනාකම	199.9	250.0
ශ්‍රී ලංකාව ආ.නි. සං. රටවල් සමග කරන ලද මුළු වෙළෙඳම් වටිනාකම	250.9	320.6
ආ. නි. සං. ගනුදෙනුවල ශුද්ධ පියවීම් වටිනාකම	143.3	138.4

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිශ්කාෂණ සංගමයේ අනාගත කාර්යභාරය අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට සෑම සාමාජික රටකම නියෝජිතයන්ගෙන් සමන්විත තාක්ෂණ කමිටුවක් පිහිටුවීමට තීරණය කරන ලදී.

13.4 ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සහ ගෙවීම් පද්ධති අවේක්ෂණය

ගෙවීම් පද්ධති අවේක්ෂණයෙහි දී (අ) ගෙවීම් පද්ධති ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට සහ (ආ) ගෙවීම් සහ පියවීම් ක්‍රියාවලියෙහි සැලකිය යුතු කොටසක් දිගු කලක් අක්‍රියවීමකදී, ගෙවීම් හා පියවීම් කටයුතු බිඳ නොවැටී අඛණ්ඩව සිදුකිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ආයතන වල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැලසුම් (Buisness Continuity Plans) සහ අංග සම්පූර්ණ ප්‍රතිප්‍රාප්ති වැඩබිම් (Disaster Recivery Site) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සැකසීම සඳහා ලංකා සෙට්ල් සහභාගීත්ව ආයතන පෙළඹවීමට අවධානය යොමු කරන ලදී.

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් විවිධ ගෙවීම් පද්ධතිවල ඇති එකිනෙකට වෙනස් වූ අවදානම් සංයුතීන් හඳුනාගෙන, අවදනම පදනම් කරගත් ගෙවීම් හා පියවීම් පද්ධති අවේක්ෂණ ප්‍රවේශයක් උපයෝගී කොට ගෙන තවදුරටත් සිය අවේක්ෂණ කටයුතු සිදු කරන ලදී. එම අවේක්ෂණ කටයුතුවලට පද්ධතියක් වශයෙන් ප්‍රමුඛත්වය දරණ ගෙවීම් පද්ධති හා සමස්ථ ගෙවීම් ක්ෂේත්‍රයටම බලපෑමක් ඇති කළ හැකි ගෙවීම් පද්ධති, එම පද්ධතීන්හි අරමුණු, රීති, රෙගුලාසි හා පිළිගත් ව්‍යවහාරයන් අනුව නිරීක්ෂණය කිරීම, ඇගයීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී එම ගෙවීම් පද්ධතීන්හි වැඩිදියුණුව සඳහා අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දීම ඇතුළත් විය.

ඒ අනුව අවේක්ෂණ විෂය පථයට ඇතුලත් වන්නේ ගෙවීම් පද්ධතියක් වශයෙන් ප්‍රමුඛත්වය දරණ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන ගෙවීම් හා සුරැකුම්පත් පියවීම් පද්ධතිය (තත්කාලීන දළ පියවීම් පද්ධතිය, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතුව) සහ සමස්ථ ගෙවීම් ක්ෂේත්‍රයටම බලපෑමක් ඇති කළ හැකි සුළු පරිමාණ ගෙවීම් පද්ධති ඇතුළත්, ලංකාක්ලියර් පුද්ගලික සමාගම මගින් මෙහෙයවනු ලබන සියළුම සුළු පරිමාණයේ නිශ්කාෂණ පද්ධතීන්, කොළඹ කොටස් හුවමාරුවට අයත් සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් පෞද්ගලික සමාගම මගින් මෙහෙයවනු ලබන ණය සුරැකුම්පත් හුවමාරු පද්ධතිය, වාණිජ බැංකු දෙකක් මගින් වීසා සහ මාස්ටර්කාඩ් ගනුදෙනු පියවීම සඳහා මෙහෙයවනු ලබන දේශීය පියවීම් පද්ධතීන් සහ එක්සත් ජනපද ඩොලර් චෙක්පත් නිශ්කාෂණය හා පියවීම් සඳහා වාණිජ බැංකුවක් විසින් මෙහෙයවනු ලබන පියවීම් පද්ධතියයි.

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඉටුකල ගෙවීම් පද්ධති අවේක්ෂණ කටයුතුවලදී ජාතික ගෙවීම් පද්ධතිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් මෙහෙයවීම

අරමුණු කර ගනිමින් සමස්ථ ගෙවීම් පද්ධතීන්ටම බලපාන ගැටළු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව, ගෙවීම් පද්ධතීන් නිරීක්ෂණය සහ අවේක්ෂණය කිරීමටත් "කාර්තුමය ගෙවීම් විවරණිකාව" ප්‍රකාශයට පත් කිරීමටත්, අවශ්‍ය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු, සියළුම වැදගත් ගෙවීම් පද්ධති සේවා සපයන්නන්ගෙන් සහ ලංකාසෙට්ල් සහභාගීත්ව ආයතන වලින් කාලච්ඡේදානුකූලව රැස් කරන ලදී.

ලංකාසෙට්ල් සහභාගීත්ව ආයතන වල ගෙවීම් හා පියවීම් කටයුතු නිරීක්ෂණය කිරීම, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ දෛනික කාර්යයක් වූ අතර එම ගෙවීම් හා පියවීම් කටයුතු නිසි අයුරින් පවත්වා ගැනීමට අවශ්‍ය වන විවිධ පියවරයන්ද ගන්නා ලදී. එවැනි එක් පියවරක් ලෙස තත්කාලීන දල පියවීම් පද්ධතිය තුළ ලංකාක්ලියර් ශුද්ධ නිශ්කාෂණ ශේෂයන් නිසි පරිදි පියවීම් තහවුරු කිරීමට සහ පියවීම් අවදානම අවම කිරීමේ අරමුණින් ශුද්ධ නිශ්කාෂණ වගකීම් නියමිත වේලාවන්හිදී පියවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සිය තත්කාලීන දළ පියවීම් ගිණුම් වල පවත්වා ගැනීමට අපොහොසත් වන වාණිජ බැංකු වලට 2005 ඔක්තෝම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි පැහැරහැරීමේ ගාස්තුවක් පැනවූ අතර ඊට අදාලව ලංකාසෙට්ල් පද්ධති රීතීන්හි දෙවැනි වෙළුමෙහි 8.3 වගන්තිය සංශෝධනය කරන ලදී.

ලංකාසෙට්ල් සහභාගීත්ව ආයතන වල ගෙවීම් හා පියවීම් පද්ධතීන්හි සිදුවිය හැකි බාධාවන් නිසා ඇතිවිය හැකි පද්ධතිමය අවදානම කෙරෙහි අවධානය යොමුකර, ශ්‍රී ලංකා මහ බැංකුව, 2005 මාර්තු මස අවසන් වන විට මූල්‍ය ආයතන වල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැලසුම් ලේඛන ගතකරන ලෙස ලංකාසෙට්ස් සහභාගීත්ව ආයතන වලින් ඉල්ලා සිටින ලදී. මූල්‍ය ආයතන වල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැලසුම් සකස් කිරීමේදී අදල කර ගතයුතු ප්‍රමිතීන් පැහැදිලි කිරීමට, සෑම සහභාගීත්ව ආයතනයක් සමඟම ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව වෙන් වෙන්ව සාකච්ඡා පැවැත්වූ අතර ඒ අනුව සංශෝධනය කරන ලද මූල්‍ය ආයතන වල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැලසුම් 2005 අගෝස්තු මස අවසන් වන විට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. තවද මූල්‍ය ආයතන වල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සැලසුම් සකස් කිරීමේදී උපකාරී වන උපදෙස් මාලාවක් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කර ඒ පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ සංගමය සහ ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමය වෙත යොමු කරන ලදී.

2005 වසර මුල් භාගයේදී ස්විඩන් මහ බැංකුවේ නියෝජිත කණ්ඩායමක් විසින් මෙහෙයවන ලද ලංකාසෙට්ල් පද්ධතිය පිළිබඳ පසු විපරම් කටයුතු සඳහාද ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සෘජුව දායක වූ අතර, එම පසු විපරම මගින් ද ලංකාසෙට්ල් පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා ඊට අදල නීති ප්‍රතිසංස්කරණ ඇති කිරීම නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගීත්ව ආයතන විසින් එයට පෙර දරණ ලද පියවීම්, මෙහෙයුම් හා නීති අවදනම් සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට හේතු වී ඇති බව අනාවරණය කරන ලදී.

14. පරිශ්‍ර

මහ බැංකුවේ නිලධාරීන් සඳහා ප්‍රවාහන සහ සන්නිවේදන පහසුකම් වැනි උපකාරක සේවාවන් සැපයීමට අමතරව මහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව 2005 වර්ෂය තුළ දී තවදුරටත් නිරත විය.

අවම පිරිවැයකින් හා වඩාත් කාර්යක්ෂමව සේවාවන් ලබා ගැනීමේ අරමුණ ඇතිව නඩත්තු කටයුතුවලින් වැඩි කොටසක් හා ප්‍රවාහන සේවාවල කොටසක් සඳහා බාහිර ආයතනවලින් සේවා ලබා ගැනීම තවදුරටත් කරනු ලැබීය.

2005 වසර අවසන් වනවිට මහ බැංකුවේ සේවා නියුක්තිකයන්ට රාජකාරී කිරීම සඳහා වඩාත් සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලට අවශ්‍ය නවීන කාර්යාලයීය ලී බඩු සැපයීමත්, ජනෙල් සඳහා ආවරණ පැළලි සැපයීමත් සිදු කරන ලදී.

අදළ වර්ෂය තුළ දී, මහ බැංකු සේවා නියුක්තිකයන් හා විශ්‍රාමිකයන් සඳහා පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් සිය නිවාඩු නිකේතන ලැයිස්තුවට අනුරාධපුරයෙහි තවත් එක් නිවාඩු නිකේතනයක් එකතු කරගනු ලැබීය. මාතලේ ප්‍රාදේශීය කාර්යාලය නව නිවහනකට ගෙන යන ලදී.

මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති ඓතිහාසික මෙන්ම පෞරාණික වටිනාකමින් යුත් ප්‍රදීපාගාර ඔරලෝසු කණුව මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වාගෙන යාමේ නඩත්තු කටයුතුවල දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය.

15. රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව දේශීය වෙළෙඳපොළෙන් අරමුදල් රැස්කිරීම හා දේශීය ණය කළමනාකරණය කිරීම සහ දේශීය, විදේශීය ණය සේවාකරණය ඇතුළත් ණය කළමනාකරණ කටයුතුවල වගකීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ දිගු හා මැදිකාලීනව අවම පිරිවැයක් යටතේ සහ අවම අවදනම් මට්ටමක් පවත්වා ගනිමින් රජයේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සහ නියමිත වේලාවට ණය සේවාකරණය කිරීමත්ය. 2005 වර්ෂයේ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව රජයේ සුරැකුම්පත් මගින් රුපියල් බිලියන 259 ක් රැස් කරන ලද අතර, විදේශ ණය 605 ක් ද ඇතුළුව මුළු රාජ්‍ය ණය සංචිතය නියමිත වේලාවට සහ නිවැරදිව සේවාකරණය කරන ලදී. මෙම ප්‍රධාන

කාර්යයන්ට අමතරව, වර්ෂය තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සඳහා මූලික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම සම්බන්ධයෙන් පහසුකම් සැපයීමේ ක්‍රියාවලියක නිරත විය. ඒ අනුව එම කාර්යය සඳහා පත්කරන ලද ප්‍රධාන කළමනාකරු (Citigroup) සමඟ සම්බන්ධීකරණය වෙමින් ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ උපදේශකවරුන්ගෙන් යෝජනා කැඳවීම, ඒවා ඇගයීම සහ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තෝරා ගැනීම ආදී කටයුතු සිදුකරන ලදී. වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රටට විදේශ ණය ලබා දුන් රටවල රාජ්‍යතාන්ත්‍රික කණ්ඩායම් සමඟ එක්ව් පැරිස් සමූළු මණ්ඩල සාමාජිකයින් සහ අනෙකුත් ද්විපාර්ශ්වික ණය ලබාදෙන්නන් විසින් සපයන ලද ණය ආපසු ගෙවීම කල් තැබීමේ කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම්ද සලසන ලදී. වසරේ තුන්වන කාර්තුව තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ආයෝජකයන්ගෙන් ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 100 ක ඒකාබද්ධ ණය මුදලක් ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ ප්‍රධාන සැලසුම්කරු වූ සිටිගෲප් සමඟ එක්ව අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

2005 වර්ෂයේ දී විශේෂයෙන්ම ණය කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පියවර කීපයක් ගන්නා ලදී. දේශීය ණය කළමනාකරණය පිළිබඳ විධිමත් උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර උපදේශකවරුන්ගේ සහාය ලබාගනිමින් අවදනම් කළමනාකරණ ආකෘතියක් පිහිටුවීමේ මූලික ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී. පවත්නා ණය සංයුතියෙහි ඇති වී තිබෙන ණය පරිණත වීම් ඒකාබද්ධ වීම වලක්වා ගැනීම සඳහා ණය ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත් දෙපාර්තමේන්තුව ඒ සඳහා මූලික පියවර කිහිපයක් ආරම්භ කරන්නට යෙදුනි. ආයෝජකයින්ට ධනාත්මක මූර්ත ප්‍රතිලාභයක් ලබා දීම සහ ණය උපකරණ විවිධාංගීකරණය කිරීමේ අරමුණෙන් මිල දර්ශකය හා බැඳුණු බැඳුම්කර මුල්වරට හඳුන්වා දීම සිදුකරන ලදී. මේ අතර රුපියල් ණය කලින් ගෙවා නිමකිරීම තුළින් 2004 වර්ෂයේ දී මෙන්ම රජයේ පොලී පිරිවැය රුපියල් බිලියන 3 කින් අඩු කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. මෙයට අමතරව රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල සංවර්ධනය සඳහා තවදුරටත් පහසුකම් සැපයීමේ අරමුණෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත රජයේ සුරැකුම්පත් අලෙවිය පිළිබඳ සෘජු සහභාගිවන්නෙකුගේ තත්ත්වය පිරිනැමීම, ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනු පිළිබඳ පරිපූර්ණතා ගිවිසුමක් හඳුන්වාදීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම, ප්‍රාථමික අලෙවිකරුවන් වෙනුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම සහ ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදී. අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීමෙන් සහ ලාභාංශ බෙදහැරීම පිළිබඳ සීමාවන් පැනවීමෙන් ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

15.1 2005 වසරේදී සිදු වූ සංවර්ධනයන්

(අ) ණය නිකුතුව හා පිරිවැය

2005 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ 2004 අංක 15 දරණ විසර්ජන පනතට අනුව රජයේ මුළු දළ ණය ලබා ගැනීමේ සීමාව රුපියල් බිලයන 436 ක් වූ අතර, ඉන් රුපියල් බිලියන 331 ක් දේශීය වෙළෙඳපොළෙන් රැස්කළ යුතු විය. රජයේ අයවැය අවශ්‍යතාවයන්ගෙන් කොටසක් සපුරා ගැනීම සඳහා රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් රුපියල් බිලියන 259 ක් රැස්කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. ඊට අමතරව විදේශ මුදල් බැංකු ඒකක තුළින් ලබාගත් දළ ණය ගැනුම් ප්‍රමාණය රුපියල් බිලියන 59 ක් (එ .ජ.ඩොලර් දශ ලක්ෂ 585) විය. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ අනුදත් සීමාව වර්ෂය තුළදී රුපියල් බිලියන 300 මට්ටමේ නොවෙනස්ව පැවතිණ.

මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාජිකයන්ගෙන් සමන්විත වන දේශීය ණය කළමනාකරණ කමිටුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති, අයවැය ප්‍රතිපත්ති සහ ණය කළමනාකරණ ප්‍රතිපත්ති අතර සාර්ථක සහසම්බන්ධතාවයක් පවත්වා ගනිමින් 2005 වර්ෂය සඳහා අවශ්‍ය සම්පත් රැස්කිරීම සඳහා සුදුසු උපාය මාර්ග සකස් කරන ලදී. 2005 වර්ෂයේදී ඉලක්ක කරගත් ණය කළමනාකරණ උපායමාර්ගය වූයේ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ මිල දර්ශකය හා බැඳුණු බැඳුම්කර වැනි වෙළෙඳපොළේ ගනුදෙනු කළහැකි ණය උපකරණ මගින් විශාල සම්පත් ප්‍රමාණයක් රැස්කිරීමයි. මෙම ණය උපකරණ රජයේ සුරැකුම්පත් මගින් රැස්කරනු ලැබූ මුළු අරමුදලින් සියයට 83 ක් සඳහා දායක විය. වෙළෙඳපොළේ ගනුදෙනු කළ නොහැකි ණය උපකරණයක් වන රුපියල් ණය වලින් රුපියල් බිලියන 24 ක ශුද්ධ ආපසු ගෙවීමක් සිදුකරන ලද අතර, එම නිසා සමස්ත ණය ව්‍යුහයේ රුපියල් ණයවල දායකත්වය 2004 දී සියයට 14 සිට 2005 දී සියයට 11 දක්වා අඩු විය. වෙළෙඳපොළ සහභාගිවන්නන් විසින් වෙළෙඳපොළ තත්ත්වය පිළිබඳ ඇති කරගත් අදහස් පදනම් කර ගනිමින් ඔවුන් තුළ පැවති අවදනම් දැරීමේ කැමැත්ත අවදනම් දැරීමේ දැඩි අකැමැත්තක් බවට පත් වූ නිසා වර්ෂය තුළ දී කෙටි කාලීන ණය උපකරණවල ආයෝජනය සඳහා දැඩි නැඹුරුවක් දක්නට ලැබිණි. වර්ෂය තුළ දී කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් මෙන්ම දිගුකාලීන හා මධ්‍ය කාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් පවත්නා ණය තොගයේ පිරිවැය හා අවදනම අතර තුලනයක් ඇති කිරීමට උත්සාහ කරන ලදී. නිකුත් කරන ලද මුළු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙන් දළ වශයෙන් සියයට 61 ක ප්‍රමාණයක් පරිණත කාලය වසර 2 ඉක්ම වූ ඒවා විය. අනාගත උද්ධමනය පිළිබඳව වෙළෙඳපොළ ආයෝජකයන්ගේ බලාපොරොත්තුවලට පහසුකම් සැපයීමක් වශයෙන් සහ ධනාත්මක මූර්ත ප්‍රතිලාභයක් සහතික කිරීම්වස් 2005 වර්ෂයේදී මිල දර්ශකය හා බැඳුණු බැඳුම්කර වෙළෙඳපොළට හඳුන්වා දෙනු ලැබීය. මේ අතර දේශීය වෙළෙඳපොළ කෙරෙහි වූ පීඩනය අඩු කිරීම සහ පොලී

අනුපාත ස්ථාවර කිරීම අරමුණු කර ගනිමින් කල්පිරීමේ කාල සීමාව වසර තුනක් සහ ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතයට පාදක අංක 95 ක් එකතු කළ පොලී අනුපාතයක් සහිත එ. ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක විදේශ වාණිජ ණයක් (ඒකාබද්ධ ණය මුදලක් ලෙස) ප්‍රධාන සැලසුම්කරු මාර්ගයෙන් ලබා ගන්නා ලදී.

2005 වර්ෂයේ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52 ක් පවත්වන ලදී. මෙම වෙන්දේසි මගින් සහ සෘජු නිකුත් කිරීම් තුළින් දළ වශයෙන් ගත් කළ රුපියල් බිලියන 486 ක මුදල් ප්‍රමාණයක් රැස්කළ හැකි වූ නමුත් ශුද්ධ වශයෙන් ගත් කළ රුපියල් බිලියන 9.7 ක ආපසු ගෙවීමක් සිදු කෙරිණි. වෙළෙඳපොළේ කෙටිකාලීන ආයෝජනවලට ඇති කැමැත්ත පිළිබිඹු කරමින්, මුළු දළ නිකුතුවෙන් සියයට 53 ක් දින 91ක පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බිල්පත් විය. භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 64 ක් පවත්වන ලද අතර, වෙන්දේසි වලින් සහ සෘජු නිකුත් කිරීම් තුළින් රැස් කරන ලද මුළු මුදල රුපියල් බිලියන 230 ක් විය. වෙළෙඳපොළේ වැඩි නැඹුරුව කෙටි පරිණත කාලසීමාවකින් යුත් බැඳුම්කර සඳහා වූ හෙයින් වසර 4-6 දක්වා පරිණත කාල සීමාවන්ගෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුන් හි වටිනාකම රුපියල් බිලියන 37 කට සීමා විය. භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ ගණන 56 දක්වා තවදුරටත් අඩු කරන ලදී. 2005 වර්ෂයේදී රුපියල් ණයවල ශුද්ධ ආපසු ගෙවීමක් සිදුකෙරිණි. මෙම ආපසු ගෙවීම් ප්‍රධාන වශයෙන්ම නියමිත පරිණත කාලයට පෙර සිදු කරන ලද සියයට 11 සිට සියයට 13 දක්වා පොලී අනුපාත රැගත් නැවත කැඳවිය හැකි රුපියල් ණයවලින් යුක්ත විය. 2005 වර්ෂයට අදාල දේශීය ණය නිකුතුව හා පරිණතවීම පිළිබඳ තොරතුරු අංක II - 10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

(ආ) නොගෙවා පැවති ණය

2005 වර්ෂය අවසාන වන විට නොගෙවා පැවති රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,217.1 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ මුළු ණය තොගය 2004 වර්ෂයේදී සියයට 105.5 සිට 2005 වර්ෂයේදී සියයට 94 ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කළ අතර එය මූලික වශයෙන්ම ප්‍රධාන මුදල් වලට සාපේක්ෂව රුපියලේ අගය වැඩි වීම නිසා සිදුවූවකි.

15.2 ණය සේවා පිරිවැය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සේවාකරණය කරනු ලැබූ ණය වෙනුවෙන් 2005 වර්ෂයේදී ගෙවන ලද මුළු ණය සේවා ගෙවීම් ප්‍රමාණය රුපියල් බිලියන 339 ක් වූ අතර දේශීය ණය වෙනුවෙන් කරන ලද ආපසු ගෙවීම් රුපියල් බිලියන 202 ක් විය. රුපියල් බිලියන 25 ක් වූ මුළු විදේශ ණය සේවා පිරිවැය කලින් වසරට වඩා සියයට 43 ක හෙවත් රුපියල් බිලියන 19 ක අඩුවීමක් වාර්තා කළේය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ විදේශ ණය ආපසු ගෙවීම කල්දැමීම තුළින් පිරිනමන ලද ණය සහනය හේතුවෙන් ණය පොලී පිරිවැයෙහි (රුපියල් බිලියන 10 ක) සහ මුල් මුදල් ආපසු ගෙවීමෙහි (රුපියල් බිලියන 17 ක) සිදු වූ අඩුවීමයි.

15.3 ණය ආපසු ගෙවීම කල්දැමීම පිළිබඳ වැඩසටහන

සුනාමි ව්‍යසනය නිසා සිදු වූ හානි සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවට මානුෂික අවශ්‍යතාවයන් හා ප්‍රතිසංස්කරණය පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා පහසුකම් ලබාදීමේ අපේක්ෂාවෙන් පැරිස් සාමාජික ණය හිමියෝ (ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, ජපානය, ඉතාලිය, නෙදර්ලන්තය, ඩෙන්මාර්කය සහ ප්‍රංශය) සහ ඉන්දියාව, කොරියාව වැනි අනෙකුත් ද්විපාර්ශ්වික ණය දෙන රටවල් 2005 වසර සඳහා ගෙවීමට නියමිත ණය සේවා ගෙවීම් ප්‍රමාද කිරීමට එකඟ වූහ. මෙම ප්‍රමාද කරන ලද ණය සේවා ගෙවීම් වසරක සහන කාලයක් සහිතව වසර 5 ක කාලයක් තුළ ගෙවිය යුතු වේ. ඒ අනුව ණය ආපසු ගෙවීම් 2006 දෙසැම්බර් මාසයේ දී ආරම්භ කළයුතු අතර, 2005 වසරේදී කල් දමන ලද උපචිත පොලිය, ප්‍රාග්ධනිත කර, ප්‍රමාද කරන ලද ණය ප්‍රමාණයක් ලෙස ගෙවිය යුතු වේ. ඉතාලි රජය තමන් වෙත ආපසු ගෙවිය යුතුව තිබූ ණය සම්පූර්ණයෙන්ම කපා හරින ලද අතර චීනය එම ණයවලින් කොටසක් කපා හරින ලදී. මේ අතර එක්සත් රාජධානිය, ලෝක බැංකුව වෙත ගෙවන

II - 10 සංඛ්‍යා සටහන

දේශීය ණය නිකුතුව හා කල්පිරීම -2005

රු. දශ ලක්ෂ

	කල්පිරීම	නිකුතුන්	ආපසු ගෙවීම්	ශුද්ධ නිකුතුන්
භාණ්ඩාගාර බිල්පත්	දින 91	259,713	213,531	46,182
	දින 182	65,826	94,561	-28,735
	දින 364	100,458	112,457	-11,999
	අනෙකුත්	59,772	74,932	-15,160
	එකතුව	485,769	495,481	-9,712
භාණ්ඩාගාර බැඳුම්කර	අවුරුදු 1	3,200	12,970	-9,770
	අවුරුදු 2	86,531	15,000	71,531
	අවුරුදු 3	103,187	77,810	25,377
	අවුරුදු 4	27,592	-	27,592
	අවුරුදු 5	5,415	14,550	-9,135
	අවුරුදු 6	-	1,000	-1,000
	අවුරුදු 8	3,625	-	3,625
	එකතුව	229,550	121,330	108,220
රුපියල් සුරැකුම්පත්	අවුරුදු 2/5	-	44,375	-44,375
	අවුරුදු 2/6	820	-	820
	අවුරුදු 4/6	4,986	-	4,986
	අවුරුදු 4/7	3,575	-	3,575
	අවුරුදු 4/8	2,868	-	2,868
	අවුරුදු 4/10	31,430	-	31,430
	අවුරුදු 7/8	-	12,500	-12,500
	එකතුව	43,679	56,875	-13,196
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	එකතුව	-	-	-
වි. ව්‍යා.මු. බැ. ඒ. වෙතින් ලබා ගත් ණය	අවුරුදු 1	58,968	17,236	41,732
	එකතුව	58,968	17,236	41,732
එකතුව		**817,966**	**690,922**	**127,044**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලද ණය සේවා ගෙවීම් වලින් සියයට 10 ක් ප්‍රතිමූල්‍යාකරණය කිරීමට එකඟ විය. ඉන්දියානු රජයෙන් ලබා දෙන ලද ණය සඳහා වසර 3 ක ආපසු ගෙවීම් කල්දැමීමේ කාල සීමාවක් ලබාදීමට එම රජය එකඟ විය. 2005 වර්ෂයේදී ණය ආපසු ගෙවීම කල්දැමීමේ ක්‍රියාමාර්ගය මගින් වූ මුළු ඉතුරුම් ප්‍රමාණය රුපියල් බිලියන 27 ක් විය.

15.4 රාජ්‍ය සුරැකුම්පත්වල ඵලද අනුපාතික

2004 වර්ෂය අවසානයේ දී ස්ථාවර තත්ත්වයකට පත්ව තිබූ රජයේ සුරැකුම්පත්වල ඵලද අනුපාතිකයන්, 2005 වර්ෂය තුළ දී ප්‍රාථමික වෙළෙඳපොළේ මෙන්ම ද්විතීයික වෙළෙඳපොළේ ද සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතයන්ගේ වෙනස්වීම්වලට සහ පැවති වෙළෙඳපොළ තත්ත්වයන්ට අනුව දින 91 කින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් පොලිය පාදකාංක 286 කින් ඉහළ ගියේය. වෙළෙඳපොළේ කෙටි කාලීන ආයෝජන පිළිබඳව වූ සංවර්ධනයන්ට අනුකූලව යමින් ඵලද වක්‍රයේ දිගුකාලීන කොටසද ඉහළට විතැන්වීමක් පෙන්නුම් කළේය. සියළුම පරිණත කාලයන්ට අයත් භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික මෙන්ම ද්විතීයික වෙළෙඳපොළ ඵලද අනුපාතිකයන් ඉහළ ගියේය. සාමාන්‍ය අගයක් වශයෙන් ගත් කළ ප්‍රාථමික වෙළෙඳපොළෙහි පරිණත කාලය වසර 2 හා වසර 3 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවල පොලී අනුපාතයන් පිළිවෙළින් පාදකාංක 152 කින් හා 163 කින් ඉහළ ගියේය.

15.5 නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය (SSSS) සහ මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) (ලංකාසෙක්‍යු - LankaSecure)

ලංකාසෙක්‍යු තුළින් සපයන ලද සේවාවන් වර්ෂය තුළ දී තවදුරටත් පුළුල් විය. ලංකාසෙක්‍යු මගින් සිදුකරන ලද ගනුදෙනුවල අගය කලින් වර්ෂය සමඟ සංසන්දනය කරන විට 2005 වර්ෂයේ දී සියයට 61 කින් වර්ධනය වී රුපියල් බිලියන 11,215 ක් විය. මෙම ගනුදෙනු, සහභාගීවන්නකුගේ ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු කිරීම, ගෙවීම් මත සුරැකුම් නිදහස් කිරීම, ගෙවීමකින් තොරව ප්‍රතිවිකුණුම් හා ප්‍රතිමිලදී ගැනුම් සහ අන්තර් දින ද්‍රවශීලතා පහසුකම් යන අංගයන්ගෙන් සමන්විත විය. මෙම ගෙවීම් පද්ධතිය තුළින් නිර්ලේඛිත භාණ්ඩාගාර බැඳුම්කර කූපන් සඳහා රුපියල් දශ ලක්ෂ 64,250 ක්ද නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 581,023 ක්ද ගෙවන ලදී.

ලංකාසෙක්‍යු පද්ධතියෙහි සහභාගිවන්නන්ගේ ගණන 32 ක් වන අතර, මෙයට බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 ක්, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක්, සේවක අර්ථසාධක අරමුදල සහ ශ්‍රී ලංකා මහ බැංකුව අයත් වේ. 2005 වර්ෂය අවසන් වන විට මෙම සහභාගිවන්නන් විසින් අදාළ පද්ධතිය තුළ පවත්වා ගෙන යනු ලැබූ ආයෝජන ගිණුම් ප්‍රමාණය 24,411 ක් විය.

2005 වර්ෂය තුළ දී ලංකාසෙක්‍යු විසින් නිකුත් කරන ලද ගනුදෙනු ප්‍රකාශන සංඛ්‍යාව 39,806 ක් වූ අතර, ගෙවීම් ප්‍රකාශන සංඛ්‍යාව 35,872 ක් විය. වර්ෂය තුළ දී පද්ධතිය මගින් සුරැකුම් හිමියන් වෙත සුරැකුම් හිමිකම් දක්වෙන ප්‍රකාශන 20,374 ක් ද නිකුත් කරන ලදී.

පද්ධතිය තුළ ගිණුම් පවත්වාගෙන යන ගිණුම් හිමිකරුවන් සඳහා ලංකාසෙක්‍යු විසින් වෙබ් අඩවිය පදනම් කරගත් ගිණුම් සත්‍යාක්ෂණය කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙය ආයෝජකයින්ට ඔවුන්ගේ සුරැකුම් හිමිකම් සහ ආදායම් ඉපයීමේ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ බලාගැනීමට අවස්ථාවක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පද්ධතිය තුළ ඇති කරන ලද අතිරේක පහසුකමක් වේ.

15.6 ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය අධීක්ෂණය කිරීම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් පිළිබඳ එතැන් සහ දුරස්ථ පරීක්ෂාව නොකඩවා සිදු කරන ලදී. විවිධ අවදානම් වර්ග සලකා බැලීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් විසින් භාවිතා කරනු ලබන අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම හඳුනාගැනීමට සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා විශේෂ එතැන් පරීක්ෂාවක් වර්ෂය තුළ දී සිදුකරන ලදී. ඒ අනුව ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අනුගමනය කරනු ලබන අනෙකුත් අවදානම් කළමනාකරණ ශිල්පක්‍රමවලට අමතරව, ව්‍යාපාර නොකඩවා පවත්වා ගෙන යාමේ සැලසුමක් සකස් කර පවත්වාගෙන යා යුතු බවට ඔවුන්ට උපදෙස් දෙන ලදී. එතැන් පරීක්ෂාවන්හි දී හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීමටත්, ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම සඳහාත් වර්ෂය මුළුල්ලේම ඔවුන් සමග වෙන් වෙන්ව සාකච්ඡා පවත්වන ලද අතර ප්‍රාථමික අලෙවිකරුවන්ගේ රැස්වීම් ද සාමාන්‍ය පරිදි පවත්වන ලදී.

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ශක්තිමත් කිරීමේ අරමුණින්, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය චක්‍රලේඛ අංක 08/24/002/0005/005 මගින් 2005 ජූලි 01 ද සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් දශ ලක්ෂ 200 සිට රුපියල් දශ ලක්ෂ 250 දක්වා ඉහළ නංවන ලදී. 2006 ජූලි 01 ද සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාග්ධන අවශ්‍යතාවය තවදුරටත් රුපියල් දශ ලක්ෂ 300 දක්වා වැඩි කිරීමටත් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ විවිධ අවදානම් මට්ටම් හඳුනාගැනීම සඳහා අවදානම මත බර තැබුණු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුවක් හඳුන්වා දීමටත් තීරණය කරන ලදී. අවදානම මත බර තැබුණු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව පිළිබඳව 2006 ජූලි මස සජීවීව හඳුන්වා දීමට පෙර සමගාමී මෙහෙයුම් සඳහා සැලසුම් සම්පාදනය කරන ලදී.

හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් 2005 ජූනි 30 වන දින සිට ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයෙන් ඉවත් විය. සීමාසහිත කොමර්ෂල් බැංකුවේ අනුබද්ධිත

ප්‍රාථමික අලෙවිකරු සමාගමක් වූ සීමාසහිත කොමර්ෂල් බැන්ක් ප්‍රයිමරි ඩීලර් සමාගම 2005 ඔක්තෝබර් 01 දින සිට එහි ප්‍රාථමික අලෙවි කටයුතු නතර කළ අතර නැවතත් මව් බැංකුව සමඟ ඒකාබද්ධ වී එම බැංකුවේ ප්‍රාථමික අලෙවිකරු ඒකකයක් ලෙස ක්‍රියාත්මක විය. 2005 වර්ෂය අවසන් වන විට ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංඛ්‍යාව 11 ක් විය.

15.7 ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු සංවර්ධනය

ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් සතිපතා ලැබෙන තොරතුරු පදනම් කරගෙන සකස් කළ දත්තයන්ට අනුව 2005 වර්ෂයේදී ප්‍රාථමික අලෙවිකරුවන් එක් පාර්ශ්වයක් ලෙස සම්බන්ධ වී කෙරුණු ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු (සෘජු මිලදී ගැනුම් සහ ප්‍රතිමිලදී ගැනුම්) කලින් වර්ෂය හා සසඳනවිට සියයට 19.7 ක අඩුවීමක් පෙන්නුම් කළේය. කෙටිකාලීන ණය සුරැකුම්පත්හි ආයෝජනය සඳහා වූ දැඩි කැමැත්ත පිළිබිඹු කරමින් භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ගනුදෙනු සියයට 6 ක වැඩිවීමක් වාර්තා කළ අතර, භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ගනුදෙනු සියයට 28 කින් සැලකිය යුතු ලෙස අඩු විය. 2004 සහ 2005 වර්ෂ අතරතුර දී මුළු ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් සියයට 6 කින් අඩු වූ අතර සෘජු විකුණුම් සියයට 17 කින් අඩු විය. ප්‍රාථමික අලෙවිකරුවන් තුළ පැවති අවදානම් දැරීමට ඇති අකැමැත්ත හේතුකොටගෙන කෙටි කාලීන වෙළෙඳපොළ ගනුදෙනු වැඩිවීම නිසා ද්විතීයික වෙළෙඳපොළ තුළ එක් දින ප්‍රතිවිකුණුම් හා ප්‍රතිමිලදී ගැනුම් සියයට 20 කින් වර්ධනය විය.

16. ප්‍රාදේශීය සංවර්ධන

ශ්‍රී ලංකා රජය සහ ආධාර සපයන ආයතනවල අනුග්‍රහය යටතේ මූල්‍යකරණය කරනු ලබන සංවර්ධන ණය යෝජනා ක්‍රම 11 ක් ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයතනය වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2005 වර්ෂය තුළ දී ද ව්‍යාපෘති මූල්‍යකරණ කටයුතු තවදුරටත් පවත්වාගෙන යන ලදී. එයට අමතරව විශේෂයෙන් සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ප්‍රදේශවල ව්‍යාපාරික කටයුතු යථා තත්ත්වයට පත්කිරීම අරමුණු කරගෙන වර්ෂය තුළ අළුතින් හඳුන්වාදුන් ණය යෝජනා ක්‍රම තුනක් ක්‍රියාවට නැංවීමේ වගකීම ද දෙපාර්තමේන්තුවට පැවරුනු අතර ඒ සමග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන මුළු ණය යෝජනා ක්‍රම සංඛ්‍යාව 14 ක් දක්වා වැඩි විය. තවද, ඇඟළුම් කර්මාන්ත නවීකරණය කිරීම සඳහා බැංකු විසින් සපයන ණය සහ සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ව්‍යාපාරික කටයුතු යළි නගාසිටුවීම උදෙසා ප්‍රදානය කෙරෙන ණය මුදල් සම්බන්ධයෙන් ණය දෙන ආයතන මුහුණ දෙන ණය අවදානමින් කොටසක් ආවරණය කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් ණය ඇප ආවරණ ක්‍රම දෙකක් හඳුන්වා දෙනු ලැබිණි. ඉදිකිරීම් අංශය සංවර්ධනය හා ශක්තිමත් කිරීම අරමුණු කරගත් ණය යෝජනා ක්‍රමයක් හා සුනාමි උවදුරින් හානිවූ යටිතල පහසුකම් යළි ඉදිකිරීමත්, ව්‍යවසාය ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමත් සඳහා වන ණය යෝජනා ක්‍රමයක් ද වෙනුවෙන් අරමුදල් සපයා ගැනීම අරමුණු කර ගනිමින් පිළිවෙලින් යුරෝපීය ආයෝජන බැංකුව (EIB) සහ ප්‍රංශ රජය සමග ශ්‍රී ලංකා රජය පවත්වාගෙන ගිය මූලික සාකච්ඡාවලට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහභාගි විය.

ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ඒ සම්බන්ධ මෙහෙයුම් උපදෙස් / මගපෙන්වීම් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කිරීම, ප්‍රතිමූල්‍ය හා රජය විසින් ලබාදෙන පොලී සහනාධාර මුදල් බැංකු වෙත ලබාදීම, ණය යෝජනා ක්‍රමවල ක්‍රියාකාරිත්වය ක්ෂේත්‍ර මට්ටමින් අධීක්ෂණය කරමින් ප්‍රතිමූල්‍ය ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම ආදිය මෙම දෙපාර්තමේතුව විසින් ඉටුකරනු ලැබේ. තවද, අදාළ අමාත්‍යාංශ, ප්‍රජාමූල සංවිධාන හා සහභාගිත්ව මූල්‍ය ආයතනවල සහයෝගය ඇතිව ඒ ඒ ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරීවන ආයතන හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා මූල්‍යාධාර සපයන අනුග්‍රාහක ආයතනවලට මෙන්ම රජයේ අවශ්‍යතාවයන් සඳහා ද දත්ත/තොරතුරු ලබාගත හැකි පරිදි වාර්තා සහ ගිණුම් පවත්වාගෙන යාම ද මෙම දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

2005 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක II - 11 දරණ සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

මෙතෙක් ක්‍රියාත්මක කෙරෙමින් පැවති ව්‍යාපෘතිවලට අමතරව මෙම වර්ෂයේදී ද සුනාමි ව්‍යසනයෙන් හානියට පත්වූ ප්‍රදේශවල ජීවනෝපාය මාර්ග යළි නගා සිටුවීමේ රජයේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙන ලද "සුනාමි සහන ණය යෝජනා ක්‍රමය" (සුසහන) ක්‍රියාත්මක කිරීමේ වගකීම ද මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. සුනාමියෙන් හානි සිදුවූ පාර්ශ්වයන්හි ජීවනෝපාය මාර්ග යළි ඇරඹීම අරමුණු කර ගනිමින් සහනදායී කොන්දේසි යටතේ ණය ප්‍රදානය කිරීම මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණ විය. ආයතනික අංශයේ බැංකු මගින් මුදහරින ලද ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් බිලියන 03 ක් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන හා කල්බදු සමාගම් විසින් මුදහරින ලද ණය මුදල් සඳහා ශ්‍රී ලංකා රජය විසින් රුපියල් බිලියන 02 ක් වශයෙන් ආරම්භයේදී රුපියල් බිලියන 05 ක මුදලක් මෙම ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කරනු ලැබීය. 2005 වර්ෂය අවසානය වනවිට සුසහන ණය යෝජනා ක්‍රමය යටතේ ආයතනික අංශයේ බැංකු ආයතන 15 ක් විසින් හානියට පත්වූ කුඩා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් 9,186 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 4,280 ක් ද, ලියාපදිංචි මූල්‍ය සමාගම් හා කල්බදු සමාගම් 15 ක් විසින් ව්‍යවසායයන් 174 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 165 ක් ණය වශයෙන් ප්‍රදානය කර තිබිණි. 2005 වර්ෂය අවසානයට එක් එක් අරමුණු වෙනුවෙන් ණය මුදහැරීම පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන් අංක II - 12 හි දක්වා ඇත.

II - 11 සංඛ්‍යා සටහන - 2005 වර්ෂය තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද ණය යෝජනා ක්‍රම

	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ආයතනය	පුළුල් අරමුණ	මූලික ප්‍රතිපාදන ණය සංරචකය	ණය ලාභීන් සඳහා පොලී අනුපාතිකය	2005.12.31 දිනට ණය මුදාහැරීම (i) ණය සංඛ්‍යාව (ii) ණය මුදල (රුපියල් දශ ලක්ෂ)	ආපසු අයකර ගැනීම ප්‍රතිශතය
1.	තේ සංවර්ධන ව්‍යාපෘතිය (1999-2005)	ආසියානු සංවර්ධන බැංකුව	කුඩා තේ වතු හිමිකරුවන්ගේ ආදායම් තත්ත්වය තිරසර මට්ටමකට ගෙන ඒම සහ ව්‍යාපෘති බලප්‍රදේශය තුළ ස්වාභාවික පරිසරය වර්ධනය කිරීම හා කුඩා තේ වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 28	ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය පදනම් කර 8.5% සිට 10.5% දක්වා සහ කර්මාන්තශාලා සංවර්ධනය සඳහා බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය+6	(i) 2,678 (ii) 2,963	96%
2.	දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (1998-2005)	- එම -	බහුවාර්ෂික බෝග ක්ෂේත්‍රය වාණිජකරණය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු මෙහෙයුම් කටයුතු සහ වෙළෙඳපල පහසුකම් ලබාදීම	වි. ගැ. හි. දශ ලක්ෂ 11,562	බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය පදනම් කර 8.5% සිට 10.5% දක්වා	(i) 6,250 (ii) 1,453	95%
3.	නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (2000-2006)	- එම -	උසස්, ගුණාත්මක ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා නිපුණතා පුහුණු කිරීමේ වැඩ සටහන්වල විශ්වසනීයත්වය සහ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සමග නිපුණතා නොගැලපීම නිසා ග්‍රාමීය හා නාගරික තරුණ/තරුණියන් අතර පවතින විරැකියාව සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම	වි. ගැ. හි. දශ ලක්ෂ 0.657	10%	(i) 549 (ii) 56	97%
4.	නාගරික සංවර්ධනය හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නිවාස ණය ව්‍යාපෘතිය	- එම -	අඩු ආදායම් ලාභී පවුල්වලට නිවාස වැඩි දියුණු කර ගැනීම පිණිස අවශ්‍ය ප්‍රාග්ධන සැපයීම.	එ.ජ. ඩොලර් දශ ලක්ෂ 20	11.9%	(i) 28,971 (ii) 1,873	91%
5.	දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය (2000-2006)	ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුව	ග්‍රාමීය දිළිඳු ජනතාවට ආදායම් උත්පාදන කාර්යයන් සඳහා කාර්යක්ෂම ලෙස විධිමත් ණය පහසුකම් ලබාගැනීමට සුදුසු යාන්ත්‍රණයක් ගොඩනැගීම හා ප්‍රතිලාභීන්ගේ ආර්ථික හා සුභසාධනය දියුණු කිරීම	යෙන් දශ ලක්ෂ 1,368	16% -20%	(i) 36,981 (ii) 741	94%
6.	සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය (1990-2005)	කෘ. සං. සඳහා වූ ජා. අ. තැන්පතු/ජාත්‍යන්තර සං. ආයතනය, ශ්‍රී ලංකා රජය	අඩු ආදායම්ලාභී ජනතාව අතර රැකියා අවස්ථාවන් බිහිකර ගැනීම සහ ඉතිරි කිරීමේ චර්යාවන් වර්ධනය කළ හැකි වන පරිදි අඩු පිරිවැය සහිත තිරසාර සුළු පරිමාණ ණය සැපයුම් ක්‍රමයක් ස්ථාපනය කිරීම.	වි. ගැ. හි. දශ ලක්ෂ 485	වෙළෙඳපොළ පවත්නා පොලී අනුපාතිකය 16% -20%	(i) 106,632 (ii) 1,513	96%
7.	මාතලේ ප්‍රදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (2000-2006)	කෘ.සං. සඳහා වූ ජා.ආ.	ව්‍යාපෘති බලප්‍රදේශය තුළ ගැමි ගොවි පවුල් සහ කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.	වි. ගැ. හි. දශ ලක්ෂ 2	12%	(i) 639 (ii) 52	94%
8.	නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය	රජයේ පොලී සහනාධාර දෙන ආයතනවල අරමුදල්	සුළු පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහිතව සහභාගීවන ණය - කෙටිකාලීන නිෂ්පාදන ණය - බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ කෘෂිද්‍රව්‍ය මිලදී ගැනීම.	සහභාගීවන ණය සම්පාදනය කිරීම. අරමුදල්	8% දෙන ආයතනවල	(i) 70,196 (ii) 1,620 වර්ෂය තුළ	91%
9.	කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (1997-2006)	ශ්‍රී ලංකා රජය	ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම මගින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම	රුපියල් දශ ලක්ෂ 100	10%	(i) 13,410 (ii) 969	92%
10.	දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (2000-2006)	ශ්‍රී ලංකා රජය	ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීමෙන් දකුණු පළාතේ ජනතාවගේ ජීවන මට්ටම නගා සිටුවීම.	එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8.1	12%	(i) 2,100 (ii) 100 - 6	90%
11.	ආපදා කළමනාකරණ වැඩසටහන් (i) සුනාමි සහන ණය යෝජනා ක්‍රමය (සුසහන)	ශ්‍රී ලංකා රජය	සුනාමි ව්‍යසනයේ බලපෑමට ලක්වූ ව්‍යාපාර යළි නගාසිටුවීම.	රුපියල් බිලියන 3	6%	(i) 9,360 (ii) 4,445	-
12.	(ii) කුඩා ව්‍යාපාර යළි නගාසිටුවීමේ වැඩසටහන	ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුව	සුනාමි ව්‍යසනයේ බලපෑමට ලක්වූ ව්‍යාපාර යළි නගාසිටුවීම.	ජපන් යෙන් බිලියන 3	6%	සුසහන ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් සමහර ණය මෙම ව්‍යාපෘතියට මාරු කරන ලදී.	සහන කාලය තුළ
13.	(iii) ජීවන ශක්ති ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	සුනාමි ව්‍යසනයේ බලපෑමට ලක්වූ කුඩා ව්‍යාපාර නැවත ඇරඹීමට සහාය දීම.	එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1	6 - 8%	(i) 371 (ii) 15	සහන කාලය තුළ
14.	ග්‍රාමීය මූල්‍ය අංශ සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය ශක්තිමත් කිරීම.	එ.ජ.ඩොලර් දශ ලක්ෂ 70	ග්‍රාමීය අංශයේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ව්‍යුහය හා හැකියාවන් වර්ධනය කිරීම පිණිස ලබාදෙන ප්‍රතිපත්තිමය ණයකි.	-	-

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රජයේ ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන වැඩසටහන යටතේ 2005 වර්ෂය අග භාගයේදී ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව (JBIC) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සුනාමි ව්‍යසනයෙන් හානියට පත්වූ කුඩා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් යළි නගාසිටුවීම සඳහා බැංකු ආයතන පද්ධතිය මගින් පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව හා එක්විය. ඒ අනුව දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල සුනාමි උවදුරින් හානියටපත් වූ ව්‍යවසායයන් වෙත මූල්‍ය පහසුකම් සැපයීම සඳහා සුසහන ණය යෝජනා ක්‍රමයට අතිරේකව මෙම දෙපාර්තමේන්තුව විසින් තවත් ණය යෝජනා ක්‍රම දෙකක් හඳුන්වා දෙනු ලැබිණි. ඒ අනුව ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය පහසුකම් යටතේ සුළු ව්‍යාපාර යළි නගාසිටුවීමේ වැඩසටහන (SBRP) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) ආධාර යටතේ "ජීවන ශක්ති" නම් වූ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන මෙම වර්ෂයේ සිව්වැනි කාර්තුවේ සිට ක්‍රියාත්මක කරන ලදී.

දිවයිනේ කෘෂි නිෂ්පාදන අලෙවිකරණය සඳහා ගොවි ජනතාව හා කෘෂිද්‍රව්‍ය ගැනුම්කරුවන් අතර ඉදිරි වෙළෙඳ ගිවිසුම් වැඩපිළිවෙළ ප්‍රවර්ධනය කිරීමේ කටයුතු ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදුකරනු ලැබිණි. ඉදිරි වෙළෙඳ ගිවිසුමක් යනු ගිවිසගත් ඉදිරි දිනයකදී කලින් නියම කරගත් මිලකට කෘෂිද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ගොවියා සහ ගැනුම්කරු අතර එළඹගන්නා ගිවිසුමකි. මෙම වැඩසටහන 1999 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එය ගොවීන් හා කෘෂිද්‍රව්‍ය ගැනුම්කරුවන් විශාල සංඛ්‍යාවකට ඔවුන්ගේ අලෙවිකරණ ගැටළු විසඳ ගැනීමට අඛණ්ඩව සහාය වී ඇත. මෙම වැඩපිළිවෙළ සඳහා දායක වන ණය දෙන ආයතන, ගැනුම්කරුවන්, ගොවීන් හා ගොවි සංවිධාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධීකරණයක් ඇති කරමින් එය දිවයින පුරා ප්‍රචලිත කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ප්‍රාදේශීය කාර්යාල හා සහභාගිවන ණය දෙන ආයතනවල ද සහයෝගය ඇතිව ඉදිරි වෙළෙඳ ගිවිසුම් වැඩසටහන ව්‍යාප්ත කිරීම සඳහා දිවයිනේ ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රදේශයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. දේශීය බඩඉරිඟු, සෝයා බෝංචි, සූරියකාන්ත ඇට, ඉඟුරු, මුං ඇට, මී පැණි හා රටකජු නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් ඉදිරි වෙළෙඳ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ අතර වී හා වෙනත් කෘෂිද්‍රව්‍ය නිෂ්පාදනය කළ ගොවීන්ට සහ ප්‍රධාන කෘෂිද්‍රව්‍ය ගැනුම්කරුවන්ට ද එමගින් ප්‍රතිලාභ ලැබිණි. විශේෂයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනවල අධික සැපයුමක් සහිත කාල වකවානුවල මිල ගණන් ස්ථායීකරණය කිරීම සඳහා ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය මගින් සිදුකෙරෙන බලපෑම පිළිබඳව අවබෝධ කර ගනිමින් එහි ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ ද එකඟතාවය ඇතිව ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ කෘෂිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා එක් ගැනුම්කරුවකුට සපයන ලද ණය මුදලේ උපරිමය 2005 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 25 සිට රුපියල් දශ ලක්ෂ 50 දක්වා වැඩි කරන ලදී.

අනුරාධපුර, මාතලේ හා මාතර ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව මෙම දෙපාර්තමේන්තුව විසින් ගොවි ජනතාව දිරිගැන්වීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් තවදුරටත් මෙහෙයවනු ලැබිණි. කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මෙම වැඩසටහන් යටතේ ඉහළ ඵලදාවක් සහිත නව දෙමුහුන් බීජ, වැඩි දියුණු කළ ගොවිපළ උපකරණ, පසු අස්වනු තාක්ෂණ ක්‍රම, ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම, ගොවීන්ට වැඩි ආදායමක් ලබාදෙන නව බෝග වර්ග හඳුන්වාදීම වැනි කරුණු පිළිබඳව අවධානය යොමු කෙරිණි. බඩඉරිඟු, ඉඟුරු සහ

II - 12 සංඛ්‍යා සටහන

සුසහන ණය යෝජනා ක්‍රමය - 2005
අරමුණ අනුව ණය මුදාහැරීම්

අරමුණ	ණයකරුවන් සංඛ්‍යාව	%	අනුමත ණය ප්‍රමාණය රු.ද.ල.	%
කෘෂිකර්මය	98	1.05	18.2	0.41
කර්මාන්ත	741	7.91	338.7	7.62
ධීවර	3,486	37.24	1,282.4	28.85
වෙළෙඳම	2,496	26.67	1,235.3	27.79
සංචාරක කටයුතු	1,219	13.02	895.7	20.15
ප්‍රවාහනය	349	3.73	196.4	4.42
ස්වයංරැකියා	283	3.03	447.2	10.06
වෙනත් සේවා	688	7.35	31.1	0.70
එකතුව	9,360	100.0	4,445.0	100.0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

II - 13 සංඛ්‍යා සටහන

ඉදිරි වෙළෙඳ ගිවිසුම් -2005

බෝගය	අත්සන් කළ ගිවිසුම් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව	තීරණය වූ ඉදිරි මිල (රු./කි.ග්‍රෑ.)	ණය දෙන ආයතන විසින් ඉදිරි වෙළෙඳ ගිවිසුම් යටතේ ප්‍රදානය කළ මිලදී ගැනීම් ණය (රු.ද.ල.)
බඩඉරිඟු	34,071	40,500	16-18	687
වී	14,270	16,200	14-17	745
සෝයා	6,700	6,700	30-38	375
මුංඇට	1,200	1,200	47-52	51
ඉඳල් ඉරිඟු	520	540	20-25	14
ඉඟුරු	610	610	370	-
වෙනත් බෝග*	11,800	11,800	20-65	540
එකතුව	69,171	77,550	-	2,412

මූලය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

* තල, පැපොල්, සූරියකාන්ත, එළවළු

සූරියකාන්ත වගාවන්හි නිරත වූ ගොවීන්ගේ නිෂ්පාදන ඵලදායිතාවය මෙන්ම ආදායම් තත්ත්වයේ ද ඉහළ වර්ධනයක් මෙම වර්ෂයේ දී නිරීක්ෂණය කරන ලදී. කෘෂිකාර්මික ඵලදායිතාව නැංවීමේ වැඩසටහන යටතේ නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් කෘෂි යෙදවුම් සැපයුම්කරුවන්, බීජ ආනයනකරුවන්, බීජ නිෂ්පාදකයින්, කෘෂි නිෂ්පාදන ගැනුම්කරුවන්, අපනයනකරුවන් සහ සහභාගිවන මූල්‍ය ආයතන ද සමග රැස්වීම් කිහිපයක් අදාළ වර්ෂය තුළ දී සංවිධානය කරන ලදී. රජයේ පොලී සහනාධාර වැඩපිළිවෙලෙහි සහාය ඇතිව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) ව්‍යාප්ත කිරීම මගින් ඉදිරි වෙළෙඳ ගිවිසුම් හා කෘෂි නිෂ්පාදනවල ඵලදායීතාවය නැංවීමේ වැඩසටහන් ද ප්‍රවර්ධනය කරන ලදී. 2004/2005 මහ කන්නය සහ 2005 යල කන්නයේ දී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිවන මූල්‍ය ආයතන විසින් ගොවීන් 66,953 දෙනෙකු හා වී මිලදී ගන්නන් 1,269 දෙනෙකු වෙත රුපියල් බිලියන 4 ක ණය ප්‍රදානය කර තිබිණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකු 06 හි දීර්ඝකාලීන මූල්‍යමය ශක්‍යතාව තහවුරු කර ගැනීම අරමුණු කර ගනිමින් එම බැංකුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. සාර්ථකත්වය මනිනු ලබන සෑම මූල්‍ය දර්ශකයක් යටතේම ප්‍රාදේශීය සංවර්ධන බැංකු සතුටුදායක වර්ධනයක් ළඟාකර ගෙන තිබූ අතර 2005 වර්ෂයේ දී එම බැංකුවල වාර්තාගත ලාභදායීතාවය ඒවායේ අයවැය ඉලක්ක ද ඉක්මවා තිබිණි. ග්‍රාමීය මූල්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (RFSDP) යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සංවර්ධන බැංකු ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට අනුකූලව ඉහත සඳහන් බැංකුවල ශ්‍රී ලංකා මහ බැංකුව සතුව තිබූ සියළුම කොටස් හා ණයකර 2005 ජූනි මාසයේ දී ශ්‍රී ලංකා රජය වෙත පවරා දෙනු ලැබිණි. ඒ අනුව 2004 වර්ෂය අවසානයට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල පැවැති ශුද්ධ වත්කම් වටිනාකම පදනම් කොටගෙන ගණනය කරන ලද වටිනාකමට, නාමික අගය අනුව රුපියල් දශ ලක්ෂ 160 ක වටිනාකමක් සහිත වූ දශ ලක්ෂ 16 ක කොටස් ප්‍රමාණය රජය වෙත පවරනු ලැබිණි. මෙම කොටස් පැවරීමෙන් පසුව ප්‍රාදේශීය සංවර්ධන බැංකු සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබූ, ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කාර්යය ද අවසන් විය.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කරනු ලැබූ තේ සංවර්ධන ව්‍යාපෘතිය, දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය සහ නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යන ණය යෝජනා ක්‍රම සැලසුම් කර තිබූ පරිදි 2005 වර්ෂය තුළ දී සාර්ථකව අවසන් කෙරිණි. අදළ අමාත්‍යාංශවල ඉල්ලීම පරිදි මුලින් සඳහන් කළ ණය ව්‍යාපෘති දෙකෙහි ආපසු අයවීම් යොදාගෙන චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රම ඇරඹීම සම්බන්ධයෙන් වර්ෂය තුළ දී එකඟතාවයන්ට එළැඹිණි.

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මාතර, අනුරාධපුර හා මාතලේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ

II - 14 සංඛ්‍යා සටහන

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදාහැරීම් - 2004/2005

වගා කන්නය	ගොවීන් සංඛ්‍යාව	ණය ප්‍රමාණය (රු.ද.ල.)	කෘෂිද්‍රව්‍ය මිලදී ගන්නන් සංඛ්‍යාව	ණය ප්‍රමාණය (රු.ද.ල.)
2004/05 මහ	39,641	964.9	678	1,389.5
2005 යල	27,312	655.5	591	1,022.8
එකතුව	66,953	1,620.4	1,269	2,412.3

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය කාර්යාල මගින් ඒ ඒ ප්‍රදේශයන්හි පවත්වාගෙන ගිය සේවා කටයුතු තවදුරටත් පවත්වාගෙන යන ලදී. මාතලේ හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල අදළ ප්‍රදේශයන්හි ඉතා දුෂ්කර ගම්මාන වෙත පවා සිය මූල්‍යමය හා මූල්‍යමය නොවන සේවා පහසුකම් වර්ධනය කරමින් එම ජන කොටස්වල ආර්ථික හා සමාජ තත්ත්වය නඟාසිටුවීමට කටයුතු කර ඇත. මාතර ප්‍රාදේශීය කාර්යාලය දකුණු පළාතේ ක්‍රියාත්මක කරන "සුසහන" ණය යෝජනා ක්‍රමය සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා දායකවෙමින් මෙම දෙපාර්තමේන්තුවට සහාය විය. එමෙන්ම ප්‍රාදේශීය දත්ත හා තොරතුරු රැස්කිරීම හා වෙනත් සේවා සැපයීම මගින් සියළුම ප්‍රාදේශීය කාර්යාල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තුවලට ද සහාය වූ අතර ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය තුළින් කෘෂිද්‍රව්‍ය අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීමේ හා කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව නැංවීමේ වැඩසටහන් සඳහා තවදුරටත් දායක විය. තවද උතුරු හා මධ්‍යම පළාත්වල වී, බඩඉරිඟු, සෝයා බෝංචි, ඉඟුරු හා පැපොල් යන බෝග අලෙවිය සඳහා අත්සන් කරන ලද රුපියල් දශ ලක්ෂ 815 ක් වටිනා ඉදිරි වෙළෙඳ ගිවිසුම් 33,700 කට අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල විසින් පහසුකම් සපයන ලදී.

17. ලේකම්

ලේකම් දෙපාර්තමේන්තුව සිය සාමාන්‍ය පරිපාලන කටයුතු වන බැංකුවට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සම්පාදනය කිරීම, බැංකු නිලධාරීන්ගේ විදේශීය හා දේශීය ගමන් සම්බන්ධ කටයුතු, සාමාන්‍ය පරිපාලන කටයුතු, සංධාන කටයුතු, නිවාඩු ප්‍රතිපත්ති කටයුතු සහ අභාවිත භාණ්ඩ බැහැර කිරීම ආදී අනෙකුත් විවිධ පරිපාලන ක්‍රියාවන්හි 2005 වර්ෂයේදී ද නොකඩවා නියැලුනි. ගමන්, භාණ්ඩ හා සේවා සම්පාදනය සහ අත්තිකාරම් පියවීම්වලට අදල සියලු ගෙවීම් ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. සේවා සපයන ආයතනයක සහාය ලබා ගනිමින් තැපැල් කාමරයේ මෙහෙයුම් කටයුතු ද කාර්යක්ෂමව පවත්වා ගෙන යන ලදී.

මහ බැංකු නවීකරණ වැඩ පිළිවෙලේ කොටසක් ලෙස ක්‍රියාත්මක කරන ලද කලින් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ දෙවැනි අදියර යටතේ ලේකම් දෙපාර්තමේන්තුවේ

සේවා නියුක්තිකයන් අට දෙනෙකු 2005 වසර අවසානයේදී විශ්‍රාම ගන්නා ලදී.

18. ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්, එහි ගොඩනැගිලි සහ සියළු දේපළ මෙන්ම බැංකුව සතු මුදල් ආරක්ෂා කිරීමේ සම්පූර්ණ වගකීම, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ.

(i) යම් හදිසි අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉටුවිය යුතු අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවනු පිණිස සකස් කරන ලද "මහ බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ සැලැස්ම" සඳහා ගතවූ වසර තුළ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රීයව දායක විය.

(ii) ඕනෑම හදිසි අවස්ථාවකට මුහුණ දී ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීමට හැකිවනු පිණිස "දෙපාර්තමේන්තු හදිසි අවස්ථා සම්බන්ධ සැළසුමක්" සකස් කරනු ලැබීය. මෙම සැලැස්ම යටතේ එවැනි හදිසි අවස්ථා පාලනය කිරීමටත්, අවශ්‍ය අය සඳහා ප්‍රථමාධාර ලබාදීමටත්, ඉතා ආරක්ෂාකාරී ලෙස සේවකයින් බැංකු පරිශ්‍රයෙන් ඉවතට ගෙනයාම සඳහාත් අවශ්‍ය විශේෂ කණ්ඩායම් පුහුණු කරනු ලැබීය.

(iii) මහ බැංකු මූලස්ථානයේ සේවක මහත්ම/මහත්මීන්ට අමතරව රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල මහත්ම/මහත්මීන්ටද හදිසි ගින්නකදී ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධ පුහුණු සැසි පවත්වන ලදී.

(iv) ආරක්ෂක නිලධාරීන්ගේ වාර්ෂික ගිනි අවි පුහුණු සහ ජීව වෙඩි තැබීම 2005 නොවැම්බර් මස 20, දෙසැම්බර් මස 03 සහ 04 යන දිනවලදී පවත්වන ලදී.

(v) ගතවූ වසර තුළ මහ බැංකු මූලස්ථානයේ සහ රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ආරක්ෂක සේවාවන් සවිමත් කිරීමට පියවර ගෙන ඇත.

(vi) සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩ සටහන් මගින් ආරක්ෂක නිලධාරීන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීමට අවශ්‍ය විශේෂ වැඩ පිළිවෙලක් ගතවූ වසර තුළ ක්‍රියාත්මක කර ඇත.

19. සංඛ්‍යාන

දත්ත සහ ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ජාතික ගිණුම්, මිල සහ වැටුප්, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය සහ අනෙකුත් සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය සහ බෙදාහැරීම හා සම්බන්ධ කටයුතු 2005 වසරේදී ද සිදුකළේය. සමාජ ආර්ථික දත්තවල ගුණාත්මක භාවය සහ යාවත්කාලීන භාවය වැඩි දියුණු කිරීම සඳහා දනට පවත්වාගෙන යනු ලබන දත්ත වැඩ සටහන් වැඩි දියුණු කිරීමටත්, අලුත් දත්ත වැඩ සටහන් හඳුන්වා දීමටත් දෙපාර්තමේන්තුව අවධානය යොමු කළේය. 2003/2004 සමාජ ආර්ථික සමීක්ෂණයේ වාර්තාව මුද්‍රිත මාධ්‍යයෙන් හා විද්‍යුත් මාධ්‍යයෙන් එළිදක්වීමත්, අනතුරුව මහජන සම්මන්ත්‍රණ සහ දේශන රාශියකදී ඒ හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී ලබාගත් ජයග්‍රහණවලින් එකකි. ඊට අමතරව මහ බැංකුව විසින් වර්ෂය පුරා පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ මාධ්‍ය සාකච්ඡා සඳහා සම්පත් දායකයන් සැපයීමෙන් එම කටයුතුවලට ක්‍රියාශීලීව සම්බන්ධ විය. දෙපාර්තමේන්තුවෙහි වැඩ කටයුතුවල ගුණාත්මක භාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා දායකවන කාර්ය මණ්ඩලයේ දැනුම සහ දක්ෂතාවන් වැඩි දියුණු කිරීම හා සම්බන්ධ පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණවලට නිලධාරීන් වැඩි පිරිසක් සහභාගි වූහ.

19.1 2003/04 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය

දෙපාර්තමේන්තුව විසින් කාලීනව සිදුකරනු ලබන වැඩ සටහනක් වන 2003/04 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයේ කටයුතු සමාප්ත කිරීම වසරේදී සිදුවිය. මෙය 1953 දී ආරම්භ කරන ලද බහුකාර්ය කුටුම්භ සමීක්ෂණ මාලාවේ අටවැන්න විය. මෙම සමීක්ෂණයේ විශාල ජයග්‍රහණයක් වූයේ නැගෙනහිර පළාතේ සහ කිලිනොච්චි, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක හැර උතුරු පළාතේ අනෙකුත් ප්‍රදේශවල කුටුම්භයන් ආවරණය කිරීමට සමත්වීමයි.

2003/04 සමීක්ෂණ වාර්තාව කොටස් දෙකකින් නිකුත් කරන ලදී. වාර්තාවේ පළමු කොටසට ජනගහනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය, ශ්‍රම බලකාය, නිවාස සහ ජීවන තත්ත්වයන්, ආදායම, පරිභෝජනය සහ වියදම, සහ කුටුම්භවල ඉතිරිකිරීම්, ආයෝජනය සහ ණය ගැනීම් යන ක්ෂේත්‍රයන් ආවරණය වූ දත්ත සම්බන්ධ විශ්ලේෂණයක් සහ සමස්ත නිරීක්ෂණයන් අඩංගු විය. 1996/97 දී පවත්වන ලද සමීක්ෂණයේ දත්ත සමග සංසන්දනයක්ද පළමු කොටසට ඇතුළත් විය. පළමු කොටසේ අංශ හතක් යටතේ ආවරණය වූ සවිස්තරාත්මක තොරතුරු පළාත් සහ අංශ (නාගරික,ග්‍රාමීය සහ වතු) යටතේ වාර්තාවේ දෙවන කොටසෙහි සපයන ලදී. තොරතුරු බෙදහැරීම පුළුල් කරනුවස්, 2003/04 සමීක්ෂණයේ නිරීක්ෂණයන් සංක්ෂිප්තව සිංහල සහ දෙමළ මාධ්‍යයෙන්ද, වාර්තාවේ පළමු සහ දෙවන කොටස් සමගම 2005 සැප්තැම්බර් මාසයේදී නිකුත් කරන ලදී. ඊට අමතරව, 2003/04 සහ 1996/97 සමීක්ෂණ වල ක්ෂුද්‍ර දත්ත (Micro data) ද පර්යේෂණ කටයුතු සඳහා සංයුක්ත තැටි මාර්ගයෙන් නිකුත් කරන ලදී. වියදම් පියවා ගැනීමේ අරමුණ ඇතිව අලෙවිකරන ලද ක්ෂුද්‍ර දත්ත සහ වාර්තා

වලින් 2006 මාර්තු මාසය වන විට රුපියල් දශ ලක්ෂ 1.5 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් උපයාගෙන තිබුණි.

19.2 දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය

මිල සහ වැටුප් පිළිබඳ දත්ත රැස්කිරීම, ඒවා විශ්ලේෂණය කිරීම සහ දත්ත බෙදාහැරීම දිගටම පවත්වා ගෙන යන ලදී. උතුරු නැගෙනහිර ප්‍රදේශවලට දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන පුළුල් කිරීමත් සමග දෙපාර්තමේන්තුව විසින් 2005 දී මධ්‍යස්ථාන 107 කින් දත්ත රැස්කරන ලදී. දත්ත රැස්කිරීම සඳහා දත්ත රැස්කිරීමේ අළුත් ආකෘතීන් හඳුන්වා දීමත් සමගම දත්තවල ගුණාත්මක භාවය සහ යාවත්කාලීන භාවය ඉහළ නැංවීම සඳහා වසර ආරම්භයේදී සකස්කරන ලද දින සටහනට අනුව දත්ත රැස්කරන ගුරු භවතුන් අධීක්ෂණය කිරීම වඩා ශක්තිමත් කරන ලදී. ලැබෙන තොරතුරු කාර්යාලයේ සිට අධීක්ෂණය කිරීම සහ ක්ෂේත්‍රයට ගොස් දත්ත සමීක්ෂණයන් අධීක්ෂණය කිරීම යන අධීක්ෂණ ක්‍රම දෙකම අනුගමනය කරන ලද අතර, උතුරු හා නැගෙනහිර පළාතේ පිහිටුවන ලද මධ්‍යස්ථාන 7 ක් සම්බන්ධයෙන් පමණක් කාර්යාලයේ සිට දත්ත රැස්කිරීම අධීක්ෂණය සිදුකරන ලදී. දත්ත රැස්කිරීමේ නිරවද්‍යතාවය, දත්තවල ගුණාත්මක භාවය, කාර්යක්ෂමතාවය සහ යාවත්කාලීන භාවය වැඩිදියුණු කිරීමත්, කාලීනව ආර්ථිකයේ ඇතිවන වෙනස්කම් පිළිබඳව දත්ත සමීක්ෂකයන් දැනුවත් කිරීමත් අරමුණු කර ගනිමින්, පෙර වර්ෂවල දී මෙන් කොළඹ, මාතර, අනුරාධපුර සහ මහනුවර දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණවල දී ලබා ගන්නා දැනුම ගුරුවරුන් වෙතින් ශිෂ්‍යයින්ට මෙන්ම සමාජයේ අනෙකුත් කොටස්වලට ද ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. දත්ත රැස්කිරීම් මධ්‍යස්ථාන මනාව සංවිධානය කිරීමේ මූලික කටයුතු ද වර්ෂය තුළ දී නිම කරන ලදී.

19.3 ජාතික සහ ප්‍රාදේශීය ආදායම් ගිණුම්

ශ්‍රී ලංකාවේ ජාතික ආදායම් ගිණුම් තවදුරටත් වැඩි දියුණු කරමින්, වාර්ෂිකව සහ කාර්තුමය වශයෙන් ගණනය කිරීමත්, එම තොරතුරු බෙදාහැරීමත් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් පවත්වා ගෙන යන ලදී. 2003/04 පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ තොරතුරු යොදගනිමින්, පෞද්ගලික පරිභෝජනය පිළිබඳ ඇස්තමේන්තු තවදුරටත් වැඩි දියුණු කරන ලදී. ජාතික ආදායම් ගිණුම් දත්ත පදනම සඳහා සේවක අර්ථ සාධක අරමුදලෙහි තොරතුරු යොද ගැනීම සඳහා පසුගිය වසරේ දී ආරම්භ කරන ලද වැඩ සටහන 2005 දී තවදුරටත් වැඩි දියුණු කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලේඛනගත කර ඇති සමාගම්වලින් දළ දේශීය නිෂ්පාදනයට වන දායකත්වය ඇගයීම සඳහා එම සමාගම්වල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කරන ලදී. වාර්ෂික සහ කාර්තුමය ජාතික දළ දේශීය නිෂ්පාදිතය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර කර්මාන්ත වර්ගීකරණය යොද ගන්නා ලදී. කාර්තුමය ජාතික ගිණුම්වල වියදම් අංශයෙහි දත්ත ශ්‍රේණියක් සකස් කිරීම සඳහා 2003 දී ආරම්භ කරන ලද වැඩ සටහන් 2005 දී ද පවත්වා ගෙන යන ලදී.

පසුගිය වසරේ මෙන් දෙපාර්තමේන්තුව 2004 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය පළාත් වශයෙන් වෙන්කොට සකස් කරන ලද ඇස්තමේන්තු වසරක කාල පමාවක් ඇතිව ඉදිරිපත් කරන ලදී.

19.4 මිල, වැටුප් සහ සේවා නියුක්තිය

දෙපාර්තමේන්තුව විසින් මිල දර්ශක හයක් ගණනය කොට විශ්ලේෂණය කරන ලදී. ප්‍රාදේශීය මිල දර්ශක පහක් මගින් වෙනත් ප්‍රදේශ පහක මිල වෙනස්කම් ගණනය කරනු ලැබූ අතර, තොග මිල දර්ශකය මගින් තොග මිල හෝ නිෂ්පාදන මිල වෙනස්වීම් ගණනය කරන ලදී. බාහිර ආයතනයන් හරහා සේවා ලබා ගැනීමේ ක්‍රමයෙන් හෝ දීපව්‍යාප්ත දත්ත රැස්කිරීම් ක්‍රමය මගින් මිල දර්ශක ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කරන ලදී. බාහිර ආයතන හරහා දත්ත රැස්කිරීම මගින් කොළඹ දිස්ත්‍රික්කයේ වෙළෙඳ මධ්‍යස්ථාන 7 කින් සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 3 කින් තොරතුරු රැස්කරන ලදී.

ඊට අමතරව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය පදනම්ව මිල වෙනස්වීම් විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පවත්වා ගෙන එන ලදී. කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිළිබඳව මාධ්‍යයන්ට ප්‍රකාශන නිකුත් කිරීම දිගටම පවත්වාගෙන එන ලදී. අසංවිධිත අංශයෙහි දෛනික වැටුප් පිළිබඳ තොරතුරුවල ආවරණය සහ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා අසංවිධිත අංශයෙහි වැටුප් දර්ශකය වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. 2003/04 පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයෙහි දත්ත භාවිතා කරමින් පළාත් මිල දර්ශක ගණනය කිරීමේ වැඩසටහනක් 2005 දී ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳ පවත්වනු ලබන වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ජාතික ගිණුම් සහ කාර්තුමය වාර්තාවන් සම්පාදනය සඳහා එම සමීක්ෂණ තොරතුරු යොද ගන්නා ලදී. වාර්ෂික සහ අර්ධ වාර්ෂික ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂණයන්ට අමතරව, විදේශීය සේවා නියුක්තිය, සේවා සේවක සම්බන්ධතාවන් සහ ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංවිධානයන් ආවරණය වන ආකාරයට ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ කාර්තුමය විශ්ලේෂණයක් හඳුන්වා දෙන ලදී.

19.5 තොරතුරු බෙදාහැරීම

2005 සැප්තැම්බර් මාසයේ දී නිකුත් කරන ලද 2003/04 පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණ ප්‍රකාශනවලට අමතරව, 2005 ජූනි මාසයේ දී සමාජ

ආර්ථික දත්ත(xxviii වෙළුම) සහ නොවැම්බර් මාසයේ දී "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2005" (xxvii වෙළුම) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී. 2003/04 සමීක්ෂණයේ දත්ත දෙපාර්තමේන්තුවේ සෑම ප්‍රකාශනයකටම ඇතුළත් කරන ලද අතර, 2006 ශ්‍රී ලංකා මහ බැංකුවේ දිනපොත යාවත්කාලීන කිරීමට ද, යොදා ගන්නා ලදී.

දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශ සඳහා වසරපුරා දායක විය. ජාතික ගිණුම්, උද්ධමනය, මිල, වැටුප් සහ ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධ ප්‍රධාන නිරීක්ෂණයන් සම්බන්ධව මුදල් මණ්ඩලය කාර්තුමය සහ වාර්ෂික පදනමින් දැනුවත් කරන ලදී. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන Sta.net නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලද අතර, වසර පුරා බැංකුවේ වෙබ් අඩවියට තොරතුරු සැපයීමට දායක විය.

19.6 මහජනතාව දැනුවත් කිරීමේ මහ බැංකුවේ වැඩ සටහන

මහ බැංකුව, රජය, පෞද්ගලික සංවිධාන, අධ්‍යාපන ආයතන සහ මාධ්‍ය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ, වැඩ මුළු, පුහුණු වැඩසටහන් සහ මාධ්‍ය සාකච්ඡා සඳහා සම්පත් දායකයන් ලෙස දෙපාර්තමේන්තුවේ නිලධාරින් නිරන්තරයෙන් සහභාගි වූහ. කොළඹ විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ උපාධිධාරීන් සඳහා නේවාසික කාර්මික පුහුණුව ලබාදීමත්, මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධිධාරී සංවර්ධන වැඩ සටහනට සහයෝගය දැක්වීමත් 2005 වසරේදී ද සිදුකරන ලදී.

20. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

ලියාපදිංචි වී ඇති මුදල් සමාගම් සඳහා මහ බැංකුව විසින් පනවා ඇති විචක්ෂණ අවශ්‍යතාවයන් එම සමාගම් විසින් පිළිපදින්නේ දැයි තහවුරු කිරීමේ අරමුණෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් සමාගම් විධිමත් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කටයුතු කරගෙන යන ලදී. කල්බදු මූල්‍යකරණ සමාගම් ලියාපදිංචි කිරීමේ, විධිමත් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්ද දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

වර්ෂය තුළ දී එක් මුදල් සමාගමක් සහ කල්බදු මූල්‍යකරණ ආයතන තුනක් ලියාපදිංචි කළ අතර 2005 වර්ෂය අවසන් වන විට ලියාපදිංචි මුළු මුදල් සමාගම් සංඛ්‍යාව 28 ක් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන සංඛ්‍යාව 68 ක් විය.

20.1 ලියාපදිංචි මුදල් සමාගම්

(අ) දුරස්ථ අධීක්ෂණ ක්‍රමය

දුරස්ථ අධීක්ෂණ ක්‍රියාවලියේදී, මුදල් සමාගම්වල මූල්‍ය තත්ත්වය පිළිබඳව සොයා බැලීම සහ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ නිකුත් කරන විධානයන්ට සහ රීතිවලට අනුකූලව මුදල් සමාගම් කටයුතු කරන්නේද යන්න සොයා බැලීම සඳහා එම සමාගම් විසින් කාලීනව සපයන වාර්තා විශ්ලේෂණය කරන ලදී. මුදල් සමාගම් පනත යටතේ නිකුත් කරන ලද විධානයන්ට, අවම ප්‍රාග්ධන සහ ද්‍රවශීල අවශ්‍යතාවන්, බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම්, තනි පුද්ගල ණය සීමා සහ ස්කන්ධ ආයෝජන පිළිබඳ සීමා ඇතුළත් විය.

ආයතන කීපයක් සම්බන්ධව ඇතැම් අවස්ථාවල අනුකූල නොවීම් දක්නට ලැබුණද, පොදුවේ ගත් කල, ලියාපදිංචි මුදල් සමාගම් විචක්ෂණ විධානයන්ට නොකඩවා අනුකූල විය. එසේ අනුකූල නොවූ ලියාපදිංචි මුදල් සමාගම්වලට, එම විධාන කඩ කිරීම් නිවැරදි කිරීම සඳහා නිශ්චිත කාල සීමාවන් දෙන ලද අතර දෙපාර්තමේන්තුව විසින් සමාගම් විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග සමීපව නිරීක්ෂණය කරන ලදී.

(ආ) එතැන් පරීක්ෂණ ක්‍රමය

ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, වත්කම්වල ගුණාත්මක බව, කළමනාකරණයේ කාර්යක්ෂම බව, ඉපයීම්, ද්‍රවශීලතාවය, අභ්‍යන්තර පාලනයන් හා විධි සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයනට අනුකූල වීම ඇගයීම සඳහා, වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි මුදල් සමාගම් 4 ක පූර්ණ එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. අනෙකුත් ලියාපදිංචි මුදල් සමාගම් 24 සීමිත එතැන් පරීක්ෂණයන්ට භාජනය කරන ලදී. මෙම සීමිත එතැන් පරීක්ෂණයන් මගින් විධානයන් කඩකිරීම් සහ අභ්‍යන්තර ක්‍රමවේද සහ පාලනයන්ගේ අඩුපාඩු යනාදි තෝරාගත් ඉතා වැදගත් අංශයන් ආවරණය කරන ලදී.

එතැන් පරීක්ෂණයන්ගේ සොයාගැනීම් අදාළ ලියාපදිංචි මුදල් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සමග සාකච්ඡා කළ අතර එම අඩුපාඩු මඟහැරීම සඳහා ඉක්මන් පියවර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලදී. හැකි සෑම අවස්ථාවකම ඉක්මන් නිවැරදි කිරීමේ පියවර ගන්නා ලද අතර ඉතිරි අඩුපාඩු මගහැරවීම සඳහා අදාල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ස්ථිර පොරොන්දු දෙන ලදී.

(ඇ) විධාන සහ රීති නිකුත් කිරීම

වර්ෂය තුළ දී, 2002 අංක 1 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානය වෙනුවට 2005 අංක 1 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානය නිකුත් කල අතර එමගින් මුදල් සමාගම්වලට ඉතිරිකිරීමේ තැන්පතු භාරගැනීමට අවසර දෙන ලදී. මුදල් සමාගම් විසින් ඉතිරිකිරීමේ තැන්පතු භාර ගැනීමට අදළ විචක්ෂණ අවශ්‍යතාවයන් ඇතුළත් කිරීම සඳහා 2005 අංක 2 දරන මුදල් සමාගම් (පොලී) විධානය සහ 2005 අංක 3 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය, අදළ පවතින විධාන වෙනුවට නිකුත් කරන ලදී. ඉතිරිකිරීමේ තැන්පතු මාර්ගයෙන්, ලියාපදිංචි මුදල් සමාගම් වලට අඩු වියදමින් අරමුදල් රැස්කර ගත හැකිවීම සහ තැන්පත් කරුවන්ට විකල්ප ආයෝජන අවස්ථාවක් ලබාදීම එම විධානයන්ගේ අරමුණ විය. 2005 වර්ෂය තුළ දී, පහත සඳහන් විධානයන් සහ රීතීන් ද නිකුත් කරන ලදී.

(i) 2005 අංක 4 දරන මුදල් සමාගම් (ව්‍යාපාර කටයුතු සඳහා කාර්යාලයන් වසාදැමීම) විධානය

(ii) 2005 අංක 5 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය

(iii) 2005 අංක 6 දරන මුදල් සමාගම් (ශාඛා/කාර්යාල විවෘත කිරීම/ස්ථාන වෙනස් කිරීම/වැසීම) විධානය

(iv) 2005 අංක 1 දරන මුදල් සමාගම් (ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර දීමේ) රීති

20.2 ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

(අ) කල්බදු මූල්‍යකරණ ආයතන ලියාපදිංචි කිරීම

කල්බදු මූල්‍යකරණ පනතට අනුව කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා පනත යටතේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. වර්ෂය තුළ දී, කල්බදු මූල්‍යකරණ කටයුතුවල යෙදීම සඳහා බලපත්‍ර ලාභී වාණිජ බැංකුවක් සහ පොදු සමාගම් දෙකක් (විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ලෙස හඳුන්වන) කල්බදු මූල්‍යකරණ පනතේ විධිවිධානයන් යටතේ ලියාපදිංචි කරන ලදී. 2005 වර්ෂය අවසන් වන විට, බලපත්‍රලාභී වාණිජ බැංකු 13 ක්ද, බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 ක්ද, ලියාපදිංචි මුදල් සමාගම් 28 ක්ද සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 20 ක්ද වශයෙන් මුළු ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන සංඛ්‍යාව 68 ක් විය.

(ආ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලින් වැදගත් තොරතුරු නොකඩවා ලබාගැනීමේ පදනමින්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2003 අගෝස්තු මාසයේ දී විධානයක් නිකුත් කරන ලදී. එතැන් සිට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වල කටයුතු දෙපාර්තමේන්තුව විසින් සමීපව අධීක්ෂණය කරන ලදී. කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාරික ලක්ෂණ සහ බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් සඳහා දනට පවතින විධිමත් කිරීම් සලකා බැලීමෙන් අනතුරුව, විශේෂිත කල් බදු මූල්‍යකරණ සමාගම් විසින් මනා ලෙස සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ ස්ථායීතාවය වර්ධනය අරමුණු කරගෙන දෙපාර්තමේන්තුව විසින් එම සමාගම් වෙත පහත සඳහන් විධානයන් 2005 දෙසැම්බර් 28 දින නිකුත් කරන ලදී.

(i) 2005 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම ප්‍රාග්ධන) විධානය

(ii) 2005 අංක 2 දරන කල්බදු මූල්‍යකරණ (බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම) විධානය

(iii) 2005 අංක 3 දරන කල්බදු මූල්‍යකරණ (තනි ණය ගැණුම්කරු සීමා) විධානය

(iv) 2005 අංක 4 දරන කල්බදු මූල්‍යකරණ (තෝරලන අනුපාත) විධානය

(v) 2005 අංක 5 දරන කල්බදු මූල්‍යකරණ (උපචිත පොලී) විධානය

(vi) 2005 අංක 6 දරන කල්බදු මූල්‍යකරණ (සංචිත අරමුදල්) විධානය

මෙම විධානයන් 2006 ජනවාරි 02 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය.

එමෙන්ම, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම්වල කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු පිළිබඳව සංඛ්‍යා දත්තයන් කාර්තු පදනම මත රැස්කිරීම සඳහා පියවර ගන්නා ලදී.

20.3 අසාර්ථක වූ මුදල් සමාගම්

මුදල් සමාගම් පනතේ විධිවිධානයන් යටතේ 1988 සිට මුදල් මණ්ඩලය විසින් පවරාගත් අසාර්ථක වූ මුදල් සමාගම් ගණන 9 ක් විය. 2005 වර්ෂය මුලදී මින් සමාගම් 6 ක් ඈවර කිරීමේ කටයුතු සිදුවෙමින් තිබුණි. මින් සමාගම් දෙකක් වර්ෂය තුළ දී ගණන් බේරා වසා දමන ලද අතර ඉතිරි සමාගම් හතරෙහි ඈවර කටයුතු තවදුරටත් සිදුවෙමින් පැවතුණි.

2005 වර්ෂය තුළ දී ඉතිරි සමාගම් තුනෙන් දෙකක් ඈවරකරුවනට භාර දෙන ලදී. අනුබද්ධිත සමාගමකින් අයවීමට තිබූ ණය මුදලක් අයකර ගැනීමට සමත්වූ අනෙක් සමාගම, තැන්පතුවලින් තවත් කොටසක් ගෙවීමේ කටයුතු ආරම්භ කළ අතර එම සමාගම මහ බැංකුවෙන් ලබාගත් ණය මුදලින් කොටසක් ද පියවන ලදි.

20.4 අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතු කිරීම

නීත්‍යානුකූල අවසරයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යන බවට සැකයට භාජනය වූ ආයතන පිළිබඳ විමර්ශන කටයුතු දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. එවැනි ආයතන 11 ක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද වාර්තා සලකා බැලීමෙන් පසු එම සමාගම් මුදල් සමාගම් පනතේ විධිවිධානයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර කරගෙන යන බවට මුදල් මණ්ඩලය, මුදල් සමාගම් පනතේ 11 (2) වගන්තිය ප්‍රකාර තීන්දු කරන ලදී. මුදල් සමාගම් පනතේ විධිවිධානයන් යටතේ එම සමාගම් සම්බන්ධව නිසි පියවර ගන්නා ලදී.

නීත්‍යානුකූල බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යන ලද්දේ යැයි තීරණය කරනු ලැබූ සමාගමකට මුදල් මණ්ඩලය නිකුත් කළ විධානයන් සපුරාලීමට නොහැකි වීම නිසා, වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් එම සමාගමට එරෙහිව නීතිමය පියවර ආරම්භ කරන ලදී. මුදල් සමාගම් පනත යටතේ සිදු කළ වරදවල් සඳහා ආයතන 6 කට එරෙහිව වර්ෂය අවසාන වනවිට මහ බැංකුව විසින් නඩු ගොනු කර තිබුණි.

2004 සැප්තැම්බර් 22 දින අභියාචනාධිකරණය විසින් දෙන ලද තීන්දුවකට එරෙහිව සමාගම් දෙකක් විසින් කරන ලද අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2005 මාර්තු මස ප්‍රතික්ෂේප කරන ලදී. මුදල් මණ්ඩලය සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ වගඋත්තරකරුවන් විය. අදාළ සමාගම් දෙක මුදල් සමාගම් පනතේ ඇති

නිර්වචනය ප්‍රකාර මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන්නේ ද යන්න සොයා බැලීමට එම සමාගම් දෙකෙන් තොරතුරු ලබා ගැනීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හට ලැබී ඇති බලය අභියාචනාධිකරණය විසින් අවධාරණය කරන ලදී.

අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන පුද්ගලයන් පිළිබඳ ලැබුණ විමසීම්/පැමිණිලිවල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. මෙය එබඳු පුද්ගලයන් පිළිබඳව මහ බැංකුව විසින් ගත් අඛණ්ඩ පියවර සහ වඩාත් තියුණු ලෙස පවත්වාගෙන ගිය මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් විය හැකිය.

20.5 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම පිළිබඳව, මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් නොකඩවා පවත්වාගෙන යන ලදී. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට පහත සඳහන් ද ඇතුළත් විය.

(අ) පුවත්පත්වල පළකිරීම්

(i) ලියාපදිංචි මුදල් සමාගම්වල නාම ලේඛනයක් 2005 ජනවාරි මාසයේදී පළකිරීම.

(ii) තැන්පතු යන්න සඳහා නිර්වචනයක්, විවිධ නීති යටතේ තැන්පතු භාරගැනීමට අවසර දී ඇති ආයතන/සංවිධාන වර්ගයන් සහ මහ බැංකුව තැන්පතු භාරගැනීමට අවසර දී ඇති ආයතනයන්ගේ නාම ලේඛනයක් සහ පැහැදිලි කිරීමේ සටහනක් ඇතුළත් නිවේදනයක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2005 මාර්තු පළකරන ලදී. (2005 ජූලි මස සිට මෙම නිවේදනය මාසිකව පළකරන ලදී)

(iii) 2005 මාර්තු මාසයේ දී, මුදල් සමාගම් පනතේ 11(1) වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් හේතුන් රාශියක් මත එරෙහිවූ සමාගම් දෙකක් විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අයදුම්පත නිශ්ප්‍රභ කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් පුවත්පත් නිවේදනයක් පළකිරීම.

(iv) මුදල් සමාගම් පනතේ 11 (2) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් නිශ්චයන් කරන ලද සමාගම් 4 ක නම් සහ ලිපිනයන් 2005 මැයි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාස වලදී පළකිරීම.

(v) 2005 නොවැම්බර් මාසය දක්වා, මුදල් සමාගම් පනතේ 11(2) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් නිශ්චයන් කරන ලද ආයතන 10 ක නම් සහ ලිපිනයන් ඇතුළත් කරමින් නිවේදනයක් 2005 නොවැම්බර් මාසයේදී පළකිරීම.

(vi) "ඔබ මහත්සියෙන් ඉතිරි කළ මුදල් ආයෝජනය කිරීමේදී ප්‍රවේසම් වන්න" යන මාතෘකාව යටතේ අවසර නොලත් තැන්පතු භාර ගන්නා ආයතන සමග ආයෝජනය කිරීමෙන් ඇති අවදනම් පැහැදිලි කිරීමක්, මුදල් සමාගම් පනතේ 11(2) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් නිශ්චයන් කරන ලද ආයතනවල ලේඛනයක්, තැන්පතු භාරගැනීමට අවසර ඇති ආයතන/සංවිධාන වර්ගයන් සහ ලියාපදිංචි මුදල් සමාගම්වල ලේඛනයක් ඇතුළත් දැන්වීමක් 2005 නොවැම්බර් මසදී පළකිරීම.

(ආ) අවසර නොලත් ආයතන සමග තැන්පතු කිරීමෙන් ඇතිවෙන අවදනම විස්තර කරමින් සහ තැන්පතු භාර ගැනීමට අවසර දී ඇති ආයතනයන්ගේ ලැයිස්තුවක් ඇතුළත් කරමින් සකස් කළ දැන්වීමක් ග්‍රාම නිලධාරීන් වෙත යවා එය ප්‍රදර්ශනය කරන ලෙස ඉල්ලා සිටීම.

21. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මූල්‍ය අංශයේ සේවයේ නියුතු පුද්ගලයින්ගේ දැනුම ඉහළ මට්ටමින් වර්ධනය කිරීමේ අරමුණෙන් නිරතුරුව කටයුතු කරන දිවයිනේ බැංකු හා මූල්‍ය අංශයේ ප්‍රමුඛතම පුහුණු කිරීමේ ආයතන වලින් එකක් වේ. ගුණාත්මක බවින් ඉහළ මට්ටමේ පුහුණුවීම් ලබාදෙන බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මහ බැංකුව, බැංකු අංශය සහ ග්‍රාමීය අංශයේ සංවර්ධන කටයුතු හා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිවල නියුතු නිලධාරීන් ඇතුලු වෙනත් මූල්‍ය ආයතන වල නිලධාරීන් වෙනුවෙන් පාඨමාලා පවත්වනු ලැබේ. වේගයෙන් සංවර්ධනය වන මෙම අංශයේ පැන නගින අභියෝගවලට මුහුණ දීම සඳහා ඔවුන්ට අවශ්‍ය නිපුණතා වලින් පරිපූර්ණ කිරීම මගින් සිය අරමුණු ඉටුකර ගැනීමට බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය ක්‍රියා කරයි. මූල්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා පිළිබඳ වාර්ෂික සමීක්ෂණය අනුව සකස් කරන ලද සම්මන්ත්‍රණ, වැඩ මුළු හා කෙටිකාලීන පාඨමාලා මහ බැංකුවේ හා බාහිර ආයතනවල පුළුල් අත්දැකීම් හා සුදුසුකම් ලැබූ සම්පත් දායක මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබයි. කේන්ද්‍රය නවීන පුහුණු කිරීමේ පහසුකම් වලින් සමන්විත වන අතර, අනාගතයේදී දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සමුළුවට අයත් රටවල පුහුණු අවශ්‍යතා සැපයීමට ද දිගුකාලීන වශයෙන් ස්වයං මූල්‍යකරණ ආයතනයක් ලෙස දියුණු කිරීමටද බලාපොරොත්තු වේ.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් 2004 වසරේදී පවත්වනු ලැබූ පාඨමාලා 69 හා සසඳන කල 2005 දී කෙටි කාලීන පාඨමාලා 73ක් පවත්වන ලදී. මෙම වැඩ සටහන් මගින් බැංකු කටයුතු, මූල්‍ය, තොරතුරු තාක්ෂණය, භාෂාව හා සංනිවේදන නිපුණතා, කළමනාකරණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති ඇතුළු ග්‍රාමීය අංශය සංවර්ධනය

සංඛ්‍යා සටහන 11 - 15

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලැබූ පාඨමාලා-2005

වර්ගීකරණය	පාඨමාලා ගණන	ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු ලාභීන්	අනිකුත් පුහුණු ලාභීන්	පුහුණු ලාභීන්ගේ මුළු ගණන	සම්පූර්ණ පුහුණු පැය ගණන
1. බැංකු කටයුතු	08	55	196	251	102
2. මූල්‍ය	10	45	276	321	108
3. තොරතුරු තාක්ෂණය	23	329	25	354	846
4. භාෂා සහ සන්නිවේදන නිපුණතා	05	98	08	106	186
5. කළමනාකරණ	03	32	30	62	24
6. ග්‍රාමීය අංශයේ සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍ය	04	-	112	112	48
7. විශේෂ පාඨමාලා	20	367	182	549	624
එකතුව	73	926	829	1755	1938

මූලය: බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය
ශ්‍රී ලංකා මහ බැංකුව

යන ක්ෂේත්‍රයන් ආවරණය විය. තොරතුරු තාක්ෂණය සහ භාෂා හා සංනිවේදන නිපුණතා පාඨමාලාවන් මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා විය. වසර තුළදී විශේෂ පාඨමාලා 20 ක් පැවැත්වූ අතර, ඒවායින් පාඨමාලා 3 ක් සීමාසහිත ජාතික සංවර්ධන බැංකුවේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ නිලධාරීන් වෙනුවෙන්ම වෙන්වුණි. පාඨමාලා සඳහා සහභාගිවූවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 2004 වසරේ වූ 1507 ට වඩා සියයට 16 ක වර්ධනයක් පෙන්වමින් 2005 දී 1,755 ක් විය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විශිෂ්ඨ ගණයේ දේශීය හා විදේශීය දේශකයින්ගේ සහභාගීත්වයෙන් වර්ෂය තුළ ප්‍රසිද්ධ හා සැමරුම් දේශණ 11 ක් පැවැත් වූ අතර, ඒවා වෘතිකයින්, මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් හා මහජනයාට වැදගත්, වර්තන මාතෘකා පිළිබඳ සිය අදහස් ප්‍රකාශ කිරීමට සකස් වූ සාකච්ඡා මණ්ඩප වූහ. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය අ.පො.ස. උසස් පෙළ සිසුන් හා ගුරුවරුන් වෙනුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය හා බැංකු ක්‍රමය පිළිබඳ පවත්වනු ලබන සම්මන්ත්‍රණ මාලාව 2005 වසරේදී ද නොකඩවා පැවැත්විණ. මේ සඳහා පාසැල් 11 ක සිසුන් සහභාගි වූ අතර, ඉන් පාසැල් 02 ක් මඩකලපුවෙන් විය.

22. පුහුණු වැඩකටයුතු

දැනුම වර්ධනය කර ගැනීම සඳහා ඉගෙනුමෙහි ඇති වැදගත්කම අවධාරණය කරමින් 2004 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද නව පුහුණු හා ඉගෙනුම් ප්‍රතිපත්තිය 2005 වර්ෂයේදී ද තවදුරටත් නොකඩවා පවත්වාගෙන යනු ලැබිණ. මෙම නව දක්ම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දැනුම පදනම් කරගත් නිලධාරීන් පිරිසක් ඇති කිරීම සඳහා කළමනාකාරිත්ව සහ කාර්ය මණ්ඩලය යන දෙපිරිසම ඒකාබද්ධව වගකීමක් දැරිය යුතු වේ. කළමනාකාරිත්වය විසින් තම කාර්ය මණ්ඩලයට ඉගෙනුම සඳහාත්, පුහුණුව ලබා ගැනීම සඳහාත්, තම දැනුම අනෙකුත් අය සමග බෙදාහදා ගැනීම සඳහාත්, අවස්ථාව උදාකර දෙනු ලබන අතර කාර්ය මණ්ඩලය විසින් මෙම අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමින් තම දැනුම හා නිපුණතා වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම නව පුහුණු හා ඉගෙනුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මහ බැංකුව සිය කාර්ය මණ්ඩලයට ශිල්පීය, වෘත්තියමය හා කළමනාකාරිත්ව නිපුණතා වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව ලබාදුනි.

විමර්ශනයට භාජනය වූ වසර තුළ නිලධාරීන් 191 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යයන් පිළිබඳව කෙටි කාලීන විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගි වූ අතර 1,253 දෙනෙකු බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය සහ පිළිගත් දේශීය පුහුණු ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් වලට සහභාගි විය. සිය සේවකයන්ගේ හැකියාවන් සහ නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාවන් සැලසීමට අමතරව ඔවුන් එළදායී කළමනාකරුවන් බවට පත්කිරීම පිණිස අවශ්‍ය වන කළමනාකාරිත්ව නිපුණතා සහ පුද්ගල නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ ඇති වැදගත්කම මහ බැංකුව විසින් හඳුනාගෙන ඇත. එමනිසා නායකත්ව ගුණාංග, කණ්ඩායම් හැඟීම, තීරණ ගැනීමේ හැකියාව, නව දැක්මකින් සිතීම සහ තම කාර්යයන් හා වගකීම් පිළිබඳව පුළුල් දැකීමක් ඇතිකර ගැනීම යන අංග වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය නිලධාරීන් 687 දෙනෙකුට ශ්‍රී ලංකා ව්‍යාපාරික

සංඛ්‍යා සටහන 11-16

සැමරුම් සහ ප්‍රසිද්ධ දේශණ

දිනය		මාතෘකාව	දේශකයින්
1	2005.01.13	ශ්‍රී ලංකාවේ නිදහස් ආර්ථිකය හා කර්මාන්ත ප්‍රතිව්‍යුහගතකරණය	මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරල ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව ඕස්ට්‍රේලියා ජාතික විශ්ව විද්‍යාලය කැන්බරා
2	2005.03.02	සුනාමි ව්‍යසනයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට වූ බලපෑම හා ජාතිය ගොඩනැගීමේ අභියෝග (නිදහස් සමරු දේශණය)	ආචාර්ය පී.බී.ජයසුන්දර මහා භාණ්ඩාගාරයේ ලේකම් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
3	2005.03.31	බැංකු පරිපාලන නීතියට මෑතකදී කරන ලද වෙනස්කම් හා එමගින් බැංකු ක්‍රමයට වන බලපෑම	ඒ.එච්.එම්.ඩී.නවාස් මයා ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ නීතිපති දෙපාර්තමේන්තුව
4	2005.04.28	ආපද කළමනාකරණයේදී සූදනම හා අන්තර් සංවිධාන සහයෝගිතාව	මහාචාර්ය ඩී.එස්.විතාන වින්ඩ්සර් විශ්ව විද්‍යාලය ඔන්ටාරියෝ කැනඩාව
5	2005.05.05	2004 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන ආකාරයට ශ්‍රී ලංකා ආර්ථිකයේ තත්ත්වය (ජනරජ සමරු දේශනය)	ආචාර්ය එච්.එන්.තේනුවර අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව
6	2005.06.02	පිරමිඩ වෙළෙඳම් ක්‍රමයට එරෙහිව පියවර ගැනීම	රොබට් පිට්ස් පැට්‍රික් මයා සභාපති පිරමිඩ ස්කීම් ඇලර්ට් ඇමෙරිකා එක්සත් ජනපදය
7	2005.07.14	ආර්ථික වර්ධනය පිළිබඳ සමකාලීන මතවාද	මහාචාර්ය බිබෙක් ඩිබ්රෝයි අධ්‍යක්ෂ රජීව් ගාන්ධි ආයතනය නව දිල්ලිය
8	2005.08.25	වර්ධනය හා වෙනස්වීම් : ශ්‍රී ලංකා ආර්ථිකය 1950-2005 (ශ්‍රී ලංකා මහ බැංකුවේ 55 වන සැමරුම් දේශණය)	ආචාර්ය නිමල් සඳරත්න සභාපති දිළිඳු කටයුතු විශ්ලේෂණ කේන්ද්‍රය
9	2005.09.14	පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණ (CFS) වාර්තාව - 2003/2004	ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක අධ්‍යක්ෂ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ඇගයීම: විශාඛා හිඳුල්ලගේ මිය දේශීය /ප්‍රාදේශීය අධ්‍යක්ෂ අන්තර් තාක්ෂණ සංවර්ධන කණ්ඩායම (ITDG) දකුණු ආසියාව
10.	2005.12.02	පරිවර්තන ග්‍රන්ථයක් වන එද වැව් බැදි රාජ්ජේ හෙවත් උතුරු මැද පළාතේ අත්පොත සහ එල්ලංගාව් නැමැති පර්යේෂණ ග්‍රන්ථය එළිදක්වීම	ආචාර්ය එම්.යූ.ඒ.තෙන්නකෝන් හිටපු විධායක අධ්‍යක්ෂ ශ්‍රී ලංකා මහ බැංකුව
11.	2005.12.22	ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් එහා : ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර විස්තීරණ ආර්ථික හවුල් ගිවිසුම (බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ 24 වන සැමරුම් දේශණය)	ආචාර්ය එච්.එන්.තේනුවර අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව සාකච්ඡා මඩුල්ල ආචාර්ය සමන් කැලේගම විධායක අධ්‍යක්ෂ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එච්.එම්.විජේරත්න මයා වාණිජ අධ්‍යක්ෂ වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව

මූලය: බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය
ශ්‍රී ලංකා මහ බැංකුව

සංවර්ධන මධ්‍යස්ථානය (Sri Lanka Business Development Centre) මගින් පවත්වන ලද "බැහැරගත ක්‍රියාශීලී වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන "(Outward Bound Professional Development Training Programme) සඳහා සහභාගි වීමට අවස්ථාව සලසා දෙන ලදී. මෙයට අමතරව, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට Franklyn Covey (South Asia)Pvt Ltd; මගින් පවත්වන ලද කළමනාකාරිත්ව සංවර්ධන වැඩසටහන් කීපයකටම සහභාගි වීමට අවස්ථාව සලසා දෙනු ලැබිණ. දෙපාර්තමේන්තු කීපයක ඉල්ලීම මත ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය (SIDA) මගින් සපයන ලද ආධාර ප්‍රයෝජනයට ගනිමින් ආයෝජන විශ්ලේෂණ සහ ජාත්‍යන්තර වෙළෙඳම පිළිබඳව වෘත්තීය වැඩසටහන් දෙකක් පවත්වන ලදී. මෙම වර්ෂයේ දී කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන යටතේ නිලධාරීන් 8 දෙනෙකු ස්වීඩනයේ රික්ස් බැංකුවෙහි පුහුණුව ලැබූ අතර සාර්ක් කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන යටතේ නිලධාරීන් 10 දෙනෙකු පාකිස්ථානයේ පුහුණුව ලැබීය.

ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව හා කැනඩාව යන රටවල පිළිගත් විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිලධාරීන්ට අවස්ථාව සලසාදීමේ ප්‍රතිපත්තිය 2005 වර්ෂයේ දී ද තවදුරටත් නොකඩවා සිදුකෙරිණ. විමර්ශනයට භාජනය වූ වර්ෂයේ දී නිලධාරීන් 10 දෙනෙකු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ අතර පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කළ නිලධාරීන් 4 දෙනෙකු නැවතත් සේවයට වාර්තා කරන ලදී.

පුහුණු වැඩසටහන් වලට සහභාගි වූ නිලධාරීන්ට සහ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු යටතේ පර්යේෂණ කටයුතුවල නියැලුණු නිලධාරීන්ට තමන් ලබාගත් දැනුම සහ අත්දැකීම් අනෙකුත් නිලධාරීන් සමග බෙදාහදා ගැනීමට අවස්ථාවක් සලසාදීම සඳහා පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් සතිපතා පවත්වනු ලබන සම්මන්ත්‍රණ මාලාව තවදුරටත් පවත්වා ගෙන යන ලදී. මෙම සම්මන්ත්‍රණ මාලාව යටතේ අදාළ වර්ෂය තුළ සම්මන්ත්‍රණ 47 ක් පවත්වන ලදී.

23. සුභසාධන

2005 වසර අවසානයට මුළු සංඛ්‍යාව 9,332 ක් වූ මහ බැංකු සේවා නියුක්තිකයන්, විශ්‍රාමිකයින් වැන්දඹු පුද්ගලයින් සහ යැපෙන්නන් සඳහා සුභසාධන සේවා සපයනු ලබන සුභසාධන දෙපාර්තමේන්තුව විසින් එම පහසුකම් සැපයීම සලකා බලන මෙම වසර තුළදී ද අඛණ්ඩව ව්‍යාප්ත කරන ලදී. සේවා නියුක්තිකයන්ට විවිධ කාණ්ඩ යටතේ සහනදායී පොළී අනුපාතයන් මත ණය පහසුකම් සැපයීම, සේවා නියුක්තිකයන්, විශ්‍රාමිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය ප්‍රතිලාභ පහසුකම් සැපයීම, වෛද්‍ය සායන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම, ආපනශාලා පහසුකම් සැපයීම සහ ඊට සමගාමී වෙනත් සුභසාධන ස්වභාවයේ සේවාවන් සැපයීම මෙම කටයුතුවලට ඇතුළත් වේ.

බැංකුව විසින් සපයන ලද මූල්‍ය ණය පහසුකම් මත දැනටමත් ඉදිකොට ඇති පළමු නිවස විකිණීමට අදහස් කරන සේවා නියුක්තිකයන් සඳහා සියයට 7.5 ක වාර්ෂික පොළියකට යටත්ව උපරිමය රුපියල් දශ ලක්ෂ 3 ක් දක්වා දෙවැනි නිවාස ණයක් ලබා ගැනීමට හැකි අයුරින් 2005 මැයි මාසයේ දී නිවාස ණය යෝජනා ක්‍රමය පුළුල් කරන ලදී. මෙම ණය මුදල යම් සේවකයෙකුට මුල් ණය මුදලින් ඉදි කළ පළමු නිවස සෞඛ්‍යයට නුසුදුසු හෝ ජීවත්වීමට අපහසු ස්ථානයක් වේ නම් ඔහුට/ඇයට සියයට 2.5 ක වාර්ෂික පොළියක් මත මුදා හරිනු ලබන දෙවන නිවාස ණය මුදලට පරිබාහිර වූ දෙවැනි ණයක් වේ.

කෘත්‍රිම කර්ණ සංඛය සවි කිරීමේ හෝ උකුල් ඇටය බද්ධ කිරීමේ ශල්‍යකර්ම සඳහා වියදම මුළු ජීවිත කාලයටම රුපියල් 350,000 ක උපරිමයක් දක්වා ප්‍රතිපූරණය කිරීම සඳහා 2005 ජුනි මාසයේ දී වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය පුළුල් කරන ලදී.

23.1 අනෙකුත් කටයුතු

බැංකුවෙහි පැවැත්වෙන නිල උත්සව සඳහා ආහාරපාන සැපයීමට සහ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් පවත්වා ගෙන යාමට හැකිවන අයුරින් ආහාරපාන සැපයීමේ සේවාව තවදුරටත් ශක්තිමත් කරන ලදී. වාර්තා කිරීමේ ක්‍රමය වැඩිදියුණු කිරීම් වස් ආපනශාලා කටයුතු පරිගණකගත කිරීම ද මෙම වසරේ දී සම්පූර්ණ කරන ලදී.

24. මානව සම්පත් සංවර්ධනය

මහ බැංකුව තුළ දැනට ක්‍රියාත්මක වන නවීකරණ වැඩ සටහන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව, එහි මෙහෙයුම් කටයුතු හා උපාය මාර්ගික කාර්යයන් 2005 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අතර, එයට සමගාමීව මානව සම්පත් කළමනාකරණ කාර්යයන් වන බඳවා ගැනීම්, අනුයුක්ත කිරීම්, උසස් කිරීම්, අනුප්‍රාප්තික සැලසුම් කිරීම හා කාර්ය සාධන කළමනාකරණය යන කාර්යයන් මහ බැංකුවේ මානව සම්පත් කළමනාකරණ අවශ්‍යතාවයන් ලෙස හඳුනාගෙන කටයුතු කරන ලදී.

24.1 ස්වේච්ඡාවෙන් කලින් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය

මහ බැංකු සේවකයින් ගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන්, 2005 අගෝස්තු මාසයේදී ස්වේච්ඡාවෙන් කලින් විශ්‍රාම යාමේ ක්‍රමය මාණ්ඩලික නොවන පංතියේ හා සුළු සේවක පන්තියේ සියළුම සේවකයින් සඳහා හඳුන්වා දෙන ලදී. මේ යටතේ සේවකයින් 106 දෙනකු 2005 දෙසැම්බර් මස 01 වන දින සිට විශ්‍රාම ගන්නා ලදී.

24.2 බඳවා ගැනීම්

බැංකුවේ බඳවා ගැනීම්, හඳුනාගත් පුරප්පාඩු හා විවිධ දෙපාර්තමේන්තුවල හඳුනාගත් නිපුණතාවයන්ගේ පැවැති

පරතරයන් පියවීම අරමුණු කරගෙන සිදු කරන ලදී. ඉතාමත් සංකීර්ණ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් තුළින් මාණ්ඩලික පංතියට නිලධාරීන් 57 දෙනකු බඳවා ගන්නා ලදී. එය විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද තරග විභාගයකින් හා මහ බැංකුව විසින් පවත්වන ලද ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමන්විත විය. මෙයට අතිරේකව සිවිල් ඉංජිනේරුවරයකු, උසාවි ලිපිකරුවකු හා තොරතුරු තාක්ෂණික ශිල්පීන් සිව් දෙනකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

24.3 උසස් කිරීම්

2005 වර්ෂය තුළදී මහ බැංකුවේ සේවකයින්ගේ වෘත්තීය ප්‍රවර්ධනයන්ට අදාළ, ශ්‍රේණි උසස් කිරීම් හා තනතුරු උසස් කිරීම් සිදු කරන ලදී. මාණ්ඩලික පංතියේ හා මාණ්ඩලික නොවන පංතියේ සේවකයින් 148 දෙනකුට ඔවුන්ගේ කාර්ය සාධනය හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ කිරීම් මත උසස්වීම් ලබාදෙන ලදී. මාණ්ඩලික නොවන පංතියේ නිලධාරීන් 23 දෙනකු මාණ්ඩලික පංතියේ පළමු ශ්‍රේණියට හා මාණ්ඩලික නොවන පංතියේ පෞද්ගලික සහකාර වශයෙන් සේවය කළ 15 දෙනකු මාණ්ඩලික පංතියේ පළමු ශ්‍රේණියේ පෞද්ගලික ලේකම් තනතුරු සඳහාද උසස් කරන ලදී. මේ අතරතුර පවතින උසස් කිරීම් පරිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණ මගින් දෙපාර්තමේන්තු ප්‍රධානි තනතුරු දෙකක සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරු දෙකක පැවති පුරප්පාඩු පුරවන ලදී.

24.4 සේව්‍ය-සේවක සම්බන්ධතා

වර්ෂය තුළදී කළමණාකාරිත්වය හා වෘත්තීය සමිති අතර නිරතුරුව සාකච්ඡා පැවැත්විණි. වෘත්තීය සමිති නිලධාරීන්ට ඔවුන්ගේ දැනුම, අත්දැකීම් හා කුසලතා වර්ධනය කිරීම පිණිස පාකිස්ථාන මහ බැංකුවට හා මැලේසියා මහ බැංකුවට අධ්‍යයන චාරිකා දෙකක් සංවිධානය කරන ලදී. එම රටවල් දෙකෙහි මහ බැංකුවල කාර්යයන්, ඒවායේ නව ප්‍රවනතා පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම එහි අරමුණ විය. 2003 වැටුප් සංශෝධනයෙන් පසුව ඇති වූ වැටුප් විෂමතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම විෂමතාවයන් සලකා බැලීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර, කමිටුවේ නිර්දේශයන් මත වැටුප් විෂමතාවන්හි සංශෝධන වර්ෂයේ පළමු කාර්තුව තුළදී ක්‍රියාත්මක කරන ලදී. තවද, 2006 වසරේ සිට ක්‍රියාත්මක කළ යුතු සාමූහික ගිවිසුම පිළිබඳව ද සාකච්ඡා ආරම්භ කරන ලදී.

24.5 කාර්ය සාධන කළමනාකරණ ක්‍රමය

නව කාර්ය සාධන කළමනාකරණ ක්‍රමයට අනුව සියළුම බැංකු සේවකයින්ගේ 2004 වර්ෂයේ කාර්ය සාධන ඇගයීම් වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. සාමූහික ගිවිසුමේ වූ එකඟතාව පරිදි සේවකයින් අභිප්‍රේරණය කිරීම අරමුණු කරගෙන කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. දෙපාර්තමේන්තුවල හා සේවකයින්ගේ අරමුණු සකස් කිරීම ද 2005 වර්ෂයේ මුල් කාලය තුළදී අවසන් කරන ලදී.

24.6 මිනිස්බල සැලසුම්කරණය

2005 වර්ෂය තුළදී ස්වේච්ඡාවෙන් කලින් විශ්‍රාම යාමේ ක්‍රමය හා විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීම යටතේ සේවකයන් 124 දෙනකු විශ්‍රාම ගිය අතර සේවකයන් 7 දෙනකු මහ බැංකු සේවාවෙන් ඉල්ලා අස්වන ලදී. වර්ෂය අවසානයේදී සේවක සංඛ්‍යාව මාණ්ඩලික නිලධාරීන් 494 දෙනකුගෙන්ද, මාණ්ඩලික නොවන නිලධාරීන් 478 දෙනකුගෙන් හා සුළු සෙවකයින් 105 දෙනකුගෙන් ද සමන්විත විය. මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුප්‍රාප්තික සැලසුම්කරණයේ කොටසක් වශයෙන් නියාමක නිලධාරීන් විශ්‍රාම ගැනීම, සේවයෙන් ඉවත්වීම හෝ මුදාහැරීම සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවදානම් විශ්ලේෂණයක් සිදු කරන ලදී. ඒ අනුව, අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් හා අනුප්‍රාප්තිකයින් පිළිබඳව ඉහළ කළමනාකරණයේ අවධානයට යොමු කරන ලදී.

24.7 ඉලෙක්ට්‍රොනික මානව සම්පත් තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

අවම පොදු කාර්ය පිරිවැයක් යටතේ කඩිනම් හා නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම අරමුණු කරගෙන මානව සම්පත් දෙපාර්තමේන්තුවට අන්තර්ජාලගත ඉලෙක්ට්‍රොනික මානව සම්පත් තොරතුරු පද්ධතියක් හඳුන්වා දෙන ලදී. අදාළ ටෙන්ඩර් පරිපාටිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මානව සම්පත් තොරතුරු පද්ධතිය ලබාගන්නා ලද අතර, බැංකුවේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පද්ධතියේ මූලික ගැලපීම් සිදු කරමින් පවතී. වර්ෂය තුලදී මෙම පද්ධතිය භාවිතා කරනු ලබන දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, දැනට පවතින දත්ත මාරු කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී. මෙහි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම උදෙසා මෙම පද්ධතිය භාවිතා කරනු ලබන දෙපාර්තමේන්තු වලින් තෝරාගත් නියෝජිතයින්ට, එහි භාවිතය පිළිබඳව පුහුණු කිරීම අවශ්‍ය වන අතර, ඒ සඳහා කටයුතු සිදු කරමින් පවතී. දැනට ක්‍රියාත්මක ස්වයංකෘත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා සම්පූර්ණ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය ස්වයංකෘත කරන ලද පද්ධතියක් බැංකුවේ ප්‍රයෝජනය සඳහා පවතිනු ඇත.

24.8 කළමනාකරණ සංවර්ධන කේන්ද්‍රයේ කටයුතු අවසන් කිරීම

2001 වර්ෂයේදී ආරම්භ කිරීමට යෙදුනු කළමනාකරණ සංවර්ධන කේන්ද්‍රයේ කටයුතු පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුවට හා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයට පවරන ලදී. කළමනාකරණ සංවර්ධන කේන්ද්‍රය මහ

බැංකුවේ සේවකයන්ගේ කළමනාකරණ හා අනෙකුත් නිපුණතාවයන් සංවර්ධනය කිරීම මූලික කරගෙන පිහිටුවන ලද අතර, ඒ සඳහා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයේ මූල්‍යමය සහයෝගය ලබාදෙන ලදී. කළමනාකරණ සංවර්ධන කේන්ද්‍රයේ කටයුතු 2005 මාර්තු 28 වන දිනෙන් අවසන් කරන ලදී.

කාර්ය මණ්ඩල පුවත්

24.9 අධිපතිතුමා සහභාගි වන ලද රැස්වීම්

මහ බැංකු අධිපති සුනිල් මෙන්ඩිස් මහතා 2005 වර්ෂයේදී පහත දැක්වෙන රැස්වීම් සඳහා සහභාගි විය.

(i) සියැන්සා මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය, 2005 පෙබරවාරි 25-28 මැනිලා, පිලිපීනය.

(ii) ජී 24, අයි.එම්.එෆ්.සී සහ සංවර්ධන කමිටු රැස්වීම 2005 අප්‍රේල් 11-17, වොෂිංටන් ඩීසී, ඇමරිකා එක්සත් ජනපදය.

(iii) 40 වන සියැසන් මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව සහ 24 වන සියැසන් මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩලයේ සමුළුව, 2005 මැයි 31 - ජූනි 3, නාඩි, ෆීජී.

(iv) ජාත්‍යන්තර ගනුදෙනු පියවීම පිළිබඳ බැංකුවේ වාර්ෂික සමුළුව, 2005 ජූනි 25-27, බාසල්, ස්විට්සර්ලන්තය.

(v) සාක් ෆිනෑන්ස් මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය, 2005 සැප්තැම්බර් 8-10, මුම්බායි, ඉන්දියාව.

(vi) පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ දෙවන වාර්ෂික සමුළුව, 2005 සැප්තැම්බර් 18, බාබඩෝස්.

(vii) ජී 24, අයි.එම්.එෆ්.සී සහ සංවර්ධන කමිටු රැස්වීම සහ ජා.මු.අ./ලෝක බැංකුව වාර්ෂික සමුළුව සහ සංචිත කළමණාකරනය පිළිබඳ මහ බැංකු අධිපතිවරුන්ගේ සංසදය, 2005 සැප්තැම්බර් 20-25, වොෂිංටන් ඩී.සී, ඇමරිකා එක්සත් ජනපදය.

24.10 පත්කිරීම්

(i) කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජේ.ඒ.එන්. දිසානායක මහත්මිය 2005 ජනවාරි 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් හා ඉන් අනතුරුව 2005 ජූලි 16 වැනි දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක ලේකම් වශයෙන් පත්කරන ලදී.

(ii) පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වයි.ඒ.ද සිල්වා මහතා 2005 පෙබරවාරි 10 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

(iii) පහත සඳහන් පත්කිරීම් 2005 පෙබරවාරි 14 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.එම්. අත්තනායක මහතා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වශයෙන්,

ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්.එම්. කරුණාරත්න මහතා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්,

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ එම්.වී.එම්. ප්‍රනාන්දු මහතා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් හා ඉන් අනතුරුව 2005 අගෝස්තු 01 වැනි දින සිට සුභසාධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

(iv) 2005 අප්‍රේල් 01 වැනි දින සිට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත මුදාහරිනු ලැබූ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ එම්.එම්. අත්තනායක මහතා වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.එච්. ගුණවර්ධන මෙනවිය බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

(v) මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එස්.එච්.ඒ.එම්. අබේරත්න මහතා 2005 මැයි මස 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් හා ඉන් අනතුරුව 2005 නොවැම්බර් 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

(vi) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ඊ.ඒ. හෙට්ටිආරච්චි මහතා 2005 මැයි 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත්කරන ලදී. (2005 ජූලි 04 වැනි දින සිට විදේශ නිවාඩු ලබාගෙන ඇත)

(vii) කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.අයි. සුහියාන් මහතා 2005 ජූලි 16 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

(viii) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී කේ.එම්.ඒ.එන්. දවුලාගල මහත්මිය 2005 ජූලි 16 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත්කරන ලදී.

(ix) සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ඩී. වසන්ත මහතා 2005 සැප්තැම්බර් 01 වැනි දින සිට විනිමය පාලන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන් පත්කරන ලදී.

(x) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අතිරේක විනිමය පාලක එච්.එම්.පී. හේරත් මහතා 2005 සැප්තැම්බර් 01 වැනි දින සිට පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

24.11 විශ්‍රාම ගැනීම්

(i) පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ජී.එල්.අමරසේන මහතාගේ සේවා කොන්ත්‍රාත්තුව 2005 පෙබරවාරි 09 වැනි දිනෙන් අවසන් විය.

(ii) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ කේ. ජෙගනාදන් මහතා 2005 පෙබරවාරි 14 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

(iii) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ඩී.එල්. කටුවාවල මහතාගේ සේවා කොන්ත්‍රාත්තුව 2005 අප්‍රේල් 30 වැනි දිනෙන් අවසන් විය.

(iv) මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.ඒ.නන්දසිරි මහතා 2005 මැයි 01 වැනි දින සිට සේවා කොන්ත්‍රාත්තුවෙන් ඉල්ලා අස්විය.

(v) 2004 දෙසැම්බර් 26 වැනි දින ඇති වූ සුනාමි තත්ත්වය යටතේ අතුරුදහන් වූවා යැයි සැලකෙන බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අතිරේක අධ්‍යක්ෂ සී.කේ. පරණවිතාන මහතා 2005 අගෝස්තු 03 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගියා සේ සලකන ලදී.

(vi) නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්. කදුරුගමුව මහත්මිය 2005 දෙසැම්බර් 04 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

24.12 මුදාහරිනු ලැබ සිටි නිලධාරීන්

(i) සහකාර අධිපති ආර්.ඒ.ජයතිස්ස මහතා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක ලෙස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

(ii) සහකාර අධිපති ආචාර්ය යූ.විදානපතිරණ ලේකම් වශයෙන්, ආපද කළමනාකරණ අමාත්‍යාංශය වෙත.

(iii) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ එම්.එම්. අත්තනායක මහතා ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත.

(iv) ආචාර්ය පී.ඩබ්.ආර්.බී.ඒ.යූ. හේරත් විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

(v) ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්.පී.පී. ප්‍රනාන්දු මහතා ආරක්ෂක අමාත්‍යාංශය වෙත.

(vi) මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ එස්.ආර්.ආටිගල මහතා මුදල් අමාත්‍යාංශය වෙත.

(vii) මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ වයි.එම්.ඉන්ද්‍රරත්න මහත්මිය කාර්මික සංවර්ධන අමාත්‍යාංශය වෙත.

(viii) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එම්.මහින්ද සාලිය මහතා මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය හා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත.

(ix) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඒ.කේ.හෙට්ටිආරච්චි මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

(x) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එම්.සී.ජේ.ප්‍රනාන්දු මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

(xi) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඩී.කේ.එම්.ජී.ඩී. ඉඳුනිල් මෙනවිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

(xii) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඊ.ඩබ්.කේ.ජේ.බී. ඇහැලේපොල මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

(xiii) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ කේ.ඒ.යූ.එස්.කේ. තිලකරත්න මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

(xiv) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එස්.ප්‍රභාගර් මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.